# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,044 - 2017 නොවැම්බර් මස 02 වැනි බ්‍රහස්පතින්දා - 2017.11.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 2548 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 2560 |

සැ. යු. -(i) සුරාබදු (සංශෝධන) පනත් කෙටුම්පත 2017 ඔක්තෝබර් මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2017 නොවැම්බර් මස 24 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2017 නොවැම්බර් මස 10 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*)

2017 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවු ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකුලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## අධිකරණ සේවා කොමිෂන් සභාව

### පහත උපලේඛනයේ සඳහන් ප්‍රදේශවල කාති තනතුරු සඳහා බඳවා ගැනීම පිණිස මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අයදුම්පත් කැඳවීම

පහත සුදුසුකම් ඇති පුද්ගලයින් හට මේ සඳහා අයදුම් කළ හැක.

අයදුම්කරු මුස්ලිම් පුරුෂයෙකු විය යුතු අතර, පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධිධාරියෙකු හෝ ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය විසින් පිළිගත් ආයතනයක් විසින් ප්‍රදානය කරන ලද සහතිකයක් දරන මෞලවි කෙනෙකු හෝ අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන අල්-ආලිම් සහතිකයක් දරන්නෙකු හෝ නීතිඥයෙකු හෝ ඊට සමාන වෘත්තීමය සුදුසුකම් දරන්නෙකු හෝ විශ්‍රාමික රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු විය යුතු ය.

දැනට රාජ්‍ය සේවයේ නියුක්තයෙකුට මේ සඳහා අයදුම් කළ නොහැක.

අයදුම්කරු වයස අවුරුදු 40ට වැඩි, මනා ශාරීරික යෝග්‍යතාවයෙන් යුත්, යහපත් චරිතයක් ඇති, මුස්ලිම් විවාහ සහ දික්කසාද පිළිබඳව විශේෂිත වූ ඉස්ලාම් නීතිය ගැන හොඳාකාර දැනීමක් ඇති සහ සමාජය තුළ යහපත් පිළිගැනීමක් ඇති විවාහකයෙක් විය යුතු ය.

තෝරාගනු ලබන අපේක්ෂකයා පත්වීම් ලිපියේ නිශ්චිතව සඳහන් කරනු ලබන කාලසීමාවක් සඳහා පත්කරනු ලැබේ.

කාතිවරයෙකු තමා පත්කරනු ලබන ප්‍රදේශය තුළ ස්ථිරව පදිංචිවී සිටීම නීතිමය වශයෙන් අවශ්‍ය ය.

කාතිවරයාට මසකට රුපියල් 7,500 ක දීමනාවකට අමතරව සහායක සේවාවන්, ලිපිද්‍රව්‍ය හා තැපැල් වියදම් සඳහා මසකට උපරිම රුපියල් 6,250 ක ගෙවීමක් කරනු ලැබේ.

මෙහි පහත දක්වා ඇති ආකෘති පත්‍රය අනුව සැකසූ අයදුම්පත්, ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ "ක්වාසි" යනුවෙන් සඳහන් කර 2017 නොවැම්බර් මස 27 වැනි දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ලැබෙන සේ එවිය යුතු ය. අයදුම්පත් සමග ලිපි ලේඛනාදියෙහි මුල්පිටපත් එවිය යුතු නොවේ.

ආනන්දි කනගරත්නම්,
ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්,
අධිකරණ සේවා කොමිෂන් සභාව.

2017 ඔක්තෝබර් මස 09 වැනි දින,
අධිකරණ සේවා කොමිෂන් සභා ලේකම් කාර්යාලය,
තැ.පෙ. - 573,
කොළඹ - 12.

## උපලේඛනය

1. **බියගම** - ගම්පහ දිස්ත්‍රික්කයේ බියගම, දෙම්පෙ, කැළණිය සහ වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

2. **කාත්තන්කුඩි** - මඩකලපුව දිස්ත්‍රික්කයේ මන්මුනයිපත්තු උතුර සහ දකුණ, එරුවිල් පෝරයිතීවු යන ආදායම් කොට්ඨාසවල කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

3. **මාතලේ** - මාතලේ දිස්ත්‍රික්කයේ මාතලේ අධිකරණ කලාපයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

4. **කොළඹ බටහිර** - කොළඹ අධිකරණ කලාපයේ දෙහිවල, ගල්කිස්ස, රත්මලාන, නුගේගොඩ, පැපිලියාන, මහරගම, පන්නිපිටිය, හෝමාගම, පොල්ගස්ඕවිට, ඉංගිරිය, රාජගිරිය, බත්තරමුල්ල සහ අතුරුගිරිය යන ප්‍රදේශවල කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

5. **උඩුනුවර** - මහනුවර දිස්ත්‍රික්කයේ උඩුනුවර ආදායම් කොට්ඨාසයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

6. **තම්බලගමුව සහ කන්තලේ** - ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තම්බලගමුව සහ කන්තලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කාති තනතුර සඳහා මුස්ලිම් විවාහ හා දික්කසාද පනත (115 පරිච්ඡේදය) යටතේ අධිකරණ සේවා කොමිෂන් සභාව අයදුම්පත් කැඳවයි.

***1965 අංක 1 සහ 1969 අංක 32 දරන මුස්ලිම් විවාහ හා දික්කසාද පනත්වලින් සංශෝධිත මුස්ලිම් විවාහ සහ දික්කසාද පනත (115 වැනි පරිච්ඡේදය යටතේ) ක්වාසිවරයෙකු පත් කිරීමේ ඉල්ලුම් පත්‍රය***

ක්වාසි බල ප්‍රදේශය :

1. මුලකුරු සමග නම :

උ. අබ්දුර් රහ්මාන් එම්. අයි.

2. සම්පූර්ණ නම :

උ. මුහම්මදු ඉස්හාක් අබ්දුර් රහ්මාන්

3. ස්ථිර පදිංචිය :

4. ලිපිනය :

5. උපන් දිනය :

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ව | ව | ව | ව | මා | මා | දි | දි |

6. වයස :

7. ජාතිය :

8. ආගම :

9. ජා. හැ. ප. අංකය :

10. දුරකතන අංකය :

11. අධ්‍යාපන සුදුසුකම් :

1. ..............................................
2. ..............................................
3. ..............................................
4. ..............................................
5. ..............................................

12. වෘත්තීය සුදුසුකම් :

1. ..............................................
2. ..............................................
3. ..............................................
4. ..............................................
5. ..............................................

13. කියවීමට හා ලිවීමට හැකි භාෂාවන් :

14. මුස්ලිම් නීතිය පිළිබඳ දැනීමක් තිබේ ද ? : ඔව් ☐ නැත ☐

15. විවාහක ද ? : ඔව් ☐ නැත ☐

16. භාර්යාව ජීවත්ව සිටී ද? : ඔව් ☐ නැත ☐

17. ඉහත දී කරන ලද සහ දැනට කරන රක්ෂා (දිනත් සමග) :

| සිට | දක්වා | රැකියාව | ස්ථානය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

18. ඉල්ලුම්කරු සතු දේපල වටිනාකම : රු.

19. මාසික ආදායම : රු.

20. කොපමණ ණය ගැතිද, ඇතොත් : රු.

21. පසුගිය අවුරුදු 10 තුළ ඔබ ක්‍රියාකාරීව දේශපාලන කටයුතුවල නිරතව සිටියේ ද ? : ඔව් ☐ නැත ☐

22. ඔබ ආදායම් බදු ගෙවන්නෙක් ද ? : ඔව් ☐ නැත ☐

23. ඔබට එරෙහිව අධිකරණයක අපරාධ නඩු තිබුණේ ද ? තිබේ ද ? : ඔව් [ ] නැත [ ]

24. උසාවිවලින් දඬුවම් ලබා ඇතොත් ඒවායේ විස්තර :

25. පෞද්ගලික තොරතුරු විමසිය හැකි අය (ඒ අය ඔබව හොඳින් දන්නා වග කිවයුතු පුද්ගලයන් විය යුතු ය) :

| | |
|---|---|
| නම : | නම : |
| ලිපිනය : | ලිපිනය : |
| දුරකතන අංක : | දුරකතන අංක : |
| රැකියාව : | රැකියාව : |
| ඔබ දැන සිටි කාලපරිච්ඡේදය : | ඔබ දැන සිටි කාලපරිච්ඡේදය : |

මෙම අයදුම්පතෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බැව් සහතික කරමි.

——————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :——————.

*සටහන* :
සියලුම සහතිකයන්හි පිටපත් ද මෙයට අමුණන්න.

11-247

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරට බඳවා ගැනීම - 2016 (2017)

මෙම දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියට නීති නිලධාරි තනතුරෙහි පවතින පුරප්පාඩුව සඳහා සුදුස්සන් තෝරා ගැනීම සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර බන්ධනාගාර කොමසාරිස් ජනරාල්, බන්ධනාගාර මූලස්ථානය, අංක 150, බේස්ලයින් පාර, කොළඹ 09 වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම්පස උඩ කෙලවරේ "විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීම - 2016(2017)" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය.

- අයදුම්පත් කැඳවීමේ අවසාන දිනය : 2017.12.04 වැනි දින වේ.

***සටහන* :** ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධිත ලිපියක් තැපෑලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සළකා බලනු නොලැබේ. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින් ම විඳ දරාගත යුතු ය.

1. ***සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :**

   ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

2. ***සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :**

   I. මෙම තනතුර ස්ථිරය, ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ.

II. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසර තුන (03)ක පරිවාස කාලයකට යටත් වන අතර, එම වසර තුන (03) ඇතුළත පළමු වැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

III. 2014.01.21 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 ට අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත සේවයට බැඳුනු භාෂාවට අතිරේකව අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ අදාළ ප්‍රවීණතාවය ලබා ගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුනු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද, රජයේ මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු ගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

3. *වැටුප් පරිමාණය* :

මෙම තනතුරට රු. 47,615.00 - 10x1,335 - 8x1,630 - 17x2,170 - රු.110,895 - (SL-1-2016) මාසික වැටුප් පරිමාණයක් හිමි ය. (2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 03/2016 හි විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වැටුප් හිමි වේ.)

4. *අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද* :

I. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීතිය පිළිබඳව උපාධියක් ලබා තිබීම;

හෝ

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම; හා

II. ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු වසර තුන (03)කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් තිබීම.

5. *වයස් සීමාව* :
අවම වයස අවුරුදු 21 ත්, උපරිම වයස අවුරුදු 45 ත් අතර වේ.

6. *කායික සුදුසුකම්* :
I. සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,
II. තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

7. *වෙනත් සුදුසුකම්* :
I. අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
II. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
III. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියළුම සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන අවසන් දින වන 2017.12.04 දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

8. *සම්මුඛ පරීක්ෂණය* :
ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කිරීමේ බලධරයා රාජ්‍ය සේවා කොමිෂන් සභාව වන අතර, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී පහත සඳහන් කරුණු සඳහා ලකුණු හිමි වේ.

| | *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | *අතිරේක අධ්‍යාපන සුදුසුකම්* : | | 20 |
| | පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලද නීතිය පිළිබඳ උපාධිය, | | |
| | * පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 20 | |
| | * දෙවන පන්තියේ ඉහළ සාමාර්ථයක් සඳහා | 15 | |
| | * දෙවන පන්තියේ පහළ සාමාර්ථයක් සඳහා | 10 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථයක් සඳහා | 15 | |
| | නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථයක් සඳහා | 10 | |

| | *විෂයය* | | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| | ***සටහන* :** ගෞරව සාමාර්ථයක් සමග අවසන් විභාගය සමත් වුවහොත් පමණක් ලකුණු 10 ලබාදිය යුතු යි.<br>(උපරිම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබා දේ. - උපාධිය හෝ නීති විද්‍යාල සුදුසුකම්වලින් එකක් සඳහා පමණක්) | | |
| 02 | *අතිරේක වෘත්තීය සුදුසුකම්* :<br>පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ අවුරුද්දකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ පශ්චාත් නීති ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br>(එක් ඩිප්ලෝමාවකට ලකුණු 05 බැගින්)<br><br>පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා<br>(එක් ඩිප්ලෝමාවකට ලකුණු 03 බැගින්)<br><br>පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන අදාළ ක්ෂේත්‍රය පිළිබඳ මාස 03 කට නොඅඩු සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා<br>(එක් පාඨමාලාවකට ලකුණු 02 බැගින්) | | 15 |
| 03 | *අතිරේක පළපුරුද්ද* :<br>නීතිඥවරයෙකු ලෙස රාජ්‍ය සේවයේ හෝ පෞද්ගලික අංශයේ පළපුරුද්ද - මාස 06ට වැඩි හා අවුරුද්දකට අඩු - ලකුණු 02<br>එක් වසරකට ලකුණු 05 බැගින් උපරිමය ලකුණු 30ක්<br>(මූලික සුදුසුකම් ලබාගැනීම සඳහා අවශ්‍ය වන නීතිඥයකු ලෙස කටයුතු කළ වසර 03ක සේවා කාලය හැර)<br><br>(අවුරුදු 20කට නොඅඩු සේවා කාලයක් සම්පූර්ණ කරන ලද නීතිඥවරයෙකුගේ හෝ ජනාධිපති නීතිඥවරයෙකුගේ හෝ විනිසුරුවරයෙකුගෙන් ලබාගත් සහතිකයක් මගින් අතිරේක පළපුරුද්ද සනාථ කළ යුතු ය.) | | 30 |
| 04 | *පරිගණක සාක්ෂරතාව* :<br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගන්නා විශ්වවිද්‍යාලයක උපාධියක් සහ තොරතුරු තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හදරා තිබීම සඳහා<br><br>රජයේ පිළිගත් ආයතනයක අවුරුදු 01 කට නොඅඩු තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා හෝ පැය 1500 සඳහා<br><br>රජයේ පිළිගත් ආයතනයක තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා :<br>මාස06/පැය 720<br>මාස 03/ පැය 360 | 15<br><br><br>10<br><br><br><br>07<br>05 | 15 |
| 05 | *ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව* :<br>ඉංග්‍රීසි මාධ්‍යයෙන් හදරන ලද පශ්චාත් උපාධිය/ උපාධිය/ පශ්චාත් නීතිවේදී උපාධිය/ නීතිවේදී උපාධිය<br>(අදාළ විභාග ප්‍රශ්න පත්‍ර සියල්ල සඳහා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පිළිතුරු සපයා තිබිය යුතු ය.)<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ ඩිප්ලෝමා සඳහා<br>(වසර 01ක් හෝ පැය 1500)<br><br>විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ පිළිගත් ආයතනයක ඉංග්‍රීසි භාෂාව පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවක් සඳහා :<br>මාස 06/පැය 720<br>මාස03/පැය 360 | 15<br><br><br><br>10<br><br><br><br><br>07<br>05 | 15 |
| 06 | *සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව* | | 05 |
| | *මුළු එකතුව* | | 100 |

*සටහන* .— තනතුරට ලබා ඇති පළපුරුද්ද, අධ්‍යාපන සුදුසුකම් සහ බාහිර ක්‍රියාකාරකම් පිළිගත හැකි සහතික මගින් සනාථ කළ යුතු ය. එම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට වලංගු විය යුතු ය.

09. ඉල්ලුම් පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. සුදුසුකම් පරීක්ෂා කිරීමේ දී යම් අපේක්ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකි ය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහකිරීමට පිළිවන.

10. ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආකෘතියට අනුකූල විය යුතු ය. එය කඩදාසියේ දෙපැත්ත පාවිච්චි කරමින් 3.27" x 11.69" (A4) ප්‍රමාණයේ කඩදාසියක සකස්කර අපේක්ෂකයා විසින් සිය අත් අකුරෙන්ම සම්පූර්ණ කළ යුතු ය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද හෝ යතුරු ලියනය කරන ලද හෝ අයදුම්පත් ද භාවිතා කළ හැකි ය. ශිර්ෂ අංක 01 සිට 06 තෙක් පළමුවන පිටුවට ද, 07 සිට 11 තෙක් දෙවන පිටුවට ද, ඉතිරිය තුන්වන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු ය. ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිලිව ඇතුළත් කළ යුතු ය. ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. (ඉල්ලුම් පත්‍රයේ ඡයා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.) තව ද සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත්‍රය නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු ය. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වනු ඇත.

11. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන් බන්ධනාගාර කොමසාරිස් ජනරාල් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12. අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතු ය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

13. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

13.1 දැනට රජයේ සේවයේ යෙදී සිටින්නන්ගේ අත්සන සහතික කළ යුත්තේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලය ලත් නිලධාරියෙකු හෝ විසිනි.

13.2 බාහිර අයදුම්කරුවන්ගේ අත්සන සහතික කිරීම බලය ලත් කෙනෙකු විසින් කළ යුතු ය. එනම්, රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලය ලත් නිලධාරියෙකු, පොලිස් සේවසේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු, වාර්ෂික වැටුප රු.240,360.00 ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුප් වර්ධකය රු. 7,740.00ක් හෝ ඊට වැඩි රජයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු හෝ රජයේ/ පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම් ආයතන ප්‍රධානියා විසින් ද සහතික කළ යුතු ය.

14. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

ඩබ්. එම්. පී. පී. වික්‍රමසිංහ,<br>
ලේකම්,<br>
බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන,<br>
නැවත පදිංචි කිරීම් හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය.

2017 ජූලි මස 31 වැනි දින,<br>
බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම් හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරි තනතුරට බඳවා ගැනීම - 2016 (2017)**

Recruitment to the Post of Legal Officer Grade III of Executive Category in the Department of Prisons - 2016 (2017)

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

01. (අ) මුලකුරු අගට යොදු මුලකුරු සමග නම :______ .
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) උදා : SILVA, A.B.C.
(ආ) සම්පූර්ණ නම :______ .
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ඇ) සම්පූර්ණ නම :______ .
(දෙමළෙන්/ සිංහලෙන්)

02 (අ) ස්ථිර ලිපිනය :______ .
(සිංහලෙන්/දෙමළෙන්) :______ .
(සම්මුඛ පරීක්ෂණ කැඳවීම් ලිපිය මෙම ලිපිනයට එවනු ලැබේ)
(ආ) ස්ථිර ලිපිනය :______ .
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ඇ) දෙපාර්තමේන්තුවක සේවයේ යෙදී සිටී නම් කාර්යාලයීය ලිපිනය :______ .
(සිංහලෙන්) :______ .
(ඈ) දෙපාර්තමේන්තුවක සේවයේ යෙදී සිටී නම් කාර්යාලයීය ලිපිනය :______ .
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :______ .

03. ස්ත්‍රී/ පුරුෂ භාවය :

ස්ත්‍රී - 1, පුරුෂ - 0 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

04. විවාහක/ අවිවාහක බව

අවිවාහක - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
විවාහක - 2

05. ජාතික හැඳුනුම්පත් අංකය :

06. උපන් දිනය :

වර්ෂය : මාසය : දිනය :

07. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස :

අවුරුදු : මාස : දින :

08. පුරවැසිභාවය :______ .
(පරම්පරාවෙන් ද/ ලියාපදිංචි කිරීමෙන් ද යන වග)

09. අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද :
09.1 අධ්‍යාපන සුදුසුකම් : (ලබා ගන්නා ලද සියලුම උපාධි, විශිෂ්ට සාමාර්ථ, වෘත්තීය හා කාර්මික සුදුසුකම්වල විස්තර, පන්තියක් වේ නම් එම විෂයයන් සහ ආයතනය සඳහන් කරන්න.)

| විභාගය/උපාධිය | වර්ෂය | විෂයයන් | ආයතනය |
|---|---|---|---|
| 01. | | | |
| 02. | | | |
| 03 | | | |
| 04. | | | |

09.2 පළපුරුද්ද :————.

10. දැනට දරන තනතුරේ විස්තර :
(අ) තනතුර :————.
(ආ) දෙපාර්තමේන්තුව/ අමාත්‍යාංශය :————.
(ඇ) පත්වීමේ දිනය :————.
(ඈ) ස්ථිර/විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත/තාවකාලික ද වන වග :————.
(ඉ) තනතුර ස්ථිර කර තිබේ ද යන වග :————.
(ඊ) තනතුරේ වැටුප් පරිමාණය හා දැනට ලබන වැටුප :————.

11. යම්කිසි සාපරාධී වරදකට, කෙදිනක හෝ උසාවියක දී වරදකරු වී ඇත්නම් එම වරද හා ලැබූ දඬුවම් පිළිබඳ විස්තර සඳහන් කරන්න. :————.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි සපයා ඇති විස්තර සත්‍ය බව ද, නිවැරදී බව ද, මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් අසත්‍ය බව හෝ වැරදි බව හෝ මා තෝරා ගැනීමට පෙර දැන ගැනීමට ලැබුණහොත් ඒ හේතුවෙන් හා මෙම තනතුරට නුසුදුසු වීමට ද, මෙම තනතුරට මා පත් කරගැනීමෙන් පසුව එම වරද දැන ගන්නට ලැබුණහොත් කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහ කරනු ලැබීමට ද යටත් වන බව දනිමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන

දිනය :————.

12. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .................................................................. මහතා/මෙනවිය/මහත්මිය මා පෞද්ගලිකව දන්නා බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ............................. දින අත්සන තැබූ බව ද, සහතික කරමි.

සහතික කරන නිලධාරියාගේ අත්සන
සහතික කරන නිලධාරියාගේ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
දිනය :————.

13. ඉල්ලුම්කරු රාජ්‍ය සේවයේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :
මෙම අයදුම්පත ඉදිරිපත් කරන .................................... මහතා/මෙනවිය/මහත්මිය මෙම දෙපාර්තමේන්තුවේ/අමාත්‍යාංශයේ/කාර්යාලයේ සේවය කරන බවත්, ඉහත 10 වැනි ඡේදයෙහි ඇති විස්තර නිවැරදි බවත්/ පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු බවත්, ඔහුගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවත්, මම සහතික කරමි. දැනට දරන තනතුරින් මෙම නිලධාරියා/ නිලධාරිනිය මුදවා හැරිය හැකි ය/ නොහැකි ය.

දිනය :————.

————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන හා තනතුර.
(නිල මුද්‍රාව තැබිය යුතු ය)

11-166

## ශ්‍රේෂ්ඨාධිකරණ දෙපාර්තමේන්තුව

### ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III ශ්‍රේණියේ ප්‍රධාන ආරච්චි තනතුර

ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III ශ්‍රේණියේ ප්‍රධාන ආරච්චි තනතුර සඳහා විවෘත පදනම මත සුදුස්සන් තෝරාගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතියට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2017.11.22 දින හෝ ඊට පෙර ලැබෙන සේ ''රෙජිස්ට්‍රාර්, ශ්‍රේෂ්ඨාධිකරණය, කොළඹ 12.'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ. එම ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ **''ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III වන ශ්‍රේණියේ ප්‍රධාන ආරච්චි තනතුර සඳහා බඳවා ගැනීම''** යන්න පැහැදිලිව සඳහන් කළ යුතුය. එදිනට පසු එවනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.

01. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :
ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාව මත සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයන්, පවතින පුරප්පාඩු සඳහා පත් කරනු ඇත.

02. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

ඉදිරියේදී රජය විසින් ගනු ලබන තීරණවලට යටත්ව ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

03. *වැටුප් පරිමාණය* :

අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III,II හා I වන ශ්‍රේණිවලට අදළ මාසික වැටුප් පරිමාණය PL 1-2016 - රු. 24,250 - 10 x 250-10x270-10x300-12x330-රු.36,410 ක් වේ.

04. *සුදුසුකම්* :

4.1 අධ්‍යාපන සුදුසුකම් :-
අ. පො. ස. (සා/පෙළ) විභාගයෙන් දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් ඇතුළුව විෂයයන් 06ක් සමත්ව තිබීම.

4.2 වෘත්තීය සුදුසුකම් :- විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

4.3 පලපුරුද්ද :- විශේෂ සුදුසුකමක් ලෙස සැලකේ.

05. *වයස් සීමාව* :
2017.11.22 දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ අවුරුදු 45ට නොවැඩි විය යුතුයි. (දැනටමත් රාජ්‍ය සේවයේ සිටින ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත පත්වීම්ලාභීන් සඳහා උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)

06. *වෙනත් සුදුසුකම්* :
(අ) ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.
(ආ) යහපත් චරිතයකින් සහ මනා සෞඛ්‍යයකින් යුක්ත විය යුතුයි.
(ඇ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතින් හි v වැනි පරිච්ඡේදය අනුව රජයේ සේවයට පත්කරනු ලැබීමට නුසුදුසු තැනැත්තෙකු නොවිය යුතුය.

සෑම අයදුම්කරුවෙකුම තනතුරට අදළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන දිනයේ හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්ය වේ.

07. *බඳවා ගැනීමේ ක්‍රමය* :
වෘුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්ගේ අනුමැතිය මත අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ සම්මුඛ පරීක්‍ෂණය පවත්වන දිනයේදීම පැවැත්වෙන වෘුහගත සම්මුඛ පරීක්‍ෂණයක දී අයදුම්කරුවන් ලබාගන්නා ලකුණුවල කුසලතා අනු පිළිවෙල තරයේම අනුගමනය කරමින් සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් කාර්යාල සේවක සේවයේ III ශ්‍රේණියට පත් කරනු ලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්‍ෂණයට භාජනය වීමට කැමති භාෂා මාධ්‍යය පැහැදිලිව අයදුම්පතෙහි සඳහන් කළ යුතු අතර, වෘුහගත සම්මුඛ පරීක්ෂණය එම භාෂා මාධ්‍යයෙන් පැවැත්වේ. වෘුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලකුණු ලබාදෙන පරිපාටිය පහත වගුවේ පරිදි වේ.

| | පරීක්ෂා කර ලකුණු ලබාදෙනු ලබන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 10 | අදළ නොවේ. |
| 02 | වෘත්තීය සුදුසුකම් | 20 | |
| 03 | භාෂා දැනුම | 10 | |
| 04 | පරිගණක දැනුම | 15 | |
| 05 | පලපුරුද්ද | 40 | |
| 06 | සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ අභිමතය පරිදි නායකත්වය පෞරුෂත්වය, සන්නිවේදන කුසලතා | 05 | |
| | එකතුව | 100 | |

**සටහන** - තනතුරට ලබා ඇති පළපුරුද්ද, අධ්‍යාපන සුදුසුකම් සහ බාහිර ක්‍රියාකාරකම් පිළිගත හැකි සහතික මගින් සනාථ කළ යුතුය. එම සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට වලංගු විය යුතුයි.

08. *රාජ්‍ය භාෂා ප්‍රවීනතාව :*

| භාෂාව | ලබාගත යුතු ප්‍රවීනතාව |
|---|---|
| 01. රාජ්‍ය භාෂාව | රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු සේවකයින් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීනතාව පරිවාස කාලය තුළ ලබාගත යුතුය. |
| 02. අනෙකුත් රාජ්‍ය භාෂාව | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව අදාළ වන මට්ටමේ භාෂා ප්‍රවීණතාව ලබාගත යුතුය. |

09. ඉල්ලුම්පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. සුදුසුකම් පරීක්‍ෂා කිරීමේදී යම් අපේක්‍ෂකයෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

10. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව අයදුම්පත්‍රය ඉදිරිපත් කළ යුතුය. ඊට අනුකූල නොවන හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය.

11. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ''ශ්‍රේෂ්ඨාධිකරණයේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III ශ්‍රේණියේ ප්‍රධානආරච්චි තනතුර සඳහා බඳවා ගැනීම'' යන්න සඳහන් කරන්න.

12. මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන් ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්‍ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් තිබේ දැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

13. අපේක්‍ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත.

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

14. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා ශ්‍රේෂ්ඨාධිකරණ දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ කොන්දේසි මෙම තනතුර සඳහා අදාල වේ.

15. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත. සියළුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

එම්. එම්. ජයසේකර මහත්මිය,
රෙජිස්ට්‍රාර් - ශ්‍රේෂ්ඨාධිකරණය.

2017 ඔක්තෝබර් මස 26 වැනි දින,
ශ්‍රේෂ්ඨාධිකරණ කාර්යාලයේදී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

**ශ්‍රේෂ්ඨාධිකරණ දෙපාර්තමේන්තුව**

ප්‍රාථමික ශිල්පීය නොවන සේවා ගණයේ III ශ්‍රේණියට බඳවා ගැනීම

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

අයදුම්කරන භාෂා මාධ්‍යය

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4

සේවය කිරීමට මනාපය දක්වන අමාත්‍යාංශය :————.
දෙපාර්තමේන්තුව :————.
අයදුම්කරන තනතුර :————.

1. මුලකුරු සමඟ නම :————.
2. සම්පූර්ණ නම :————.
3. ජාතික හැඳුනුම්පත් අංකය :
4. ස්ථිර ලිපිනය :————.
5. ස්ත්‍රී/පුරුෂභාවය : ස්ත්‍රී - 1 පුරුෂ - 0
6. උපන් දිනය :

වර්ෂය මාසය දිනය

7. දුරකථන අංකය : | | | | | | | | | | |

8. අධ්‍යාපන සුදුසුකම් :

අ. පො. ස. (සා. පෙළ)

i. පළමුවර ප්‍රතිඵල : වර්ෂය :———. මාසය :———.

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3 | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

ii. දෙවන වර ප්‍රතිඵල වර්ෂය :———. මාසය :———.

| විෂය | ශ්‍රේණිය | විෂය | ශ්‍රේණිය |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3 | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

(iii) අ. පො. ස. (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තරය

(i) විභාගයේ වර්ෂය හා මාසය :———.

(ii) විභාග අංකය :———.

(iii) ප්‍රතිඵල :

| විෂය | ශ්‍රේණිය |
|---|---|
| | |
| | |
| | |
| | |
| | |

9. වෙනත් සුදුසුකම් :

.......................................................................

.......................................................................

10. තනතුර අදාළව ලබා ඇති පළපුරුද්ද :

...........................................................

...........................................................

11. ක්‍රීඩා හා බාහිර ක්‍රියාකාරකම් :

...........................................................

...........................................................

12. ඔබ කවරදක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද? (අදළ කොටුවේ ✓ ලකුණ යොදන්න.) (ඔව් නම් විස්තර සඳහන් කරන්න.)

ඔව් ☐ නැත ☐

13. අයදුම්කරුගේ සහතිකය :

(අ) මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදු විය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තවද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) ම විසින් කරන ලද මෙහි ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

11-635

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

### අධ්‍යාපන අමාත්‍යාංශය

### ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පවත්වනු ලබන තුන් අවුරුදු පූර්වසේවා ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීම සඳහා ශික්ෂණලාභීන් ඇතුළත් කර ගැනීම - 2017

1.0 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක තුන් අවුරුදු පූර්වසේවා ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරීම සඳහා බඳවා ගැනීම පිණිස අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් හා යෝග්‍යතාව සහිත අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1.1 මෙය අදාළ වනුයේ **2015 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගය සමත් සිසුන් සඳහා පමණි.** (බුද්ධ ධර්මය, කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය සහ නිර්මාණකරනය හා තාක්ෂණය සඳහා 4.5, 4.8 හා 4.24 ඡේද බලන්න)

1.2 තමන් අයදුම් කරන පාඨමාලාව යටතේ *ගැසට් නිවේදනයේ* සඳහන් සියලු කරුණු හොඳින් කියවා, අවබෝධ කරගෙන ඒ අනුව අයදුම්පත සම්පූර්ණ කර ගැනීමේ වගකීම අයදුම්කරු සතු වේ.

1.3 *ගැසට් නිවේදනයේ* **"අයදුම්පත පිළියෙල කිරීම සඳහා උපදෙස්"** තීරුවේ 7.0 හා 7.1 යටතේ සඳහන් කර ඇති එක් එක් පාඨමාලාව සඳහා බඳවා ගනු ලබන අයදුම්කරුවන් සංඛ්‍යාව පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

1.4 <u>අයදුම්පත් 2017.11.24 දිනට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.</u> (10.5 ඡේදයේ උපදෙස් මේ සඳහා අනුගමනය කරන්න.)

**2.0 යෝග්‍යතාව :**

සෑම අයදුම්කරුවකු ම -

2.1 ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතු ය.

2.2 විශිෂ්ට චරිතයකින් ද, යහපත් මානසික හා ශාරීරික යෝග්‍යතාවෙන් ද යුක්ත විය යුතු ය.

2.3 වයස :

2.3.1 2017.01.01 දිනට වයස අවුරුදු 25ට නොවැඩි විය යුතු ය.

2.3.2 බුද්ධ ධර්මය, කතෝලික ධර්මය, ක්‍රිස්තියානි ධර්මය පාඨමාලාවලට අයදුම් කරන පූජ්‍ය පක්ෂය/පූජක පක්ෂය 2017.01.01 දිනට වයස අවුරුදු 30ට නොවැඩි විය යුතු ය.

2.4 අවිවාහක විය යුතු ය.

**3.0 මූලික අධ්‍යාපන සුදුසුකම් :**

3.1 2015 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී විෂයයන් තුනකින් (03) එකවර සමත් වීම. (සාමාන්‍ය ඉංග්‍රීසි හා පොදු පරීක්ෂණය මීට අදාළ නොවේ)

3.2 සියලුම අයදුම්කරුවන් අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ) හා ගණිතය ඇතුළුව ඕනෑ ම විෂයයන් හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සමත් වී තිබිය යුතු අතර ඉන් අවම වශයෙන් විෂයයන් තුනකින් (03) සම්මාන සාමාර්ථය ලබා තිබිය යුතු ය. කෙසේ වුව ද අවම වශයෙන් පළමුවරට අ. පො .ස. (සා. පෙළ) පෙළ විභාග යේ දී මාධ්‍ය භාෂාව (සිංහල /දෙමළ) ඇතුළුව ඕනෑම විෂයයන් පහකින් (05) සම්මාන සාමාර්ථය තුනක් (03) සහිතව සමත් වීම අනිවාර්ය්‍යය වේ.

*හෝ*

මූලික පිරිවෙන් අවසන් විභාගයේ දී ගණිතය, සිංහල භාෂාව ඇතුළු විෂයය හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සමාන සාමාර්ථය තුනක් (03) සහිතව සමත් වීම.

3.3 එක් එක් පාඨමාලාවට අදාළ වන අ. පො. ස. (සා. පෙළ) විභාගයේ විශේෂ සුදුසුකම් ඉහත 3.2 හි සඳහන් පරිදි දෙවරක දී සම්පූර්ණ නොවේ නම් තුන්වැනි වාරයේ දී සම්පූර්ණ කර තිබිය යුතු ය. (විශේෂ සුදුසුකම් පිළිබඳව සලකා බලනු ලබන්නේ 3.1 හා 3.2හි සඳහන් විශේෂ සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් සඳහා පමණි.)

3.4 මීට අමතරව එක් එක් පාඨමාලාව සඳහා අවශ්‍ය වූ **විශේෂ සුදුසුකම්** ඒ ඒ පාඨමාලා යටතේ දක්වා ඇත.

**සැලකිය යුතු යි -**

මෙහි දී අ. පො. ස. (සා. පෙළ) විභාගයේ 2008 නව නිර්දේශය යටතේ හා ඊට පෙර ක්‍රියාත්මක වූ පැරණි නිර්දේශය යටතේ පහත සඳහන් විෂයයන් සලකා බලනු ලැබේ.
2008 - අ. පො. ස. (සා. පෙළ) නව නිර්දේශය යටතේ සලකා බලනු ලබන විෂය :-

1. *හර (ප්‍රධාන) විෂයයන් :*
   (i) ආගම (ii) සිංහල භාෂාව හා සාහිත්‍යය / දෙමළ භාෂාව හා සාහිත්‍යය (iii) ඉංග්‍රීසි භාෂාව (iv) ගණිතය (v) ඉතිහාසය (vi) විද්‍යාව

2. *කාණ්ඩ විෂයයන් :*
   (vii) පළමුවන විෂය කාණ්ඩයේ විෂය අතුරින් ඕනෑම විෂයයක් (viii) දෙවන විෂය කාණ්ඩයේ විෂය අතුරින් ඕනෑම විෂයයක් (ix) තුන්වන විෂය කාණ්ඩයේ විෂය අතුරින් ඕනෑම විෂයයක්,

   2008 වර්ෂයට පෙර ක්‍රියාත්මක වූ අ. පො. ස. (සා. පෙළ) පැරණි නිර්දේශය යටතේ සලකා බලනු ලබන විෂයः-

   (i) ආගම (ii) සිංහල භාෂාව හා සාහිත්‍යය / දෙමළ භාෂාව හා සාහිත්‍යය (iii) ඉංග්‍රීසි භාෂාව (iv) ගණිතය (v) විද්‍යාව හා තාක්ෂණවේදය (vi) සමාජ අධ්‍යයනය හා ඉතිහාසය (vii) සෞන්දර්ය විෂය අතුරින් ඕනෑ ම විෂයයක් (viii) තාක්ෂණ විෂය අතුරින් ඕනෑ ම විෂයයක්.

මූලික පිරිවෙන් අවසාන විභාගය යටතේ සලකා බලනු ලබන විෂයය :
   (i) සිංහල (ii) පාලි (iii) සංස්කෘත (iv) ඉංග්‍රීසි (v) ගණිතය (vi) ත්‍රිපිටක ධර්මය

3.5 ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන පාඨමාලා සඳහා ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතාව පහත සඳහන් පරිදි සලකා බලනු ලැබේ.

3.5.1 ඉංග්‍රීසි භාෂාව පාඨමාලාව හැර ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන අනෙකුත් පාඨමාලාවලට ඉල්ලුම් කරන අයදුම්කරුවන් අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සාමාර්ථයක්/ ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබිය යුතු වේ.

3.5.2 තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය හා බටහිර සංගීතය යන පාඨමාලා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වුව ද, ඉංග්‍රීසි මාධ්‍යයෙන් මෙන් ම අනිකුත් මාධ්‍යවලින් අ.පො.ස.(උ.පෙළ) හැදෑරූ අයදුම්කරුවන්ට ද මේ සඳහා අයදුම් කළ හැකි ය.

3.5.3 <u>සියලු ඉගැන්වීම් ක්‍රියාකාරකම් හා විභාග ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වෙන හෙයින් ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලාව හැදෑරීමට හැකි අයදුම්කරුවන් පමණක් මේ සඳහා ඉල්ලුම් කිරීම යෝග්‍ය වේ.</u>

3.6 චිත්‍ර / නැටුම් (පෙරදිග) / නැටුම් (භරත) / සංගීතය (පෙරදිග) / සංගීතය (කර්ණාටක) / නාට්‍ය හා රංගකලාව යන පාඨමාලා සඳහා සම්මුඛ පරීක්‍ෂණයට කැඳවන අයදුම්කරුවන් පහත සඳහන් පරිදි ශ්‍රේණිගත කර තෝරා ගනු ලැබේ.

අයදුම්කරුවන් අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී ලබා ඇති Z අගය කුසලතාව අනුව සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවන අතර තෝරා ගැනීම සිදු කරනුයේ Z අගය හා අයදුම්කරුවන් අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී අදාළ සෞන්දර්ය විෂයය සඳහා ලබා ඇති ශ්‍රේණිය ඉහළ සිට පහළට අනුපිළිවෙලට සකස් කර එම ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව ය. ඒ අනුව ඉහළ අගයක් සහිතව ඉහළ ම ශ්‍රේණියක් අදාළ සෞන්දර්ය විෂයයට හිමි කරගත් අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමි වේ.

3.7 <u>සුදුසුකම් තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කරන සියලු ම අධ්‍යාපන/ වෘත්තීය සහතිකවල වලංගු දිනය ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින (2017.11.24) හෝ ඊට පෙර දිනයක් විය යුතු ය.</u>

**4.0 එක් එක් පාඨමාලා සඳහා අවශ්‍ය සුදුසුකම් :**

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පැවැත්වෙන එක් එක් පාඨමාලාවට බඳවා ගැනීම සඳහා අදාළ අධ්‍යාපන සුදුසුකම් හා වෙනත් විශේෂ සුදුසුකම් පහත දැක්වේ.

***සැලකිය යුතුයි.***
**"තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල"** සඳහන් කර ඇති පාඨමාලාවල දී එම අනුපිළිවෙල සලකා බලනුයේ සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ දී නොව සුදුසුකම්ලාභීන් තෝරා ගැනීමේ දී ය.

**4.1 පාඨමාලා අංකය 01 - ප්‍රාථමික අධ්‍යාපනය (සිංහල)**
**ප්‍රාථමික අධ්‍යාපනය (දෙමළ)**

4.1.1 අ.පො.ස. (උ. පෙළ) විභාගයට සිංහල භාෂාව / දෙමළ භාෂාව විෂයය සහිත අයදුම්කරුවන්;

4.1.1.1 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයට කලා විෂයධාරාවෙන් පෙනී සිට සිංහල භාෂාව /දෙමළ භාෂාව විෂයය සහිතව විෂයයන් තුනකින් (03) සමත් වීම;

*හා*

අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ) හා ගණිතය යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථයක් සහිතව ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව විෂයය හයකින් (06) සමත් වීම.

4.1.2 අ.පො.ස. (උ. පෙළ) විභාගයට සිංහල භාෂාව / දෙමළ භාෂාව විෂයය රහිත අයදුම්කරුවන්;

4.1.2.1. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී සිංහල /දෙමළ භාෂාව විෂයය රහිතව කලා විෂයධාරාව හදාරා විෂය තුනකින් (03) සමත් වීම ;

*හෝ*

4.1.2.2. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ. පො. ස. (උ.පෙළ) විභාගයේ දී විද්‍යා (භෞතික විද්‍යා / ජීව විද්‍යා)/ වාණිජ / වෙනත් / තාක්ෂණ විෂයධාරාවක් හදාරා විෂය තුනකින් (03) සමත් වීම.;

*හා*

අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ) සඳහා විශිෂ්ට සාමර්ථ්‍යයක් ද, ගණිතය සඳහා සම්මාන සාමාර්ථයක් ද, සහිතව ඉංග්‍රීසි භාෂාව ඇතුළුව ද විෂය හයකින් (06) සමත් වීම.

**4.1.3.** සැලකිය යුතු යි -

(i) බඳවා ගැනීමේ දී අ. පො. ස. (උ. පෙළ) විභාගයට පෙනී සිට කලා විෂය ධාරාවෙන් සිංහල / දෙමළ භාෂාව විෂයයක් ලෙස හැදෑරූ අයදුම්කරුවන්ගෙන් 60% ක් ද,

(ii) අ. පො. ස. (උ. පෙළ) විභාගයේ දී සිංහල / දෙමළ භාෂාව විෂයයක් ලෙස හදාරා නොමැති කලා විෂයධාරාවේ අයදුම්කරුවන්ගෙන් 10%ක් සහ විද්‍යා (භෞතික විද්‍යා / ජීව විද්‍යා), වාණිජ විෂයධාරාවලින් 10%ක් බැගින් ද හා වෙනත්, තාක්ෂණ විෂයධාරාවලින් 05%ක් බැගින් ද වන සේ තෝරා ගනු ලැබේ.

(iii) විද්‍යා (භෞතික විද්‍යා / ජීව විද්‍යා), වාණිජ, වෙනත් හා තාක්ෂණ විෂය ධාරා යටතේ බඳවා ගැනීමට නියමිත සුදුසුකම් සහිත අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති වූ විට අ. පො. ස. (උ.පෙළ) විභාගයේ දී සිංහල / දෙමළ භාෂාව විෂයයක් ලෙස හදාරා නොමැති කලා විෂයධාරාවෙන් ඉල්ලුම් කර ඇති අයදුම්කරුවන්ගෙන් සුදුසුකම්ලාභීන් බඳවා ගනු ලැබේ.

**4.2 පාඨමාලා අංකය 02 - විද්‍යාව (සිංහල)**
**විද්‍යාව (දෙමළ)**
**විද්‍යාව (ඉංග්‍රීසි)**

4.2.1. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී භෞතික විද්‍යාව, රසායන විද්‍යාව සහ ජීව විද්‍යාව යන ජීව විද්‍යා විෂයධාරාවට අයත් විෂය තුනෙන් (03) සමත් වීම;

*හා*

4.2.2. ගණිතය, විද්‍යාව/ විද්‍යාව හා තාක්ෂණවේදය විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ) ඇතුළුව විෂය හයකින් (06) අ.පො.ස.(සා. පෙළ) විභාගය සමත් වීම.

4.2.3. *සැලකිය යුතු ය.-*

**විද්‍යාව (ඉංග්‍රීසි මාධ්‍යය) පාඨමාලාව;**

මෙම පාඨමාලාව සඳහා බඳවා ගන්නා මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් අ. පො. ස. (උ.පෙළ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරූ අයදුම්කරුවන්ගෙන් 60%ක් ද, ඉතිරි 40% සිංහල / දෙමළ මාධ්‍යයෙන් අ. පො. ස. (උ.පෙළ) හැදෑරූ අයදුම්කරුවන්ගෙන් ද බඳවා ගනු ලැබේ. (බඳවා ගැනීමේ දී ඉංග්‍රීසි මාධ්‍යයෙන් අ. පො. ස. (උ.පෙළ) එක් විෂයක් හෝ හැදෑරූ අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය හිමි වේ.)

**4.3 පාඨමාලා අංකය 03 - ගණිතය (සිංහල)**
**ගණිතය (දෙමළ)**
**ගණිතය (ඉංග්‍රීසි)**

4.3.1. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී සංයුක්ත ගණිතය, උසස් ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව යන භෞතීය විද්‍යා විෂයධාරාවට අයත් විෂය තුනකින් (03) සමත් වීම;

*හා*

4.3.2. ගණිතය, විද්‍යාව/ විද්‍යාව හා තාක්ෂණවේදය විෂයයන්ට සම්මාන සාමාර්ථ සහිතව මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ) ඇතුළුව විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

**4.3.3.** *සැලකිය යුතු යි* -

**ගණිතය (ඉංග්‍රීසි මාධ්‍යය) පාඨමාලාව;**
මෙම පාඨමාලාව සඳහා බඳවා ගන්නා මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් අ. පො. ස. (උ.පෙළ) ඉංග්‍රීසි මාධ්‍යයෙන් හැදෑරූ අයදුම්කරුවන්ගෙන් 60%ක් ද, ඉතිරි 40% සිංහල / දෙමළ මාධ්‍යයෙන් අ. පො. ස. (උ.පෙළ) හැදෑරූ අයදුම්කරුවන්ගෙන් ද බඳවා ගනු ලැබේ. (බඳවා ගැනීමේ දී ඉංග්‍රීසි මාධ්‍යයෙන් අ. පො. ස. (උ.පෙළ) එක් විෂයක් හෝ හැදෑරූ අයදුම්කරුවන්ට ප්‍රමුඛතාවය හිමි වේ.)

**4.4 පාඨමාලා අංකය 04 - සමාජීය විද්‍යාව (සිංහල)**
**සමාජීය විද්‍යාව (දෙමළ)**

4.4.1. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඉතිහාසය, දේශපාලන විද්‍යාව, භූගෝල විද්‍යාව, ආර්ථික විද්‍යාව යන විෂයන්ගෙන් එකක් ඇතුළුව විෂය තුනකින් (03) සමත් වීම;

හා

4.4.2. සමාජ අධ්‍යයනය හා ඉතිහාසය විෂයයට හෝ ඉතිහාසය/ පුරවැසි අධ්‍යාපනය/භූගෝල විද්‍යාව යන විෂයන්ගෙන් එක් විෂයයකට සම්මාන සාමර්ථ්‍යයක් සහිතව මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ) හා ගණිතය ඇතුළුව විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

**4.5 පාඨමාලා අංකය 05 - බුද්ධ ධර්මය**

බුද්ධ ධර්මය පාඨමාලාවට බෞද්ධ භික්ෂුන් වහන්සේලාට ද, මෙහෙණින් වහන්සේලාට ද, බුද්ධ ශාසන අමාත්‍යාංශය යටතේ ඇති බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි දසසිල් මාතාවන්ට ද, ගිහි අයදුම්කරුවන්ට ද ඉල්ලුම් කළ හැකි ය.

4.5.1 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී බුද්ධ ධර්මය, බෞද්ධ ශිෂ්ටාචාරය, පාලි, සංස්කෘත හා සිංහල යන විෂයන්ගෙන් දෙකක් ඇතුළුව විෂය තුනකින් (03) සමත් වීම.

4.5.2 මූලික පිරිවෙන් අවසාන විභාගයේ දී ගණිතය, සිංහල භාෂාව ඇතුළු විෂය හයකින් (06) දෙවරකට නොවැඩි වාර ගණනක දී සම්මාන සාමාර්ථ තුනක් (03) සහිතව සමත් වීම.

4.5.3. බෞද්ධ ධර්මාචාර්ය විභාගයෙන් සමත් වීම.

4.5.4. ප්‍රාචීන, ප්‍රාරම්භ විභාගයෙන් සමත් වීම.

4.5.5. දහම් පාසල් අවසාන විභාගයෙන් සමත් වීම.

4.5.6. පූජ්‍ය පක්ෂය සඳහා සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ නිට්ටඹුව ආයතනය වෙන් කර ඇත. එහි පවතින පුරප්පාඩු 90ක් සඳහා ප්‍රමාණවත් පැවිදි අයදුම්කරුවන් නොමැති වූ විට එම ප්‍රමාණය ගිහි අයදුම්කරුවන්ගෙන් සාරිපුත්ත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය දඹදෙණිය ආයතනය සඳහා බඳවා ගනු ලැබේ.

4.5.7. පූජ්‍ය පක්ෂයේ අයදුම්කරුවන් අතර 2015 වර්ෂයේ අ.පො.ස. (උ. පෙළ) සමත් වූ අයදුම්කරුවන් අවශ්‍ය සංඛ්‍යාව නොමැති නම් 2014, 2013, 2012, 2011 යන වර්ෂ අනුපිළිවෙලින් ආසන්නත ම වර්ෂය සලකා අ.පො.ස. (උ. පෙළ) සමත් වූ පූජ්‍ය/ පැවිදි පක්ෂයේ අයදුම්කරුවන්ගෙන් තෝරා ගනු ලැබේ.

**4.5.8. තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල;**

(*අ*) 4.5.1, 4.5.2 සහ 4.5.3 සහතික ඇති අයදුම්කරුවන්
(*ආ*) 4.5.1, 4.5.2 සහ 4.5.4 සහතික ඇති අයදුම්කරුවන්
(*ඇ*) 4.5.1, 4.5.2 සහ 4.5.5 සහතික ඇති අයදුම්කරුවන්
(*ඈ*) 4.5.1 සහ 4.5.2 සහතික ඇති අයදුම්කරුවන්

**4.6 පාඨමාලා අංකය 06 - හින්දු ධර්මය**

4.6.1 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී හින්දු ධර්මය, හින්දු ශිෂ්ටාචාරය හා සංස්කෘත යන විෂයන්ගෙන් එකක් ඇතුළුව විෂය තුනකින් (03) සමත් වීම.

4.6.2 දෙමළ භාෂාව, ගණිතය සහ හින්දු ධර්මය ඇතුළුව විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් වීම.

4.6.3 ශෛව සිද්ධාන්ත පණ්ඩිතර් සහතිකය ලබා තිබීම.

4.6.4 ශෛව පුලවර් සහතිකය ලබා තිබීම.

4.6.5 ඉලං ශෛව පුලවර් සහතිකය ලබා තිබීම.

**4.6.6. තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල;**

(අ) 4.6.1, 4.6.2 සහ අනිකුත් සියලු ම සහතික හිමි අයදුම්කරුවන්
(ආ) 4.6.1, 4.6.2, 4.6.5 සහ අනිකුත් සහතික දෙකෙන් එකක් ලැබූ අයදුම්කරුවන්

(ඉ) 4.6.1, 4.6.2 සහ අනිකුත් සහතික තුනෙන් එකක් ලැබූ අයදුම්කරුවන්

(ඊ) 4.6.1, 4.6.2 සහතික ලැබූ අයදුම්කරුවන්

**4.7 පාඨමාලා අංකය 07 - ඉස්ලාම් ධර්මය**

4.7.1 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඉස්ලාම් ධර්මය, ඉස්ලාම් ශිෂ්ටාචාරය හා අරාබි යන විෂයන්ගෙන් එකක් ඇතුළුව විෂය තුනකින් (03) සමත් වීම.

4.7.2 දෙමළ භාෂාව, ගණිතය සහ ඉස්ලාම් ධර්මය ඇතුළුව විෂය හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.7.3 අල් - ආලීම් විභාගය (ප්‍රාථමික විභාගයේ සියලුම විෂයයන්ගෙන් හා අවසාන විභාගයේ සියලුම විෂයයන්ගෙන්) සමත් වීම.

4.7.4 අල් - ආලීම් ප්‍රාථමික විභාගයේ සියලු ම විෂයයන්ගෙන් සමත් වීම.

4.7.5 මෞලවි සහතිකය ලබා තිබීම.

4.7.6. **තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල;**

(අ) 4.7.1, 4.7.2, 4.7.3 සහ 4.7.5 සහතික හිමි අයදුම්කරුවන්

(ආ) 4.7.1, 4.7.2, 4.7.4 සහ 4.7.5 සහතික හිමි අයදුම්කරුවන්

(ඉ) 4.7.1, 4.7.2 සහ 4.7.5 සහතික හිමි අයදුම්කරුවන්

(ඊ) 4.7.1 සහ 4.7.2 සහතික හිමි අයදුම්කරුවන්

**4.8 පාඨමාලා අංකය 08 - කතෝලික ධර්මය /ක්‍රිස්තියානි ධර්මය (සිංහල)**
**කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය (දෙමළ)**

4.8.1. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයෙන් ක්‍රිස්තියානි ධර්මය, ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය විෂයන්ගෙන් එකක් සහිතව විෂය තුනකින් (03) සමත් වීම;

*හා*

මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ) , ගණිතය හා කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය විෂයය ඇතුළුව විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම;

*හා*

අයදුම්කරු කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය ගුරුවරයෙකු වීමට සුදුසු බවට, කතෝලික ආගමිකයන් සඳහා කතෝලික රදගුරු පදවි සහතිකය ද, ක්‍රිස්තියානි ආගමිකයන් සඳහා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ සහතිකය ද ලබා තිබීම.

4.8.2 **කතෝලික ධර්මය** අයදුම්කරුවන් තෝරා ගැනීම පහත දැක්වෙන සුදුසුකම්වලට අනුපිළිවෙලින් ප්‍රමුඛත්වය දී සිදු කරනු ලැබේ.

4.8.2.1 ජාතික දෙව්සත්හලේ දේව ධර්මය පිළිබඳ සිව් අවුරුදු පාඨමාලා සහතිකය;

*හෝ*

4.8.2.2 ජාතික දෙව්සත්හලේ දර්ශනවාදය පිළිබඳ පාඨමාලා සහතිකය;

*හෝ*

4.8.2.3 දේව ධර්ම නිකේතනයේ තුන් අවුරුදු ආගමික අධ්‍යයන පාඨමාලා සහතිකය;

*හෝ*

4.8.2.4 පැවිදිවරයකු/ පැවිදිවරියක වීම සඳහා ආගමික අධ්‍යයන සහ පුහුණු පාඨමාලාව (නොවිෂියේට්) සාර්ථකව හදාරා අවසන් කළ බවට පැවිදි නිකායන්ගේ ශ්‍රේෂ්ඨාධිපති/ ශ්‍රේෂ්ඨාධිපතිනිය හෝ අදාළ රදගුරුතුමන් විසින් නිකුත් කරන ලද සහතිකය;

*හෝ*

4.8.2.5 ජාතික ධර්මෝපදේශක මධ්‍යස්ථානය විසින් පවත්වනු ලබන කතෝලික ධර්මාචාර්ය (දහම් ගුරු) විභාගයක් සමත් වීම;

එනම්,

ධර්මාචාර්ය ගෞරව (දහම් ගුරු 03)

*හෝ*

ධර්මාචාර්ය විශේෂ (දහම් ගුරු 02)

*හෝ*

ධර්මාචාර්ය සාමාන්‍ය (දහම් ගුරු 01)

*හෝ*

4.8.2.6 අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ක්‍රිස්තියානි ධර්මය/ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය විෂයය සමත් වීම.

4.8.3 **ක්‍රිස්තියානි ධර්මය** අයදුම්කරුවන් තෝරා ගැනීම අනුපිළිවෙලින් පහත දැක්වෙන සුදුසුකම් අනුව සිදු කරනු ලැබේ;

4.8.3.1 පිළිමතලාව ලංකා දේව ධර්ම ශාස්ත්‍රාලය මගින් පවත්වනු ලබන ධර්මවේදී ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම;

4.8.3.2 ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය මගින් පවත්වනු ලබන ආගමික දැනුම පිළිබඳ ජාතික සහතිකය (ධර්මාචාර්ය) ලබා තිබීම.

**4.8.4.** *සැලකිය යුතු යි* -

(i) කතෝලික/ ක්‍රිස්තියානි ධර්මය (සිංහල/දෙමළ මාධ්‍ය) පාඨමාලාවට තෝරා ගැනීමේ දී ඒ ඒ දිස්ත්‍රික්කයේ අයදුම්කරුවන්ගේ Z ලකුණු කුසලතා අනුපිළිවෙලට තෝරා ගනු ලැබේ.

(ii) බඳවා ගන්නා මුළු ගිහි අයදුම්කරුවන් සංඛ්‍යාවෙන් 85%ක් තෝරා ගැනීම සඳහා 4.8.1 යටතේ සුදුසුකම් ලබන කතෝලික අයදුම්කරුවන් අතරින් 4.8.2 යටතේ දැක්වෙන අනුපිළිවෙල අනුව තෝරාගනු ලැබේ. 85% කතෝලික අයදුම්කරුවන් ඉදිරිපත් වී නොමැති නම් එම පුරප්පාඩු සඳහා ක්‍රිස්තියානි අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

(iii) බඳවා ගන්නා මුළු ගිහි සංඛ්‍යාවෙන් 15%ක් 4.8.1 යටතේ සුදුසුකම් ලබන ක්‍රිස්තියානි ධර්මය අයදුම්කරුවන් අතරින් 4.8.3 යටතේ දැක්වෙන අනුපිළිවෙල අනුව තෝරා ගනු ලැබේ. 15%ක් ක්‍රිස්තියානි අයදුම්කරුවන් ඉදිරිපත් වී නොමැති නම් එම පුරප්පාඩු සඳහා කතෝලික අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

(iv) බඳවා ගන්නා මුළු අයදුම්කරුවන් සංඛ්‍යාවෙන් 40%ක් කතෝලික හා ක්‍රිස්තියානි පූජක පක්ෂයෙන් තෝරා ගනු ලැබේ. 40%ක පූජක පක්ෂයේ අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් වී නොමැති නම් එම පුරප්පාඩු සඳහා ගිහි අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

(v) පූජක පක්ෂයේ අයදුම්කරුවන් අතර 2015 වර්ෂයේ අ.පො.ස. (උ. පෙළ) සමත්වූ අයදුම්කරුවන් අවශ්‍ය සංඛ්‍යාව නොමැති නම් 2014, 2013, 2012, 2011 යන වර්ෂ අනුපිළිවෙලින් ආසන්නතම වර්ෂය සලකා අ.පො.ස. (උ. පෙළ) සමත් වූ පූජක/ පැවිදි පක්ෂයේ අයදුම්කරුවන්ගෙන් තෝරා ගනු ලැබේ.

**4.9 පාඨමාලා අංකය 09 - පළමු බස (සිංහල)**

4.9.1 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී සිංහල විෂයයට සම්මාන සාමර්ථ්‍යයක් ඇතුළුව විෂය තුනකින් (03) සමත් වීම;

*හා*

4.9.2 සිංහල භාෂාව විෂයයට සම්මාන සාමර්ථ්‍යයක් සහිතව ගණිතය ඇතුළුව විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

**4.10 පාඨමාලා අංකය 10 - පළමු බස (දෙමළ)**

4.10.1 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී දෙමළ විෂයයට සම්මාන සාමර්ථ්‍යයක් ඇතුළුව විෂය තුනකින් (03) සමත් වීම;

*හා*

4.10.2 දෙමළ භාෂාව විෂයයට සම්මාන සාමර්ථ්‍යයක් සහිතව ගණිතය ඇතුළුව විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

**4.11 පාඨමාලා අංකය 11 - ඉංග්‍රීසි**

4.11.1 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව (විෂය අංකය 73) ඇතුළුව විෂය තුනකින් (03) සමත් වීම;

*හා*

අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සාමර්ථ්‍යයක් / ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යයක් සහිතව, මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ) හා ගණිතය ද ඇතුළුව විෂය හයකින් (06) සමත් වීම.

4.11.2 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑ ම විෂය තුනකින් (03) සමත් වීම;

*හා*

අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට අවම වශයෙන් සම්මාන සාමර්ථ්‍යයක් හා මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ), ගණිතය හා ඉංග්‍රීසි භාෂාව ද ඇතුළුව විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම;

4.11.3 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑ ම විෂය තුනකින් (03) සමත් වීම;

*හා*

අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි භාෂාව විෂයයට අවම වශයෙන් අධි සම්මාන සාමර්ථ්‍යයක් හා මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ), ගණිතය ද ඇතුළුව විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.11.4. **තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල**

(i) *4.11.1 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන්.*
ඔවුන් තෝරා ගනු ලබන්නේ එක් එක් දිස්ත්‍රික්ක මට්ටමින් ලබා ගත් Z ලකුණු කුසලතා අනුපිළිවෙලට වේ.

(ii) *4.11.2 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන්.*
තවදුරටත් පුරප්පාඩු පවතී නම් මෙම කාණ්ඩය යටතේ අයදුම්කරුවන් ඔවුන්ගේ අ. පො. ස. ( උ. පෙළ) විභාගයේ දී ලද Z අගයේ අනුපිළිවෙලට සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර, ඔවුන් අතුරින් සුදුස්සන් තෝරා ගනු ලබන්නේ අයදුම්කරුවන්ගේ Z අගය හා අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සාහිත්‍ය විෂයයට ලබා ගත් ශ්‍රේණියේ ඉහළ සිට පහළට එකිනෙක ගළපා එම අනුපිළිවෙලට වේ.

(මෙහි දී සලකා බලනු ලබන්නේ අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට ලබා ගත් විශිෂ්ට සාමර්ථ්‍යය - A, අධි සම්මාන සාමර්ථ්‍යය - B හා සම්මාන සාමර්ථ්‍යය - C පමණි).

(iii) *4.11.3 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන්.*
ඉහත (ii) යටතේ ද තෝරා ගෙන තවදුරටත් පුරප්පාඩු පවතී නම් මෙම කාණ්ඩය යටතේ අයදුම්කරුවන් ඔවුන්ගේ අ. පො.ස. (උ.පෙළ) විභාගයේ දී ලද Z අගයේ අනුපිළිවෙලට සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන අතර ඔවුන් අතුරින් සුදුස්සන් තෝරා ගනු ලබන්නේ අයදුම්කරුවන්ගේ Z අගය හා අ. පො. ස. (සා. පෙළ.) විභාගයේ ද ඉංග්‍රීසි විෂයයට ලබා ගත් ශ්‍රේණිය ඉහළ සිට පහළට එකිනෙක ගලපා එම අනුපිළිවෙලට වේ.

**4.13 පාඨමාලා අංකය 13 - චිත්‍ර (සිංහල)**
**චිත්‍ර (දෙමළ)**

4.13.1 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී චිත්‍ර කලාව විෂයය ඇතුළුව විෂය තුනකින් (03) සමත් වීම;

*හා*

4.13.2 මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ) , ගණිතය හා චිත්‍ර ඇතුළුව විෂය හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත් වීම .

4.13.3. 4.13.1 සහ 4.13.2 සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් 3.6 වගන්තියේ සඳහන් ක්‍රමවේදයට අනුව තෝරා ගැනීම් සිදු කරනු ලැබේ.

**4.13.4.** සැලකිය යුතුයි -

(ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් එම පුරප්පාඩු පිරවීමට 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී චිත්‍ර කලාව විෂයය ඇතුළුව විෂය තුනකින් (03) සමත්, වතු දිස්ත්‍රික්කවල පදිංචි, වතු සේවක නොවන ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ මාධ්‍ය අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව දෙනු ලැබේ.)

**4.14 පාඨමාලා අංකය 14 - නැටුම් (පෙරදිග)**

4.14.1. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී නැටුම් (පෙරදිග) විෂයය ඇතුළුව විෂය තුනකින් (03) සමත් වීම;

*හා*

4.14.2. සිංහල භාෂාව, ගණිතය හා නැටුම් (පෙරදිග) ඇතුළුව විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.14.3. 4.14.1 සහ 4.14.2 සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් 3.6 වගන්තියේ සඳහන් ක්‍රමවේදයට අනුව තෝරා ගැනීම් සිදු කරනු ලැබේ.

**4.15 පාඨමාලා අංකය 15 - නැටුම් (භරත)**

4.15.1 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී නැටුම් (භරත) ඇතුළුව විෂය තුනකින් (03) සමත් වීම;

*හා*

4.15.2 දෙමළ භාෂාව, ගණිතය හා නැටුම් (භරත) ඇතුළුව විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.15.3. 4.15.1 සහ 4.15.2 සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් 3.6 වගන්තියේ සඳහන් ක්‍රමවේදයට අනුව තෝරා ගැනීම් සිදු කරනු ලැබේ.

4.15.4. *සැලකිය යුතු යි*

(ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් එම පුරප්පාඩු පිරවීමට 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී නැටුම් (භරත) විෂයය ඇතුළුව විෂය තුනකින් (03) සමත්, වතු දිස්ත්‍රික්කවල පදිංචි, වතු සේවක නොවන ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ මාධ්‍ය අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව දෙනු ලැබේ.)

**4.16 පාඨමාලා අංකය 16 - සංගීතය (පෙරදිග)**

4.16.1. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී සංගීතය (පෙරදිග) විෂයය ඇතුළුව විෂය තුනකින් (03) සමත් වීම;

*හා*

4.16.2. සිංහල භාෂාව, ගණිතය හා සංගීතය (පෙරදිග) ඇතුළුව විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.16.3. 4.16.1 සහ 4.16.2 සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් 3.6 වගන්තියේ සඳහන් ක්‍රමවේදයට අනුව තෝරා ගැනීම් සිදු කරනු ලැබේ.

**4.17පාඨමාලා අංකය 17 - සංගීතය (කර්ණාටක)**

4.17.1. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී සංගීතය (කර්ණාටක) ඇතුළුව විෂය තුනකින් (03) සමත් වීම;

*හා*

4.17.2. දෙමළ භාෂාව, ගණිතය හා සංගීතය (කර්ණාටක) ඇතුළුව විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.17.3. 4.17.1 සහ 4.17.2 සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් 3.6 වගන්තියේ සඳහන් ක්‍රමවේදයට අනුව තෝරා ගැනීම් සිදු කරනු ලැබේ.

**4.17.4. *සැලකිය යුතු යි* -**

(ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය සඳහා අදාළ සුදුසුකම් සම්පූර්ණ කළ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් එම පුරප්පාඩු පිරවීමට 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී සංගීතය (කර්ණාටක) විෂයය ඇතුළුව විෂය තුනකින් (03) සමත්, වතු දිස්ත්‍රික්කවලට අයත් වතු සේවක නොවන ඉන්දියානු සම්භවයක් ඇති දෙමළ මාධ්‍ය අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව දෙනු ලැබේ.)

**4.18 පාඨමාලා අංකය 18 - බටහිර සංගීතය (ඉංග්‍රීසි)**

4.18.1 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී බටහිර සංගීතය ඇතුළුව විෂය තුනකින් (03) සමත් වීම;

*හා*

ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සාමාර්ථ්‍යයක්/ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යයක් ද සහිතව මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ), ගණිතය සහ බටහිර සංගීතය ඇතුළුව විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම;

*හෝ*

4.18.2 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑ ම විෂය තුනකින් (03) සමත් වීම;

*හා*

ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සමාර්ථ්‍යයක් / ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යයක් ද සහිතව මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ), ගණිතය සහ බටහිර සංගීතය ඇතුළුව විෂය හයකින් (06) අ.පො. ස. (සා. පෙළ) විභාගය සමත් වීම;

*හා*

අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලය/ අධ්‍යාපන ලේකම් විසින් අනුමත කරන ලද ආයතනයක බටහිර සංගීතය පිළිබඳව හතරවැනි පන්තිය සමත් වීම (න්‍යායික හා ප්‍රායෝගික);

*හෝ*

4.18.3 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑ ම විෂය තුනකින් (03) සමත් වීම;

*හා*

ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සමාර්ථ්‍යයක් / ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යයක් ද සහිතව මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ භාෂාව), ගණිතය සහ බටහිර සංගීතය ඇතුළුව විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම;

*හා*

අ.පො.ස. (උ. පෙළ) විභාගයේදී බටහිර සංගීතය විෂයය අමතර විෂයයක් ලෙස සමත් වී තිබීම.

*හෝ*

4.18.4 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑ ම විෂය තුනකින් (03) සමත් වීම;

*හා*

බටහිර සංගීතය විෂයයට විශිෂ්ට සාමාර්ථ්‍යයක් ද ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සාමර්ථ්‍යයක් ද/ ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යයක් ද සහිතව මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ) සහ ගණිතය ඇතුළුව විෂය හයකින් (06) අ. පො. ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

**4.18.5 *සැලකිය යුතු යි* -**

(i) බටහිර සංගීතය පාඨමාලාව සඳහා පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයේ දී සතුටුදායක කුසලතා මට්ටමකට ළඟා විය යුතු ය.

(ii) අයදුම්කරුවන් තෝරා ගැනීමේ දී ඉහත 4.18.1, 4.18.2, 4.18.3, 4.18.4 අනුපිළිවෙල අනුව ප්‍රමුඛතාව හිමි වේ.

**4.19 පාඨමාලා අංකය 19 - නාට්‍ය හා රංග කලාව (සිංහල)**
**නාට්‍ය හා රංග කලාව (දෙමළ)**

4.19.1. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී නාට්‍ය හා රංග කලාව විෂයය ඇතුළුව විෂය තුනකින් (03) සමත් වීම;

හා

4.19.2. මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ) ද ගණිතය සහ නාට්‍ය හා රංග කලාව/ නැටුම්/ සංගීතය ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.19.3. 4.19.1 හා 4.19.2 සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් අතුරින් 3.6 වගන්තියේ සඳහන් ක්‍රමවේදයට අනුව තෝරා ගැනීම් සිදු කරනු ලැබේ.

**4.19.4.** *සැළකිය යුතු යි -*

බඳවා ගැනීමේ දී අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී නාට්‍ය හා රංග කලාව විෂයය සමත් අයදුම්කරුවන්ට ප්‍රමුඛතාව හිමි වේ. යම් දිස්ත්‍රික්කයක අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී නාට්‍ය හා රංග කලාව විෂයය සමත් අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති වුවහොත් පමණක් අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී නැටුම්/ සංගීතය විෂයය සමත් අයදුම්කරුවන් තෝරා ගැනීම සඳහා සළකා බලනු ලැබේ.

**4.20 පාඨමාලා අංකය 20 - ශාරීරික අධ්‍යාපනය (සිංහල)**
**ශාරීරික අධ්‍යාපනය (දෙමළ)**

4.20.1. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑ ම විෂය තුනකින් (03) සමත් වීම;

හා

4.20.2. මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ), ගණිතය ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් වීම;

හා

4.20.3. පිළිගත් ජවන හා පිටිය මළල ක්‍රීඩා, සංවිධානාත්මක ක්‍රීඩා පිළිබඳ ප්‍රවීණතාවක්/ දක්ෂතාවක් ලබා තිබීම;
විවිධ ක්‍රීඩා/ ඉසවු තුනක් සඳහා ඉදිරිපත් කරන සහතික සළකා බලා පහත වගුවේ සඳහන් පරිදි උපරිම ලකුණු 75ක් ප්‍රදානය කරනු ලැබේ.

**4.20.3.1 ක්‍රීඩා/ ඉසවු ප්‍රමුඛතා අනුපිළිවෙල**

| අනු. අංකය | මට්ටම/ විෂය | කේවල | සමූහ | ස්ථානය/ ශ්‍රේණිය | ලකුණු |
|---|---|---|---|---|---|
| 01 | අන්තර් ජාතික මට්ටම | කේවල | - | 01 | 25 |
| 02 | අන්තර් ජාතික මට්ටම | කේවල | - | 02 | 24 |
| 03 | අන්තර් ජාතික මට්ටම | කේවල | - | 03 | 23 |
| 04 | අන්තර් ජාතික මට්ටම | - | සමූහ | 01 | 24 |
| 05 | අන්තර් ජාතික මට්ටම | - | සමූහ | 02 | 23 |
| 06 | අන්තර් ජාතික මට්ටම | - | සමූහ | 03 | 22 |
| 07 | අන්තර් ජාතික නියෝජනය | කේවල | සමූහ | - | 21 |
| 08 | ජාතික මට්ටම | කේවල | - | 01 | 20 |
| 09 | ජාතික මට්ටම | කේවල | - | 02 | 19 |
| 10 | ජාතික මට්ටම | කේවල | - | 03 | 18 |
| 11 | ජාතික මට්ටම | - | සමූහ | 01 | 19 |
| 12 | ජාතික මට්ටම | - | සමූහ | 02 | 18 |
| 13 | ජාතික මට්ටම | - | සමූහ | 03 | 17 |
| 14 | පළාත් මට්ටම /ජාතික සංගම්/පාසල් සංගම් | කේවල | - | 01 | 16 |
| 15 | පළාත් මට්ටම / ජාතික සංගම්/පාසල් සංගම් | කේවල | - | 02 | 15 |
| 16 | පළාත් මට්ටම/ ජාතික සංගම්/පාසල් සංගම් | කේවල | - | 03 | 14 |
| 17 | පළාත් මට්ටම/ ජාතික සංගම්/පාසල් සංගම් | - | සමූහ | 01 | 15 |
| 18 | පළාත් මට්ටම/ ජාතික සංගම්/පාසල් සංගම් | - | සමූහ | 02 | 14 |
| 19 | පළාත් මට්ටම/ ජාතික සංගම්/පාසල් සංගම් | - | සමූහ | 03 | 13 |
| 20 | රෙජිමේන්තු සැරයන් මේජර්/බලලත් නිලධාරී 1 | - | - | - | 10 |
| 21 | ජනාධිපති බාලදක්ෂ/ බාලදක්ෂිකා | - | - | - | 10 |
| 22 | සාජන්ට් මේජර්/ බලලත් නිලධාරී 2 | - | - | - | 09 |
| 23 | දිස්ත්‍රික් මට්ටම | කේවල | - | 01 | 10 |
| 24 | දිස්ත්‍රික් මට්ටම | කේවල | - | 02 | 09 |
| 25 | දිස්ත්‍රික් මට්ටම | කේවල | - | 03 | 08 |
| 26 | දිස්ත්‍රික් මට්ටම | - | සමූහ | 01 | 09 |
| 27 | දිස්ත්‍රික් මට්ටම | - | සමූහ | 02 | 08 |
| 28 | දිස්ත්‍රික් මට්ටම | - | සමූහ | 03 | 07 |

| අනු. අංකය | මට්ටම/ විෂය | කේවල | සමූහ | ස්ථානය/ ශ්‍රේණිය | ලකුණු |
|---|---|---|---|---|---|
| 29 | කලාප/ ප්‍රා. ලේ. කාර්යාල මට්ටම | කේවල | - | 01 | 06 |
| 30 | කලාප/ ප්‍රා. ලේ. කාර්යාල මට්ටම | කේවල | - | 02 | 05 |
| 31 | කලාප/ ප්‍රා. ලේ. කාර්යාල මට්ටම | කේවල | - | 03 | 04 |
| 32 | කලාප/ ප්‍රා. ලේ. කාර්යාල මට්ටම | - | සමූහ | 01 | 05 |
| 33 | කලාප/ ප්‍රා. ලේ. කාර්යාල මට්ටම | - | සමූහ | 02 | 04 |
| 34 | කලාප/ ප්‍රා. ලේ. කාර්යාල මට්ටම | - | සමූහ | 03 | 03 |

4.20.4 අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී සෞඛ්‍යය හා ශාරීරික අධ්‍යාපනය විෂයයට ඔවුන් ලබා ඇති සාමර්ථ්‍යය අනුව පහත දැක්වෙන පරිදි අතිරේක ලකුණු හිමි වේ.

A සාමර්ථ්‍යය - 05
B සාමර්ථ්‍යය - 03
C සාමර්ථ්‍යය - 02
S සාමර්ථ්‍යය - 01

4.20.5. ***සැළකිය යුතු යි*** -

(i) ශාරීරික අධ්‍යාපනය පාඨමාලාවට තෝරා ගැනීමේ දී එක් එක් දිස්ත්‍රික්කවල අයදුම්කරුවන්ගේ ක්‍රීඩා කුසලතා ලකුණු අනුපිළිවෙල අනුව තෝරා ගනු ලැබේ. (4.20.3.1 වගුව පරිදි)

(ii) බඳවා ගැනීමේ දී මළල ක්‍රීඩා, වොලිබෝල්, නෙට්බෝල් සහ පාපන්දු යන ක්‍රීඩාවලින් 60% ක් ද අනිකුත් පිළිගත් ක්‍රීඩාවලින් 40%ක් ද වශයෙන් අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

(iii) පිළිගත් ක්‍රීඩා තරග (අන්තර් ජාතික) - අධ්‍යාපන අමාත්‍යාංශය/ ක්‍රීඩා අමාත්‍යාංශය සහ ඒවායේ ලියාපදිංචි ජාතික ක්‍රීඩා සංගම් මගින් (චෙස්, කැරම්, දාම් හැර) ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩා කණ්ඩායම් හෝ පාසල් ජාතික ක්‍රීඩා කණ්ඩායම් නියෝජනය කරමින් සහභාගී වන අන්තර් ජාතික තරග (පාසල් ක්‍රීඩා කණ්ඩායම් පෞද්ගලිකව සහභාගී වන අන්තර් ජාතික තරග සළකා බලනු නොලැබේ). <u>තව ද අන්තර් ජාතික තරග සහතික සළකා බලනු ලබන්නේ අවම වශයෙන් පළාත් මට්ටමින් හෝ ක්‍රීඩා ජයග්‍රහණයක් ලබා ඇත්නම් පමණි. එසේ නොමැති අවස්ථාවල ලකුණු ලබා දෙනු නොලැබේ.</u>

(iv) පිළිගත් ක්‍රීඩා තරග - අධ්‍යාපන අමාත්‍යාංශය/ ක්‍රීඩා අමාත්‍යාංශය/ ජාතික තරුණ සේවා සභාව මගින් සංවිධානය කරනු ලබන ජාතික මට්ටමේ ක්‍රීඩා තරග

පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය/ පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය/ ජාතික තරුණ සේවා සභාව මගින් සංවිධානය කරනු ලබන පළාත් මට්ටමේ ක්‍රීඩා තරග

පළාත් ක්‍රීඩා අමාත්‍යාංශය/ ජාතික තරුණ සේවා සභාව මගින් සංවිධානය කරනු ලබන දිස්ත්‍රික් මට්ටමේ/ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේ ක්‍රීඩා තරග/ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මගින් සංවිධානය කරනු ලබන අධ්‍යාපන කලාප මට්ටමේ ක්‍රීඩා තරග

(v) ක්‍රීඩා අමාත්‍යාංශය සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ ලියාපදිංචි හා පිළිගත් ක්‍රීඩා සංගම් මගින් සංවිධානය කරන ලද 'ඒ' කාණ්ඩයේ තරගවල 1, 2 හා 3 වැනි ස්ථානවලට පමණක් අනුපිළිවෙලින් ප්‍රමුඛතාව දෙනු ලැබේ.

(vi) 2011.01.01 වැනි දින සිට 2015.12.31 දින දක්වා ලබාගත් ක්‍රීඩා ප්‍රවීනතා/ දක්ෂතා මේ සඳහා වලංගු වේ. (සැළකිය යුතුයි - මෙම කාලසීමාවට පෙර හා පසුව නිකුත් කළ සහතික ලකුණු ලබාදීමට සළකා බලනු නො ලැබේ.)

(vii) ක්‍රීඩා සහතික තුනකට ලකුණු දීමේ දී ලකුණු හිමි වන්නේ එකම ඉසව්වකට එකම වසරක දී ලබාගත් සහතිකවලින් එක් ඉහළ ම සහතිකයකට පමණි.

(viii) මෙහි දී ක්‍රීඩා අමාත්‍යාංශයේ හා අධ්‍යාපන අමාත්‍යාංශයේ පිළිගත් ජාතික හා පාසල් ක්‍රීඩා සංගම්වලට අයත් පහත සඳහන් ක්‍රීඩා පමණක් සළකා බලනු ලැබේ.

| | | |
|---|---|---|
| බැඩ්මින්ටන් | රග්බි පාපන්දු | මළල ක්‍රීඩා |
| ජල ක්‍රීඩා (පිහිනුම්) | බර ඉසිලීම | ක්‍රිකට් |
| ජූඩෝ | පාපන්දු | වොලිබෝල් |
| පාපැදි | ජිම්නාස්ටික් | දැල්පන්දු |
| එල්ලේ | මේස පන්දු | වුෂු |
| හොකී | මල්ලව පොර | ටෙනිස් |
| කරාතේ දෝ | පැසිපන්දු | බොක්සිං |
| ටයිකොන්ඩෝ | සැහැල්ලු පන්දු ක්‍රිකට් | කබඩි |
| ත්‍රෝ බෝල් | අත් පන්දු | බේස්බෝල් |

**4.21 පාඨමාලා අංකය 21 - ගෘහ ආර්ථික විද්‍යාව (සිංහල)**
**ගෘහ ආර්ථික විද්‍යාව (දෙමළ)**

4.21.1. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ගෘහ ආර්ථික විද්‍යාව ඇතුළුව විෂයයන් තුනකින් (03) සමත් වීම;

*හා*

4.21.2. මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ), ගණිතය සහ විද්‍යාව/ විද්‍යාව හා තාක්ෂණවේදය ඇතුළුව විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

**4.22 පාඨමාලා අංකය 22 - කෘෂි හා ආහාර තාක්‍ෂණය (සිංහල)**
**කෘෂි හා ආහාර තාක්‍ෂණය (දෙමළ)**

4.22.1. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී කෘෂි විද්‍යාව, ජීව විද්‍යාව, රසායන විද්‍යාව යන විෂයයන් තුන (03) සමත් වීම;

*හා*

ගණිතය සහ විද්‍යාව/ විද්‍යාව හා තාක්ෂණවේදය යන විෂයයන්ට සම්මාන සාමාර්ථයයන් සහිතව මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ) ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.22.2. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂණය සඳහා විද්‍යාව සහ කෘෂි විද්‍යාව යන විෂයයන් තුන (03) සමත් වීම;

*හා*

ගණිතය, විද්‍යාව/ විද්‍යාව හා තාක්ෂණවේදය, මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ) ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.22.3. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී කෘෂි විද්‍යාව / කෘෂි තාක්‍ෂණවේදය/ජෛව සම්පත් තාක්‍ෂණවේදය/ආහාර තාක්‍ෂණවේදය විෂයය ඇතුළුව විෂයයන් තුනකින් (03) සමත් වීම;

*හා*

ගණිතය, විද්‍යාව/ විද්‍යාව හා තාක්‍ෂණවේදය, මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ) ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

**4.22.4. සැලකිය යුතු යි -**

**තෝරාගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල**

(*අ*) 4.22.1 සුදුසුකම් හිමි අයදුම්කරුවන්
(*ආ*) 4.22.2 සුදුසුකම් හිමි අයදුම්කරුවන්
(*ඇ*) 4.22.3 සුදුසුකම් හිමි අයදුම්කරුවන්

**4.23 පාඨමාලා අංකය 23 - තාක්‍ෂණ අධ්‍යයනය - ශිල්ප කලා (සිංහල)**
**තාක්‍ෂණ අධ්‍යයනය - ශිල්ප කලා (දෙමළ)**

4.23.1. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑ ම විෂය තුනකින් (03) සමත් වීම ;

හා

4.23.2. ගණිතය සහ මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ), ශිල්ප කලා/ කලා ශිල්ප ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් වීම;

**4.24 පාඨමාලා අංකය**
**24 -A නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්‍ෂණවේදය (සිංහල)**
**24 -B නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්‍ෂණවේදය (සිංහල)**
**24 -C නිර්මාණකරණය හා විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්‍ෂණවේදය (සිංහල)**
**24 -A නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්‍ෂණවේදය (දෙමළ)**
**24 -B නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්‍ෂණවේදය (දෙමළ)**
**24 -C නිර්මාණකරණය හා විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්‍ෂණවේදය (දෙමළ)**

4.24.1. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඉංජිනේරු තාක්ෂණවේදය, තාක්ෂණය සඳහා විද්‍යාව සහ තාක්ෂණවේදය විෂයධාරාව සඳහා තෙවන විෂයය ලෙස අනුමත විෂයයන්ගෙන් එක් විෂයයක් ඇතුළුව විෂයයන් තුනකින් (03) සමත් වීම;

හෝ

4.24.2. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී දෘඪ තාක්ෂණවේදයට අයත් සිවිල් තාක්ෂණවේදය, යාන්ත්‍රික තාක්‍ෂණවේදය, විදුලිය ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්ෂණවේදය යන විෂයන්ගෙන් එකක් ඇතුළුව විෂයයන් තුනකින් (03) සමත් වීම;

හා

4.24.3. ගණිතය සහ මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ) ද, ඉදිකිරීම් තාක්‍ෂණය/ යාන්ත්‍රික තාක්‍ෂණය/ විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්‍ෂණය/ නිර්මාණකරණය හා තාක්‍ෂණවේදය යන විෂයන්ගෙන් එකක් ද ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් වීම;

4.24.4. ***සැළකිය යුතු යි*** -

(i) තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල:
(*අ*) 4.24.1, 4.24.3 සහතික හිමි අයදුම්කරුවන්.

(*ආ*) 4.24.2, 4.24.3 සහතික හිමි අයදුම්කරුවන්.

එසේ වුව ද ඉහත (අ) හා (ආ)හි සඳහන් සුදුසුකම් සපුරා ලූ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් එක් එක් දිස්ත්‍රික්කවලින් ඉදිරිපත් වී නොමැති නම් 2014 සහ 2013 වසරවල දී (අ) හෝ (ආ) සුදුසුකම් ලද අයදුම්කරුවන් පිළිවෙලින් සළකා බලනු ලැබේ.

(ii) ඉල්ලුම් පත්‍රයේ අංක 1.0 යටතේ ඉල්ලුම් කරන විෂය ක්ෂේත්‍රය නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්‍ෂණවේදය/ නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්‍ෂණවේදය/ නිර්මාණකරණය හා විදුලිය හා ඉලෙක්ට්‍රොනික තාක්‍ෂණවේදය යන්න පැහැදිලිව සටහන් කළ යුතු ය.

(iii) ඉල්ලුම් පත්‍ර කැඳවීමේ අවසාන දිනට හෝ ඊට පෙර ඉහත දැක්වෙන සියලු අවශ්‍යතා සම්පූර්ණ කර තිබිය යුතු ය.

**4.25 පාඨමාලා අංකය 25 - තොරතුරු සන්නිවේදන තාක්‍ෂණය (ඉංග්‍රීසි)**

4.25. 1. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ විෂයයට අවම වශයෙන් සම්මාන සාමර්ථ්‍යයක් ඇතුළුව විෂයයන් තුනකින් (03) සමත් වීම;

*හා*

ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සාමර්ථ්‍යයක්/ ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යයක් සහ ගණිතය, මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ) ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.25.2. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ විෂයයට සාමර්ථ්‍යයක් ඇතුළුව විෂය තුනකින් (03) සමත් වීම;

හා

ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සාමර්ථ්‍යයක් / ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යයක් සහ තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය විෂයයට අවම වශයෙන් අධි සම්මාන සාමර්ථ්‍යයක් ද සහිතව මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ) හා ගණිතය ද ඇතුළුව විෂය හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් වීම.

4.25.3. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී භෞතීය විද්‍යා විෂය ධාරාවෙන් විෂයයන් තුනකින් (03) සමත් වීම;

හා

ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සාමර්ථ්‍යයක් / ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යයක් සහ තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණය විෂයයට අවම වශයෙන් අධි සම්මාන සාමර්ථ්‍යයක් ද සහිතව මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ) හා ගණිතය ද ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් වීම.

4.25.4. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ජීව විද්‍යා විෂයධාරාවෙන් විෂය තුනකින් (03) සමත් වීම;

හා

ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සාමර්ථ්‍යයක් / ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යයක් සහ තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ විෂයයට අවම වශයෙන් අධි සම්මාන සාමර්ථ්‍යයක් ද සහිතව මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ) හා ගණිතය ද ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් වීම.

4.25.5. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී කලා, වාණිජ, තාක්ෂණ හා වෙනත් විෂයධාරාවන් යටතේ විෂයයන් තුනකින් (03) සමත් වීම;

හා

ඉංග්‍රීසි භාෂාව විෂයයට සම්මාන සාමර්ථ්‍යයක්/ ඉංග්‍රීසි සාහිත්‍යය විෂයයට සාමාන්‍ය සාමර්ථ්‍යක් සහ තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ විෂයයට විශිෂ්ඨ සම්මාන සාමර්ථ්‍යයක් ද සහිතව මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ) හා ගණිතය ද ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගයෙන් සමත් වීම.

4.25.6. වතු සේවකයින්ගේ දරුවන් සඳහා තොරතුරු සන්නිවේදන තාක්ෂණ පාඨමාලාව පවත්වනුයේ රුවන්පුර ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ දී ය.

**4.25.7. සැළකිය යුතු යි.**

**තෝරා ගැනීමේ ප්‍රමුඛතා අනුපිළිවෙල**

(එක් එක් දිස්ත්‍රික්ක ලබා ගත් Z ලකුණු කුසලතා අගයේ අනුපිළිවෙල අනුව වේ. )

(i) 4.25.1 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන්
(ii) 4.25.2 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන්
(iii) 4.25.3 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන්
(iv) 4.25.4 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන්
(v) 4.25.5 යටතේ සුදුසුකම් සපුරන අයදුම්කරුවන්

**4.30 පාඨමාලා අංකය 30 - දෙවන බස (සිංහල)**

4.30.1. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී සිංහල භාෂාවට සම්මාන සාමර්ථ්‍යයක් සහිතව විෂයයන් තුනකින් (03) සමත් වීම;

හා

4.30.2. අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී සිංහල භාෂාව, ගණිතය ඇතුළුව විෂය හයකින් (06) සමත් වීම.

**4.30.3.** ***සැළකිය යුතු යි*** -

මෙම පාඨමාලාවට බඳවා ගැනීමේ දී අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී දෙවන බස (දෙමළ) විෂයය හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දෙවන භාෂාව (දෙමළ) උසස් පාඨමාලාව හෝ අ. පො. ස. (සා.පෙළ) විභාගයේදී වෛකල්පිත දෙමළ භාෂාව සමත් සිසුන්ට අනුපිළිවෙලින් ප්‍රමුඛතාවය හිමි වේ.

**4.31 පාඨමාලා අංකය 31 - දෙවන බස (දෙමළ)**

4.31.1. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී දෙමළ භාෂාවට සම්මාන සාමාර්ථයක් ඇතුළුව විෂයයන් තුනකින් (03) සමත් වීම;

*හා*

4.31.2. අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී දෙමළ භාෂාව, ගණිතය ඇතුළුව විෂයයන් හයකින් (06) සමත් වීම.

4.31.3. **සැළකිය යුතු යි -**

මෙම පාඨමාලාවට බඳවා ගැනීමේ දී අ.පො.ස. (සා. පෙළ) විභාගයේ දී දෙවන බස (සිංහල) විෂයය හෝ රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දෙවන භාෂාව (සිංහල) උසස් පාඨමාලාව හෝ අ. පො. ස. (සා. පෙළ) විභාගයේදී වෛකල්පිත සිංහල භාෂාව සමත් සිසුන්ට අනුපිළිවෙලින් ප්‍රමුඛතාවය හිමි වේ.

**4.32 පාඨමාලා අංකය 32 - විශේෂ අධ්‍යාපනය (සිංහල)**
**විශේෂ අධ්‍යාපනය (දෙමළ)**

4.32.1. 2015 වර්ෂයේ දී පවත්වන ලද අ.පො.ස. (උ. පෙළ) විභාගයේ දී ඕනෑ ම විෂයයන් තුනකින් (03) සමත් වීම;

*හා*

4.32.2. මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ), ගණිතය ඇතුළුව විෂයයන් හයකින් (06) අ.පො.ස. (සා. පෙළ) විභාගය සමත් වීම.

4.32.3. **සැළකිය යුතු යි -**

මෙම පාඨමාලාවට තෝරාගනු ලබන අයදුම්කරුවන්ට පාඨමාලාවෙන් පසුව විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත ශ්‍රවණ, දෘෂ්ටි, බුද්ධිමය ඌනතා, ඔටිසම්, ඉගෙනුම් දුෂ්කරතා, බහුවිධ දුබලතා සහිත සිසුන් සඳහා වන ගුරුවරුන් ලෙස පත්වීම් ලබා දෙනු ඇත. එබැවින් ඉහත විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් සිටින ඒකකවල අනිවාර්යයෙන් සේවය කිරීමට එකඟ වන බවට ගිවිසුමකට එළඹීමට කැමති අයදුම්කරුවන් පමණක් මෙම පාඨමාලාවට අයදුම් කළ යුතු වේ. (අධ්‍යාපන ලේකම්ගේ චක්‍රලේඛ අංක 42/2012 හා අධ්‍යාපන ලේකම්ගේ අංක ඊඩී/9/18/8/2/6 හා 2017.05.17 දිනැති ලිපිය අනුව වේ.)

එමෙන් ම මෙම පාඨමාලාවේ සේවාලාභීන් විශේෂ අවශ්‍යතා ඇති සිසුන් වේ. එවැනි සිසුන්ට සහය වීමට ප්‍රමාණවත් මානසික හා ශාරීරික යෝග්‍යතාවක් නොමැති අපේක්ෂකයන් මෙම පාඨමාලාවට ඉල්ලුම් කිරීමෙන් **වැළකිය යුතු වේ.**

**විශේෂ අවධානය පිණිසයි-**

පහත සඳහන් කරුණු 2018 වර්ෂයේ හෝ ඊට පසු වර්ෂවල බඳවා ගැනීම්වලට අදාළව ඔබගේ පූර්ව දැනගැනීම සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

- 2018 වර්ෂයේ දී ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ශිල්ප කලා පාඨමාලාව ශික්ෂණලාභීන් බඳවා නොගැනීමට තීරණය කර ඇති බැවින් එම පාඨමාලාව *ගැසට් නිවේදනයෙන්* ඉවත් කිරීමට තීරණය කර ඇත.
- 2018 වසර සඳහා අ. පො. ස. (උ. පෙළ) ප්‍රතිඵල මත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට තොරතුරු සන්නිවේදන තාක්ෂණය පාඨමාලාවට තෝරා ගැනීමේ දී 12 ශ්‍රේණියේ සාමාන්‍ය තොරතුරු තාක්ෂණය (GIT) විභාගය සමත් වීම සළකා බැලීමට යෝජිත ය.

**5.0 පාඨමාලා අංකය, පාඨමාලාවේ නම, මාධ්‍යය අනුව එක් එක් පාඨමාලාව පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය පහතින් දක්වේ. :**

කරුණාකර මේ වගුව හොඳින් පරීක්ෂා කරන්න. සම්මුඛ පරීක්ෂණ සඳහා එක් එක් පාඨමාලාවට අදාළ පරිගණක ලේඛන සකස් කිරීමේ දී ඔබේ ඉල්ලුම් පත්‍රය පරිගණක ගත කරන්නේ පාඨමාලා අංකය අනුව ය. නිවැරදි තොරතුරු සටහන් නොකළ ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම් පත්‍රය අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන විද්‍යාපීඨ ශාඛාවට ඉදිරිපත් කළ පසු කිසිදු සංශෝධනයක් කිරීමට ඉඩ දෙනු නො ලැබේ. කෙසේ වෙතත් ඕනෑ ම පාඨමාලාවක් විද්‍යාපීඨ තුළ යෝග්‍ය පරිදි ස්ථානගත කිරීම පිළිබඳ අවසන් තීරණ අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලය/ අධ්‍යාපන ලේකම් සතු වේ.

i. තීරුව - පාඨමාලා අංකය

ii. තීරුව - පාඨමාලාවේ නම

iii. තීරුව - සිංහල මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ

iv. තීරුව - දෙමළ මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ

v. තීරුව - ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ

| පාඨමාලා අංකය | පාඨමාලාවේ නම | මාධ්‍ය අනුව එක් එක් පාඨමාලාව පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | | |
|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| i | ii | iii | iv | v |
| 01 | ප්‍රාථමික අධ්‍යාපනය | ඌව | වව්නියාව | - |
| | | නිල්වලා | ශ්‍රී පාද | - |
| | | මහවැලි | අඩ්ඩාලච්චේන | - |
| | | සාරිපුත්ත (දඹදෙණිය) | මඩකලපුව | - |
| | | ශ්‍රී පාද | යාපනය | - |
| | | පස්දුන්රට | දර්ගා නගර් | - |
| | | පුලතිසිපුර | - | - |
| | | වයඹ | - | - |
| | | රුවන්පුර | - | - |
| | | රුහුණ | - | - |
| | | හාපිටිගම් | - | - |
| | | මහරගම | - | - |
| 02 | විද්‍යාව | නිල්වලා | වව්නියාව | නිල්වලා |
| | | සියනෑ | ශ්‍රී පාද | සියනෑ |
| | | ශ්‍රී පාද | අඩ්ඩාලච්චේන | යාපනය |
| | | - | මඩකලපුව | - |
| | | - | යාපනය | - |
| 03 | ගණිතය | නිල්වලා | වව්නියාව | නිල්වලා |
| | | සියනෑ | ශ්‍රී පාද | සියනෑ |
| | | ශ්‍රී පාද | අඩ්ඩාලච්චේන | යාපනය |
| | | - | යාපනය | - |
| 04 | සමාජීය විද්‍යාව | රුහුණ | ශ්‍රී පාද | - |
| | | ශ්‍රී පාද | මඩකලපුව | - |
| 05 | බුද්ධ ධර්මය | සාරිපුත්ත/ නිට්ටඹුව හා දඹදෙණිය | - | - |
| 06 | හින්දු ධර්මය | - | වව්නියාව | - |
| 07 | ඉස්ලාම් ධර්මය | - | අඩ්ඩාලච්චේන | - |
| 08 | කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය | වයඹ | වව්නියාව | - |
| 09 | පළමු බස (සිංහල) | වයඹ | - | - |
| | | පේරාදෙණිය | - | - |
| 10 | පළමු බස (දෙමළ) | - | ශ්‍රී පාද | - |
| | | - | දර්ගා නගර් | - |
| | | - | පේරාදෙණිය | - |
| 11 | ඉංග්‍රීසි | - | - | මහවැලි |
| | | - | - | පස්දුන්රට |
| | | - | - | යාපනය |
| | | - | - | පේරාදෙණිය |
| 13 | චිත්‍ර | මහවැලි | ශ්‍රී පාද | - |
| | | වයඹ | මඩකලපුව | - |
| | | - | යාපනය | - |
| 14 | නැටුම් (පෙරදිග) | මහවැලි | - | - |
| | | වයඹ | - | - |

| පාඨමාලා අංකය | පාඨමාලාවේ නම | මාධ්‍ය අනුව එක් එක් පාඨමාලාව පැවැත්වෙන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ | | |
|---|---|---|---|---|
| | | සිංහල මාධ්‍යය | දෙමළ මාධ්‍යය | ඉංග්‍රීසි මාධ්‍යය |
| i | ii | iii | iv | v |
| 15 | නැටුම් (භරත) | - | ශ්‍රී පාද | - |
| | | - | යාපනය | - |
| 16 | සංගීතය (පෙරදිග) | මහවැලි | - | - |
| | | වයඹ | - | - |
| 17 | සංගීතය (කර්ණාටක) | - | ශ්‍රී පාද | - |
| | | - | යාපනය | - |
| 18 | බටහිර සංගීතය | - | - | මහරගම |
| 19 | නාට්‍ය හා රංග කලාව | මහවැලි | මඩකලපුව | - |
| | | වයඹ | - | - |
| 20 | ශාරීරික අධ්‍යාපනය | ඌව | වව්නියාව | - |
| | | නිල්වලා | මඩකලපුව | - |
| | | රුහුණු | - | - |
| 21 | ගෘහ ආර්ථික විද්‍යාව | රුහුණ | වව්නියාව | - |
| | | - | දර්ගා නගර් | - |
| 22 | කෘෂි හා ආහාර තාක්ෂණය | පුලතිසිපුර | වව්නියාව | - |
| 23 | තාක්ෂණ අධ්‍යයනය - ශිල්ප කලා | සියනෑ | මඩකලපුව | - |
| 24 | නිර්මාණකරණය හා ඉදිකිරීම් තාක්ෂණවේදය/ නිර්මාණකරණය හා යාන්ත්‍රික තාක්ෂණවේදය/ නිර්මාණකරණය හා විදුලිය හා ඉලෙක්ට්‍රොනික් තාක්ෂණවේදය | සියනෑ | මඩකලපුව | - |
| 25 | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | - | - | රුවන්පුර |
| | | - | - | මහරගම |
| 30 | දෙවන බස (සිංහල) | මහවැලි | - | - |
| | | වයඹ | - | - |
| | | ඌව | - | - |
| 31 | දෙවන බස (දෙමළ) | - | මහවැලි | - |
| | | - | වව්නියාව | - |
| 32 | විශේෂ අධ්‍යාපනය | හාපිටිගම් | අඩ්ඩාලච්චේන | - |
| | | මහරගම | යාපනය | - |

*සැලකිය යුතු යි -*

**දෙමළ මාධ්‍යයෙන් පාඨමාලා පැවැත්වෙන දර්ගා නගර් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය වෙන් කර ඇත්තේ කාන්තාවන් සඳහා පමණි.**

**6.0 2017 වර්ෂය සඳහා ශික්ෂණලාභීන් තෝරා ගැනීමේ පටිපාටිය**

**6.1 තෝරා ගැනීමේ පදනම :**

6.1.1 2020 වර්ෂයේ දී ගුරුභවතුන් විශ්‍රාම යාම නිසා, පාසල් පද්ධතියේ ඇතිවන ගුරු පුරප්පාඩු සංඛ්‍යාව සහ මේ වන විට ද පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව හා දුෂ්කර ප්‍රදේශවල විෂය විවිධත්වය ඇති කිරීමේ අවශ්‍යතාව පිළිබඳව ද සලකා බලා විෂය මට්ටමින් ගුරු අවශ්‍යතාව ගණනය කර එම සංඛ්‍යාව 2017 වර්ෂයේ දී එක් එක් පාඨමාලාවට ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල පවතින ඉඩපහසුකම් ප්‍රමාණය සමඟ ගළපා, බඳවා ගනු ලබන ශික්ෂණලාභීන් සංඛ්‍යාව තීරණය කර ඇත.

නුවරඑළිය, හම්බන්තොට, යාපනය, කිලිනොච්චිය, මන්නාරම, වව්නියාව, මුලතිව්, මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලය, පුත්තලම, අනුරාධපුරය, පොළොන්නරුව, බදුල්ල, මොණරාගල හා රත්නපුර යන දුෂ්කර දිස්ත්‍රික්කයන්හි ප්‍රාථමික අධ්‍යාපනය, විද්‍යාව, ගණිතය හා ඉංග්‍රීසි භාෂාව යන පාඨමාලා සඳහා ඒ ඒ පාඨමාලාවලට බඳවා ගනු ලබන මුළු සංඛ්‍යාවෙන් වැඩි ප්‍රතිශතයක් වෙන් කරනු ලැබේ.

බඳවා ගනු ලබන සංඛ්‍යාව සඳහා බලපානු ලබන ප්‍රධානතම සාධකය වන්නේ විද්‍යාපීඨවල එක් එක් පාඨමාලාව සඳහා පහසුකම් සපයාදිය හැකි ප්‍රමාණය යි.

6.1.1.1 ඒ අනුව 2017 වර්ෂයේ බඳවා ගැනීම පහත සඳහන් පරිදි සිදු කෙරේ.

(i) යම් පාඨමාලාවකට අදාළව බඳවා ගන්නා අයදුම්කරුවන් දිවයිනේ දිස්ත්‍රික්ක විසිපහ ම හෝ අදාළ මාධ්‍යයෙන් විෂයය ක්‍රියාත්මක වන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි දිස්ත්‍රික්ක පදනමින් Z අගය පදනම් කරගෙන ඉහළ ම සුදුසුකම්ලත් අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

(ii) ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට බඳවා ගන්නා අයදුම්කරුවන් සංඛ්‍යාව වැවිලි දිස්ත්‍රික්කවල පදිංචි Z අගය පදනම් කරගනිමින් ඉහළ ම සුදුසුකම් සහිත අයදුම්කරුවන් තෝරා ගනු ලැබේ.

6.1.2 කතෝලික/ ක්‍රිස්තියානි ධර්මය සහ ශාරීරික අධ්‍යාපනය පාඨමාලාවන් හැර අනෙකුත් පාඨමාලා සඳහා බඳවා ගැනීමේ මූලික පදනම වන්නේ 6.1.1.1 හි සඳහන් බඳවා ගැනීමේ පදනමට අදාළව, Z අගය කුසලතා අනුපිළිවෙල ය.

Z ලකුණු කුසලතාව තෝරා ගන්නා පාඨමාලාවල දී අදාළ දිස්ත්‍රික්කයේ එක ම Z අගයක් ලබා ගෙන ඇති සිසුන් කිහිපදෙනෙකු අතුරින් එක් අයෙකු තෝරා ගැනීමට සිදු වන විටක දී / ක්‍රීඩා කුසලතා සඳහා එක ම ලකුණක සිසුන් කිහිපදෙනෙකු අතුරින් එක් අයෙකු තෝරා ගැනීමට සිදු වන විටක දී පළමුවරට අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී ලබා ගත් ප්‍රතිඵල සැලකිල්ලට භාජනය කෙරේ.

ඒ අනුව විශිෂ්ට සාමාර්ථයට ලකුණු 04ක් ද, අධි සම්මාන සාමාර්ථයට ලකුණු 03ක් ද, සම්මාන සාමාර්ථයට ලකුණු 02ක් ද, සාමාන්‍ය සාමාර්ථයට ලකුණු 01ක් ද, බැගින් ලකුණු ප්‍රදානය කොට සමස්ත ලකුණු සංඛ්‍යාව පදනම් කර ගනිමින් තෝරා ගැනීම සිදු කරනු ලැබේ. මෙම ලකුණු ලබා දීම හර විෂයය හයට (06) පමණක් (3.2හි සඳහන් කර ඇති) සීමා කෙරේ. (කාණ්ඩ විෂයයන් හා වෛකල්පිත විෂයයන් මෙයට අයත් නොවේ.)

6.1.3 ශාරීරික අධ්‍යාපනය, නැටුම් (පෙරදිග), නැටුම් (භරත), සංගීතය (පෙරදිග), සංගීතය (කර්ණාටක) සහ බටහිර සංගීතය පාඨමාලාව සඳහා පවත්වන ප්‍රායෝගික පරීක්ෂණයේ දී පාඨමාලාවට බඳවා ගනු ලබන විෂයයට අදාළව විෂය ප්‍රවීණතාව සනාථ කළ යුතු ය.

6.1.4 දිස්ත්‍රික්ක පදනමින් තෝරා ගැනීමේ දී අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොසිටින අවස්ථාවක දී පළාත් කුසලතාව / ජාතික කුසලතාව පිළිවෙලින් සලකා සුදුසුකම්ලාභීන් තෝරා ගැනීම් සිදු කෙරේ.

**6.2 ස්ථිර පදිංචිය නිර්ණය :**

6.2.1 දිස්ත්‍රික්ක පදනමින් බඳවා ගැනීමේ දී අයදුම්කරු අයදුම් කරනු ලබන දිස්ත්‍රික්කය වන්නේ ඔහු / ඇය පළමුවරට අ. පො. ස.(උ. පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය හා ඊට පූර්වාසන්න වසර දෙකෙහි ස්ථිරව පදිංචිව සිටි දිස්ත්‍රික්කය යි.

පළාත් කුසලතාවය සලකා බැලීමේ දී අයදුම්කරු පළමු වරට අ. පො. ස. (උ. පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය හා ඊට පූර්වාසන්න වසර දෙකෙහි ඔහු / ඇය ස්ථිරව පදිංචිව සිටි පළාත අයදුම් කරනු ලබන පළාත සේ සලකනු ලැබේ.

1 බඳවා ගැනීමේ පදනමට අදාළව, අයදුම්කරුවන් විසින් තම ස්ථිර පදිංචිය ඡන්ද හිමි නාමලේඛනවල සහතික කරන ලද උපුටන මගින් සනාථ කළ යුතු වේ.

2 යම් හෙයකින් නියමිත වසර තුනට (03) හෝ ඉන් කිහිපයකට අදාළව, ඡන්ද හිමි නාමලේඛනවල සහතික කරන ලද උපුටන මගින් පදිංචිය සනාථ කිරීමට නොහැකි අවස්ථාවල දී ඡන්දය ලියාපදිංචි කිරීමට නොහැකි

වීමට අදාළ පිළිගත හැකි හේතු ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන පදිංචිය හා චරිතය පිළිබඳ සහතිකයේ (DS-04) 'වෙනත් කරුණු' යටතේ ස්ථිර පදිංචි ප්‍රදේශයේ ග්‍රාම නිලධාරි අත්සනින් සහ ප්‍රාදේශීය ලේකම් අනු අත්සනින් සනාථ කළ යුතු වේ.

3 අයදුම්කරුගේ වයස සම්පූර්ණ නොවීම නිසා ඡන්ද හිමි නාමලේඛනයේ ලියාපදිංචි වීමට නොහැකි වූ අදාළ වර්ෂයන් සඳහා දෙමාපියන්ගේ නම් ඇතුළත් ඡන්ද හිමි නාමලේඛනවල උපුටන මගින් ස්ථිර පදිංචිය සනාථ කළ යුතු වේ.

4 යම් හෙයකින් දෙමාපියන් හැර වෙනත් භාරකරුවකු යටතේ අදාළ කාලසීමාවේ ස්ථිරව පදිංචි වී සිටි අයදුම්කරුවන් එම භාරකාරත්වය අදාළ කාලසීමාව ද සමගින් ග්‍රාම සේවක විසින් නිකුත් කරනු ලබන පදිංචිය හා චරිතය පිළිබඳ සහතිකයේ ( DS- 04) - 'වෙනත් කරුණු' තීරය යටතේ සඳහන් කර සනාථ කළ යුතු වේ. අයදුම්කරුගේ ඡන්දය නොමැති වර්ෂ සඳහා භාරකරුගේ ඡන්ද හිමි නාමලේඛනවල සහතික කළ උපුටන මගින් පදිංචිය සනාථ කළ යුතු වේ.

5 වසර එකකට හෝ දෙකකට අදාළව පමණක් ඡන්දය හිමි නාමලේඛන උපුටන ඉදිරිපත් කරන අවස්ථාවල දී, ඉතිරි වසර සඳහා පිළිගත හැකි වෙනත් ලේඛනවලින් පදිංචිය සනාථ කළ යුතු වේ. (*උදා.* ග්‍රාම නිලධාරි සහතිකය, පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ හැඳුනුම්පතෙහි ලිපිනය )

**6.3 ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට තෝරා ගැනීම :**

6.3.1 බඳවා ගන්නා සංඛ්‍යාවෙන් 75%ක් ඉන්දියානු ද්‍රවිඩ සම්භවය ඇති අයදුම්කරුවන්ගෙන් ද, 25%ක් සිංහල ජන වර්ග අයදුම්කරුවන්ගෙන් ද පුරවනු ලැබේ. (මෙහි දී ඉන්දියානු ද්‍රවිඩ සම්භවය පිළිබඳව ඍජුව හෝ වක්‍රව සනාථ කිරීම අයදුම්කරුවන් හට හැකි විය යුතු වේ.)

6.3.2. වැවිලි දිස්ත්‍රික්කවල පවත්නා පුරප්පාඩුවල ප්‍රමාණාත්මක භාවය අනුව, බඳවා ගන්නා අයදුම්කරුවන් සංඛ්‍යාව එම දිස්ත්‍රික්කවලට වෙන් කෙරේ.

6.3.3. ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට ඉල්ලුම් කළ යුත්තේ නුවරඑළිය, මහනුවර, මාතලේ, බදුල්ල, මොණරාගල, රත්නපුර, කෑගල්ල, කළුතර, මාතර, ගාල්ල, කුරුණෑගල සහ කොළඹ යන වැවිලි දිස්ත්‍රික්කවල පදිංචි **වැවිලි අංශයේ සේවයේ නියුතු** අයගේ දරුවන් පමණි.

6.3.4. මේ වන විට වැවිලි අංශයේ සේවයේ නියුතු අයගේ දරුවන්ට හා මේ වන විටත් වතුවල පදිංචි, වැවිලි අංශයේ වසර 10ක් සේවය කිරීමෙන් පසුව 2006 - 2015 වසර අතරතුර කාලයෙහි විශ්‍රාම ගිය, අසනීප හේතුවෙන් සේවයෙන් ඉවත් වූ හෝ මරණයට පත් වූ අයගේ දරුවන්ට ප්‍රමුඛතාව හිමි වේ.

6.3.5. 6.3.3. යටතේ අයදුම්කරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති වුවහොත් දනට වතු අංශයේ සේවය නොකළ ද 2005 හෝ ඊට පසු වර්ෂවල වතු අංශයේ අවම වශයෙන් වසර 05ක්, 04ක්, 03ක් අඛණ්ඩව සේවය කළ අයගේ දරුවන් පිළිබඳව පිළිවෙළින් සලකා බලනු ලැබේ. (ප්‍රමුඛතාව හිමි වන්නේ 2014, 2013, 2012 ආදී වශයෙන් අනුපිළිවෙළිනි).

6.3.6. යම් දෙමළ මාධ්‍ය පාඨමාලාවකට ඉහත අයදුම්කරුවන් අතුරින් ද සුදුසුකම් ලබන ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් ඉහත දිස්ත්‍රික්කවල පදිංචි වැවිලි අංශයේ සේවය නොකරන එහෙත් ඉන්දියානු ද්‍රවිඩ සම්භවය ඇති සම්භවයක් සහිත අයදුම්කරුවන් පිළිබඳව සලකා බලනු ලැබේ.

6.3.7. ඒ අනුව ද ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති නම් වෙනත් දිස්ත්‍රික්කවල පදිංචි ඉන්දියානු ද්‍රවිඩ සම්භවයක් ඇති දෙමළ මාධ්‍ය අයදුම්කරුවන් පිළිබඳව සලකා බලනු ලැබේ.

6.3.8. සිංහල මාධ්‍ය පාඨමාලාවලට වැවිලි දිස්ත්‍රික්කවල පදිංචි වැවිලි අංශයේ සේවකයන්ගේ දරුවන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති වුවහොත් ඉතිරි පුරප්පාඩු පුරවනු ලබන්නේ ශ්‍රී පාද/ වෙනත් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල එම පාඨමාලාවලට අයදුම්කර ඇති අයදුම්කරුවන් අතරින් ඔවුන්ගේ Z අගය පදනම් කර ගනිමිනි.

6.3.9. සම්මුඛ පරීක්ෂණයේ දී රාජ්‍ය හා ලියාපදිංචි පෞද්ගලික වතු සමාගම්වල සේවකයන්ගේ දරුවන් ඒ බව තහවුරු කිරීම සඳහා පහත සඳහන් ලිපිලේඛන අතරින් තමාට අදාළ ලේඛන ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.

- දැනට වතු අංශයේ සේවයේ නියුතුවන්නන් වැවිලි අංශයේ සේවයේ නියුතුව සිටින බව (අදාළ කාලවකවානුව සහිතව) හා වතුවල ස්ථිර පදිංචිව සිටින බවට වතු අධිකාරි විසින් සහතික කළ ලිපිය.

- වසර දහයක (10) සේවා කාලයකින් පසුව 2006- 2015 කාලය අතරතුර, අසනීප තත්ත්වයක් හේතුවෙන් වතු සේවයෙන් ඉවත් වී/ විශ්‍රාම ගොස් ඇති සේවකයන් හෝ මරණයට පත් වී ඇති සේවකයන්ගේ පවුල්වල සාමාජිකයන් මේ වන විටත් වතුවල ස්ථිරව පදිංචිව සිටින බවට අදාළ පදිංචිය සහ සේවයෙන් ඉවත් වූ/ විශ්‍රාම. ගිය වර්ෂය හා දිනය පැහැදිලිව සනාථ කරමින් වතු අධිකාරි විසින් නිකුත් කළ ලිපිය හා ග්‍රාම සේවක සහතිකය.

- වතු සේවයේ යෙදී සිට 2006 හෝ ඊට පසු වර්ෂයක දී විශ්‍රාම ගොස් ඇති / වතු සේවයෙන් ඉවත් වී ඇති සේවකයන් තමන් පසුගිය වසර පහක් (05) හෝ ඊට වැඩි කාලයක් අඛණ්ඩව සේවයේ නියුතුව සිටි බව සනාථ කරමින් විශ්‍රාම ගිය/වතු සේවයෙන් ඉවත් වූ වර්ෂය හා දිනය පැහැදිලිව සඳහන් වතු අධිකාරී විසින් නිකුත් කළ ලිපිය.

- සේවක අර්ථසාධක අරමුදලට අයකිරීම් සිදු කරන බව ලියාපදිංචි අංක සහිතව සනාථ කරන ලිපිය හෝ වතු පදිංචිය සනාථ කරමින් ග්‍රාම සේවක විසින් ලබා දෙන ග්‍රාම සේවක සහතිකය

6.3.10 අයදුම්කරුවන් පාඨමාලාවෙන් පසුව වතු අංශයේ පාසල්වල අඛණ්ඩව වසර දහයක් (10) සේවය කරන බවට පොරොන්දු වන දිවුරුම් ප්‍රකාශයක් සම්මුඛ පරීක්ෂණයේ දී අනිවාර්යයෙන් ඉදිරිපත් කළ යුතු වේ.

6.4. සැලකිය යුතු යි -

6.4.1. සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ ඉන්දියානු සම්භවයක් ඇති අයදුම්කරුවෙකු නම් ඉන්දියානු සම්භවයට හිමි ප්‍රතිශතය සඳහා සලකා බලනු ලැබේ. එමෙන් ම දෙමළ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ සිංහල අයදුම්කරුවකු නම් සිංහල මාධ්‍ය ප්‍රතිශතය සඳහා සලකා බලනු ලැබේ.

6.4.2. ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ ක්‍රියාත්මක පාඨමාලා අයදුම් කරන වතු සේවක අයදුම්කරුවන් හට සුදුසුකම් අනුව අනිකුත් පාඨමාලා සඳහා ද අයදුම් කල හැකි ය.

**7.0 තෝරා ගැනීමට අදාළ වෙනත් කරුණු :**

7.1. තෝරාගනු ලබන අයදුම්කරුවන් අදාළ පාඨමාලාව සඳහා යෝග්‍යතාවය සනාථ කිරීමට පිළිගත හැකි සාක්ෂි සහ සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනට ඉදිරිපත් කිරීමට සූදානම්ව සිටිය යුතු ය. ඒ ඒ දිස්ත්‍රික්කයෙන් බඳවා ගැනීමට නියමිත සංඛ්‍යාවෙන් **තුන් ගුණයක සංඛ්‍යාවක්** සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. නියමිත දින කිසිදු දැනුම් දීමකින් තොරව සම්මුඛ පරීක්ෂණයට සහභාගි නොවන ඒ ඒ දිස්ත්‍රික්කයේ අයදුම්කරුවන් වෙනුවට අදාළ දිස්ත්‍රික්කයෙන් සුදුසුකම් අනුපිළිවෙලට වෙනත් අයදුම්කරුවන් කැඳවනු ලබන අතර නොපැමිණි අයදුම්කරුවන් පිළිබඳව නැවත සලකා බලනු නො ලැබේ.

7.2 සියලු ම සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණ දිනට ඉදිරිපත් කිරීම අනිවාර්ය වන අතර එදිනට මුල් පිටපත් ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් තෝරා ගනු නො ලැබේ.

7.3 පාඨමාලාවේ අපේක්ෂිත මට්ටමට ළඟා වීමට මෙන් ම ගුරුවෘත්තියට පිවිසීමට අයදුම්කරුවන් වෙත තිබිය යුතු කායික හා මානසික යෝග්‍යතාවය, අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලබා දෙන නිර්ණායකයන් ඔස්සේ පළමු සම්මුඛ පරීක්ෂණයේ දී අදාළ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය විසින් පරීක්ෂා කර බලනු ලැබේ. එහි දී පාඨමාලාව හැදෑරීමට සහ ගුරුවෘත්තියට පිවිසීමට අයදුම්කරු සතු කායික, මානසික යෝග්‍යතාව ප්‍රමාණවත් ද යන්න පිළිබඳව ඔවුන් තම නිර්දේශය ඉදිරිපත් කරනු ලැබේ.

7.4 ඉහත 7.3 ඡේදය අනුව තෝරා ගනු ලබන අයදුම්කරුවන් වෙත ලියාපදිංචි තැපෑලෙන් ඒ බව දැනුම් දෙනු ඇත. අදාළ අධ්‍යාපන විද්‍යාපීඨයේ ලියාපදිංචිය සිදු කරන අවස්ථාවේ දී නැවත වතාවක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ඉදිරිපත් වී ඇති තොරතුරුවල නිරවද්‍යතාව සනාථ කර ගැනීමක් සිදු කෙරේ. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ ලියාපදිංචි වීමට නියමිත දිනයේ සිට රාජකාරී දින දහයක් (10) ඇතුළත ලියාපදිංචි නොවුවහොත් ඇතුළත්වීමේ අවස්ථාව ඔහුට/ ඇයට අහිමි වනු ඇත. ඒ අනුව ඇති වන පුරප්පාඩු බඳවා ගැනීමේ පදනම යටතේ අදාළ කුසලතා අනුපිළිවෙලට පුරවනු ලැබේ.

7.4.1 එබැවින් නියමිත දිනට ලියාපදිංචි නොවන අයදුම්කරුවන් විසින් පසුව කරනු ලබන ඉල්ලීම් පිළිබඳව කිසිසේත් ම සලකා බැලීමට අවස්ථාව නොමැති බව අවධාරණය කෙරේ.

- ඉහත අංක 7.3 හෝ 7.4 යටතේ සම්මුඛ පරීක්ෂණ මණ්ඩල අවස්ථාවල දී නිර්දේශ ලබා දීමට නොහැකි මට්ටමේ යම් සුවිශේෂ ගැටළු තත්ත්වයන් නිරීක්ෂණය වුවහොත් පමණක් විශේෂ කමිටුවකට යොමු කෙරේ. එම වාර්තාව අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලයට/ අධ්‍යාපන ලේකම්ට ඉදිරිපත් කර ලබා ගන්නා තීරණ ක්‍රියාත්මක කරනු ඇත.

7.5 පළමු හා දෙවන සම්මුඛ පරීක්ෂණවලට පෙනී සිටීමෙන් අනතුරුව විද්‍යාපීඨයේ ලියාපදිංචිය සඳහා තෝරාගනු ලබන අයදුම්කරුවන් අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත් වීමට පෙර තම සෞඛ්‍ය තත්ත්වය සනාථ කරනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු වේ.

7.6. යම් පාඨමාලාවකට/ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයකට තෝරාගත් පසු ඒ පාඨමාලාව/ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

7.7. කිසියම් පාඨමාලාවකට ප්‍රමාණවත් ශික්ෂණලාභීන් සංඛ්‍යාවක් යම් විද්‍යාපීඨයක නොමැති අවස්ථාවක අදාළ පාඨමාලාව ක්‍රියාත්මක වන ළඟ ම ඇති විද්‍යාපීඨයකට මාරු කරනු ලැබේ.

7.8. ප්‍රමාණවත් ගුරු අවශ්‍යතාවක් නොපවතින පාඨමාලා අහෝසි කිරීම, බඳවා ගන්නා ශික්ෂණලාභීන් සංඛ්‍යාව තීරණය කිරීම හා එක් එක් පාඨමාලා ආයතන තුළ ස්ථාන ගත කිරීම පිළිබඳ අවසාන තීරණය අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලය / අධ්‍යාපන ලේකම් සතු ය.

**8.0 පාඨමාලා සඳහා අයදුම් කිරීමට හෝ ඇතුළත් වීමට නුසුදුස්සන්**

8.1 දැනටමත් රජයේ හෝ රජයේ ආධාර ලබන උපකෘත පාසල්වල, රජයේ ලියාපදිංචි පිරිවෙන්වල හෝ අනුමත වෙනත් විද්‍යායතනවල ගුරු පත්වීම් ලබා ඇති අය,

8.2 රජයේ පාසලක පත්වීමක් සඳහා තෝරාගනු ලැබ සිටින අය,

8.3 මේ වන විටත් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක පාඨමාලාවක් හදාරමින් සිට හැර ගිය හෝ හදාරමින් සිටින හෝ හදාරා අවසන් කළ අය,

8.4 විශ්වවිද්‍යාලයක/ විශ්වවිද්‍යාල විද්‍යායතනයක/ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක, අ.පො.ස. (උ. පෙළ) සුදුසුකම්වලින් බඳවා ගනු ලබන වෘත්තීය පුහුණු පාඨමාලාවක් / උසස් ඩිප්ලෝමාවක් / උපාධි පාඨමාලාවක් හැදෑරීම සඳහා **"රජයේ නිදහස් අධ්‍යාපන වරප්‍රසාද"** යටතේ අභ්‍යන්තර ශිෂ්‍යයෙකු ලෙස ලියාපදිංචි වී සිටින/ හදාරමින් සිටින හෝ උපාධි පාඨමාලාවක් හදාරා අවසන් කළ අය, (දැනට ඉහත ආයතනයක මෙම ඡේදයේ සඳහන් පාඨමාලාවකට ලියාපදිංචි වී සිටින සිසුන් *ගැසට් නිවේදනය* පළවීමෙන් පසුව ලියාපදිංචිය අවලංගු කර ගත්ත ද ඔවුහු අයදුම් කිරීමට/ ඇතුළත් වීමට සුදුසුකම් නො ලබති). තව ද *ගැසට් නිවේදනය* පළවීමෙන් පසුව / සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් පසුව ද ඉහත ආයතනයක අදාළ පාඨමාලාවක ලියාපදිංචි වී, එය අවලංගු කර ගත්ත ද ඔවුහු ද ඇතුළත් වීමට සුදුසුකම් නො ලබති.

8.5 විනයානුකූල හේතූන් මත හෝ වෙනත් හේතූන් මත ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයකින් ශිෂ්‍ය භාවය අවලංගු කරනු ලැබූ අය,

8.6 විවාහ වී සිටින හෝ විවාහ ගිවිසගනු ලැබූ හෝ දික්කසාද වූ අයදුම්කරුවන්.

**9.0 පාඨමාලාව සඳහා අදාළ කොන්දේසි.**

9.1 පාඨමාලාවක කාල සීමාව අවුරුදු තුනකි. එය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ අවුරුදු දෙකක නේවාසික ආයතනික පුහුණුවකින් ද, පාසලකට අනුයුක්ත ව සිදු කෙරෙන වසරක සීමාවාසී පුහුණුවකින් ද සමන්විත වේ. දෙවන වසර අවසානයේ දී ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන බාහිර අවසාන පරීක්ෂණයට පෙනී සිටීම සඳහා ශික්ෂණලාභියාගේ පැමිණීම 90%ක ට නොඅඩු වීම අනිවාර්ය වේ.

9.2 සෑම ශික්ෂණලාභියෙකු ම පළමු වසරේ සහ දෙවන වසරේ පවත්වනු ලබන අභ්‍යන්තර අඛණ්ඩ ඇගයීම් හා අභ්‍යන්තර පරීක්ෂණවලින් හා ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වන අවසාන බාහිර විභාගයෙන් ද සමත් විය යුතු යි. එමෙන් ම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාඨමාලා හදාරන අය හැර අනෙක් සියලු ම පාඨමාලා හදාරන අය ඉහත විභාගවල දී ඉංග්‍රීසි විෂයයෙන් සමත් විය යුතු ය.

9.3 ශික්ෂණලාභියෙකුට නේවාසිකව අධ්‍යයන කටයුතුවල යෙදෙන වර්ෂ දෙක තුළ දී වර්ෂයකට මාස දහයක් (10) සඳහා මාසයකට රු. 5,000 ක වටිනාකමින් යුත් ආහාරපාන හා නේවාසික පහසුකම් සපයනු ලැබේ. සීමාවාසි වර්ෂය තුළ දී මාස දහයක් (10) සඳහා මාසයකට රු.5,000 බැගින් යුත් දීමනාවක් ගෙවනු ලැබේ. පෞද්ගලික අවශ්‍යතාවලට අදාළ සෙසු වියදම් ශික්ෂණලාභියා විසින් දැරිය යුතු ය.

9.4 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයක ලියාපදිංචි වන අයදුම්කරුවන් පාඨමාලාවට වැයවන මුදල සහ වෙනත් යටිතල පහසුකම් සැපයීම වෙනුවෙන් රු. ලක්ෂ පහක (රු. 5,00,000) ඇප බැඳුම්කරයකට සහ ගිවිසුමකට අත්සන් කළ යුතු ය. අයදුම්කරුවන් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ ලියාපදිංචි වූ දින සිට කැලැන්ඩර දින හැටක් (60) ඇතුළත පාඨමාලාව අත්හරින්නේ නම් ශික්ෂණලාභියා වෙනුවෙන් දරන ලද වියදම රජයට ආපසු ගෙවා ඉවත් විය හැක. අයදුම්කරුවන් ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයේ ලියාපදිංචි වූ දින සිට කැලැන්ඩර දින හැටකින් (60) පසුව ඉවත්වන විට මෙම ඇප බැඳුම්කරයේ සහ ගිවිසුමෙහි සම්පූර්ණ මුදල (රු.5,00,000) රජයට ගෙවිය යුතු වේ. තවද යම් අයදුම්කරුවකු කිසිදු විධිමත් දැනුම් දීමකින් තොරව මාසයකට නොඅඩු කාලයක් පාඨමාලාවේ අධ්‍යයන කටයුතුවලට සහභාගී නොවන්නේ නම් ඔහු / ඇය පාඨමාලාව අතහැරගියාසේ සළකා ඇප බැඳුම්කරයේ හා ගිවිසුමේ සඳහන් මුළු මුදල වන රු. 5,00,000 රජයට අය කර ගැනීමෙන් පසුව පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ.

පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව රජයේ පාසලකට ලබා දෙනු ලබන ගුරුපත්වීම භාර නොගන්නේ නම්, ඇප බැඳුම්කරයේ හා ගිවිසුමේ සඳහන් මුළු මුදල වන රු. 5,00,000 රජයට අය කර ගැනීමෙන් පසුව ඉවත් කරනු ලැබේ. තවද පාඨමාලාව සාර්ථකව සම්පූර්ණ කිරීමෙන් පසුව රජයේ පාසලකට ලබා දෙනු ලබන ගුරුපත්වීම ලබා ගැනීමෙන්

අනතුරුව වසර පහක් (05) රජයට සේවය නොකරන අයෙකු, සේවය කිරීමට වසර පහෙන් ඉතිරිව ඇති කාලයට (මාස වශයෙන් ගණනය කර) අදාළ මුදල ගෙවිය යුතු වේ.

එම මුදල ගණනය වනුයේ $\frac{\text{රු.5,00,000}}{\text{මාස 60}}$ × සම්පූර්ණ කිරීමට ඉතිරිව ඇති මාස ගණන

ලෙසිනි.

9.4.1 සුවිශේෂ වෛද්‍ය හේතූන් මත පාඨමාලා කාලසීමාව තුළ දී එම පාඨමාලාව අත හැරයන්නේ නම් පහත සඳහන් ලිපි ලේඛන හරහා රෝගයේ සැබෑ ස්වරූපය සනාථ කළ යුතු ය.

- රෝගී තත්ත්වය සඳහා ප්‍රතිකාර ලැබීම්වලට අදාළව පිළිගත හැකි වෛද්‍ය වාර්තා.
- තවදුරටත් අධ්‍යයන කටයුතු සිදු කරගෙන යාමට සුදුසු සෞඛ්‍ය තත්ත්වයක් නොමැති බවට රජයේ වෛද්‍යවරයකු විසින් සනාථ කරන ලද ලිපිය.

අදාළ ලේඛන පිළිබඳව සලකා බලමින්, විද්‍යාපීඨයේ කළමනාකරණ කමිටුව විසින් නිරීක්ෂණ හා නිර්දේශ ඉදිරිපත් කිරීමෙන් අනතුරුව, අධ්‍යාපන අමාත්‍යාංශයේ නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක සහ සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් යොමු කරනු ලබන රජයේ රෝහලක වෛද්‍යවරයකුගේ හෝ වෛද්‍ය මණ්ඩලයක නිර්දේශ ලබා ගෙන, ඒ සඳහා අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලයේ / අධ්‍යාපන ලේකම්ගේ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව, අය කිරීමකින් තොරව පාඨමාලාවෙන් ඉවත්වීමට අවසර ලබා දෙනු ලැබේ.

9.4.2. නීත්‍යානුකූලව පාඨමාලාවෙන් ඉවත්වීමකින් තොරව මිස, පාඨමාලාවේ කාලසීමාව තුළ හෝ ස්ථිර ගුරු පත්වීම ලබා දීම දක්වා වන කාලය අතරතුර හෝ විදේශගත වීම සඳහා කිසිදු ශික්ෂණලාභියෙකුට අවසර ලබාදෙනු නො ලැබේ.

9.5 පාඨමාලාව අතරතුර විනයානුකූල හේතු මත හෝ බඳවා ගැනීම් කටයුතු සඳහා ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කිරීම මත හෝ 8.0 පාඨයේ සඳහන් අයදුම් කිරීමට හෝ ඇතුළත් වීමට නුසුදුස්සන් යන ඡේදයට අදාළව සැබෑ තොරතුරු වසන් කිරීම මත හෝ පාඨමාලාවෙන් නෙරපා හැරීමේ දී ගිවිසුම හා ඇප බැඳුම්කරයේ සම්පූර්ණ මුදල (රු. 5,00,000) අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ.

9.6 පාඨමාලාව පැවැත්වෙන කාල සීමාව තුළ දී ශික්ෂණලාභියාට 8.4 ඡේදයේ දැක්වෙන ආකාරයේ පාඨමාලාවක් හැදෑරීමට කිසිසේත් ම අවසර දෙනු නො ලැබේ. එසේ පාඨමාලාවක නිරත වන බව සනාථ වුවහොත් ශික්‍ෂණලාභියා අත්සන් තබන ඇප බැඳුම්කරය සහ ගිවිසුමේ මුළු වටිනාකම (රු. 5,00,000/) අය කර ගෙන පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ.

9.7 පාඨමාලා කාල සීමාව තුළ දී ශික්‍ෂණලාභියා විවාහ ගිවිස ගතහොත් / විවාහ වුවහොත් හෝ විද්‍යාපීඨයේ ලියාපදිංචියට පෙර විවාහ වී ඇති බව/විවාහ ගිවිසගෙන ඇති බව සනාථ වුවහොත් ශිෂ්‍ය භාවය අවලංගු කරනු ලැබේ. විවාහ වී ඇති බව හෙළි වීමෙන් පසුව විවිධ හේතු දක්වමින් පාඨමාලා කාලය තුළ දික්කසාද වන අයට නැවත ශිෂ්‍ය භාවය ලබා දීමක් සිදු නො කෙරේ.

9.8 විශේෂ ප්‍රතිපාදන යටතේ බඳවා ගන්නා පූජ්‍ය / පූජක පක්ෂය ලියාපදිංචි වීමෙන් පසු පාඨමාලාව අතරතුර උපැවිදි වුවහොත් ගිවිසුම හා ඇප බැඳුම්කරය අනුව, සම්පූර්ණ මුදල (රු. 5,00,000/) අය කරගෙන පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ. පාඨමාලාව අවසන් වීමෙන් පසු සෑම ආගමකට ම අයත් පූජ්‍ය/ පූජක පක්ෂය උපැවිදි නොවී අවම වශයෙන් අවුරුදු 05ක් අධ්‍යාපන අමාත්‍යාංශයට සේවය කරන බවට අමාත්‍යාංශය සමග ඇප බැඳුම්කරයකට සහ ගිවිසුමකට එළඹිය යුතු යි. යම් හෙයකින් අදාළ වසර පහ (05) සම්පූර්ණ කිරීමට පෙර උපැවිදි වුවහොත්, ඉතිරි කාලය සඳහා (මාස වශයෙන් ගණනය කර) ඇප බැඳුම්කරය සහ ගිවිසුම අනුව අදාළ මුදල ගණනය කර, එම මුදල රජයට ගෙවිය යුතු වේ.

එම මුදල ගණනය වනුයේ $\frac{\text{රු.5,00,000}}{\text{මාස 60}}$ × සම්පූර්ණ කිරීමට ඉතිරිව ඇති මාස ගණන

ලෙසිනි.

*සැලකිය යුතු යි-*

- මෙහි දී, පරිවාස කාලය තුළ පැවිදි ශික්ෂණලාභියකු උපැවිදි වුවහොත් අදාළ මුදල අය කරගෙන, සේවයෙන් ඉවත් කරනු ලැබේ.

9.9 පාඨමාලා කාලසීමාව තුළ අපේක්ෂිත හැසිරීම, පැමිණීම, උද්යෝගය හා අධ්‍යයන කටයුතුවල ප්‍රගතිය නොපෙන්වන (විෂය සමගාමී කටයුතුද ඇතුළුව) ශික්ෂණලාභියෙකු පුහුණුවෙන් ඉවත් කරනු ලැබේ. එසේ ම ආයතනික පුහුණුවේ ප්‍රථම වර්ෂය තුළ දී කරනු ලබන ඇගයීමේ දී සතුටුදායක මට්ටමකට එළඹීමට අසමත් වුවහොත් පාඨමාලාවෙන් ඉවත් කරනු ලැබේ. මේ පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශයේ අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලයේ/ අධ්‍යාපන ලේකම්ගේ තීරණය අවසාන තීරණය වනු ඇත.

9.10 පාඨමාලා කාලසීමාව තුළ දී ශික්ෂණලාභියාගේ කායික හා මානසික යෝග්‍යතාව සම්බන්ධයෙන් පීඨාධිපතිගෙන් හෝ සීමාවාසී කාලසීමාව තුළ විදුහල්පතිගෙන් පැමිණිලි ලැබේ නම් නැවත සම්මුඛ පරීක්ෂණයකට භාජනය කරනු ලැබේ. එහි වාර්තාව අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලයට/ අධ්‍යාපන ලේකම්ට ඉදිරිපත් කර අවසාන තීරණය ලබා දෙනු ඇත.

9.11 පාඨමාලා කාලසීමාව තුළ දී, විද්‍යාපීඨ විනය නීති - රීති මාලාවට පටහැනි යම් ක්‍රියාවක නිරත වූ බව සනාථ වුවහොත් ඒ සම්බන්ධව විද්‍යාපීඨ විනය මණ්ඩලයේ නිර්දේශ ද අනුව යම් කාලසීමාවකට පංති තහනම් කිරීම / පාඨමාලා කාලය දීර්ඝ කිරීම / පාඨමාලාවෙන් ඉවත් කිරීම/ වෙනත් සුදුසු දඬුවමකට යටත් කිරීමේ බලය අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලය / අධ්‍යාපන ලේකම් සතු ය.

9.12 පාඨමාලාව හදාරනු ලබන කාලසීමාව තුළ අදාළ ශික්ෂණලාභීන්ට කුමන හෝ වෙනත් පාඨමාලාවක් හැදෑරීම සඳහා සතියේ දින/ සති අන්ත දිනවල දී ආයතනයෙන් බැහැර යාමට කිසිසේත් ම අවසර දෙනු නො ලැබේ.

9.13 ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාවක් සහිතව මුල් වසර පහ තුළ ගුරු සේවයේ යෙදී සිටිය දී, යම් හෙයකින් සේවයෙන් ඉවත් වන්නේ නම් හෝ විදේශ ගත වන්නේ නම්, අදාළ ඇප බැඳුම්කරය හා ගිවිසුම අනුව මුළු වටිනාකම වන රුපියල් ලක්ෂ පහෙන් (රු.500,000) ඉතිරිව ඇති කාලය සඳහා අය විය යුතු මුදල (මාස වශයෙන් ගණනය කර) රජයට ගෙවිය යුතු වේ.

එම මුදල ගණනය වනුයේ $\frac{\text{රු.}500,000}{\text{මාස } 60}$ × සම්පූර්ණ කිරීමට ඉතිරිව ඇති මාස ගණන ලෙසිනි.

*සැලකිය යුතු යි-*

- මුල් වර්ෂ පහ තුළ 9.13 ඡේදයේ සඳහන් පරිදි සේවයෙන් ඉවත් වුවහොත් නැවත ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාධාරියකු ලෙස ගුරු වෘත්තියට පිවිසීමට අවස්ථාව ලබා දෙනු නො ලැබේ.

- 9.13 ඡේදයට අදාළව ගුරු පත්වීමක් ලැබීමෙන් පසු පරිවාස කාලය තුළ දී විදේශගත වීමේ දී ගිවිසුම හා ඇප බැඳුම්කරයට අමතරව ආයතන සංග්‍රහයේ නීති-රීති හා රෙගුලාසි වලංගු වේ.

- පරිවාස කාලය අවසන් වීමෙන් පසුව විදේශ ගත වීමට අපේක්ෂා කරන්නේ නම් 9.13 ඡේදයේ සඳහන් පරිදි ඉතිරි මුදල් රජයට ගෙවා සාමාන්‍ය රාජ්‍ය සේවකයකුට හිමි වරප්‍රසාද ලබා ගනිමින් විදේශ ගත වීමට හැකිය. (චක්‍රලේඛ අංක 24/2017)

9.14 පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කරන ශික්ෂණලාභීන්ට ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව ප්‍රදානය කරනු ලැබේ. පාඨමාලාශ්‍රිත වැඩ හා පෞරුෂ වර්ධනය (අනිවාර්යයෙන් ම සහභාගී විය යුතු විෂයය සමගාමී කටයුතු ඇතුළු) පාඨමාලා කාලය තුළ දී අඛණ්ඩ ලෙස අගයනු ලබන අතර, මේ ඇගයීම් ජාතික ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව ප්‍රදානය කිරීම සඳහා කරනු ලබන අවසාන ඇගයීමේ කොටසක් වනු ඇත.

9.15 මෙම පාඨමාලාවන් සාර්ථක ලෙස සම්පූර්ණ කරන අයදුම්කරුවන්ට රජයේ පාසල්වලට ගුරු පත්වීම් ලබා දෙනු ලැබේ. ඔවුන් දිස්ත්‍රික්ක පදනමින් /පළාත් පදනමින් බඳවා ගත්ත ද, ස්ථාන ගත කිරීමේ දී අදාළ දිස්ත්‍රික්කයේ / පළාතේ පුරප්පාඩු නොමැති නම් දිවයිනේ ඕනෑ ම ස්ථානයක සේවය කිරීමට එකඟ විය යුතු ය. ස්ථානගත කිරීමේ අවසන් තීරණය අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලය / අධ්‍යාපන ලේකම් සතුය.

9.15.1 පාඨමාලා සඳහා තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණවලට කැඳවීම් ලබන අයදුම්කරුවන් ඉහත කොන්දේසිවලට එකඟ වන්නේ නම් පමණක් බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණවලට ඉදිරිපත් විය යුතු වේ.

9.15.2 ඉහත කොන්දේසි යටතේ පාඨමාලාව හදාරනු ලබන අයදුම්කරුවන් අනිවාර්යයෙන් ම තමා ඉගෙනුම ලබන විෂයය ඉගැන්වීමෙහි නිරත විය යුතු ය. තව ද ශික්ෂණ විද්‍යා ඩිප්ලෝමාව සම්පූර්ණ කිරීමෙන් අනතුරුව, දිස්ත්‍රික්ක / පළාත් පදනමින් බඳවා ගන්නා අයදුම්කරුවන් තමන් මුල් පත්වීම ලබන දිස්ත්‍රික්කයේ / පළාතේ පත්වීමේ දින සිට අවම වශයෙන් වසර පහක් (05) සේවය කිරීම සේවා කොන්දේසියක් ලෙස සලකා අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම් සමග ඇප බැඳුම්කරයකට සහ ගිවිසුමකට බැඳිය යුතු ය. මෙම වසර පහ (05) තුළ පත්වීම් ලබා දෙන දිස්ත්‍රික්කය/ පළාත කිසිසේත් වෙනස් කරනු නොලැබේ.

9.16 අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පාඨමාලාව සඳහා බඳවා ගනු ලබන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨය, වෛද්‍ය/ පෞද්ගලික හේතු මත වෙනස් කර ගැනීමට යම් ශිෂ්‍යණලාභියකු උත්සාහ දරන්නේ නම් ඔහු හෝ ඇය ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයකට ඇතුළත් කර ගැනීමට සුදුසුකම් නොලබයි.

9.17 බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය ක්‍රියාත්මක කිරීමේ දී ඒ සම්බන්ධව අදාළ නිලධාරීන්ට ශික්ෂණලාභියා විසින් හෝ ඔහුට/ ඇයට සම්බන්ධ වෙන යම් පාර්ශවයක් විසින් හෝ අයුතු බලපෑම් සිදු කිරීම බඳවා ගැනීමට නුසුදුසුකමක් සේ සලකනු ලැබේ.

9.18 <u>සියලු ම අධ්‍යාපන හා සෙසු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනයට (2017.11.24) හෝ ඊට පෙර සම්පූර්ණ කර තිබිය යුතු ය.</u>

**10.0 අයදුම් කිරීම :**

**"අයදුම්පත පිළියෙල කිරීම සඳහා උපදෙස් " තීරුව යටතේ 7.0 හා 7.1 ඡේද යටතේ සඳහන් එක් එක් පාඨමාලාවට දිස්ත්‍රික්ක මට්ටමින් බඳවා ගනු ලබන සංඛ්‍යාව පිළිබඳව ඉතා පැහැදිලි අවබෝධයක් ලබා ගෙන ඒ අනුව අයදුම් කළ යුතු වේ.**

10.1 එක් අයදුම්කරුවෙකුට උපරිම වශයෙන් පාඨමාලා තුනකට (03) අයදුම් කළ හැකිය. එකම පාඨමාලාවකට මාධ්‍ය දෙකකින් අයදුම් කළහොත් එය ද පාඨමාලා දෙකකට (02) අයදුම් කළා සේ සැලකේ. එවැනි අයදුම්කරුවෙකුට තවත් එක් පාඨමාලාවකට පමණක් අයදුම් කළ හැකි ය. ඒ ඒ ආගමේ පැවිදිවරයක් දරන පාර්ශව තම ආගමට අදාළ පාඨමාලාවට පමණක් ඉල්ලුම් කළ යුතු වේ.
*උදා* :- විද්‍යාව පාඨමාලාව සිංහල මාධ්‍යයෙන් සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් යන මාධ්‍ය දෙකෙන් අයදුම් කරන අයදුම්කරුවෙකු පාඨමාලා දෙකක් සඳහා අයදුම් කළා යැයි සැලකේ. එවිට එම අයදුම්කරුට, අයදුම් කළ හැක්කේ තවත් එක් පාඨමාලාවකට පමණි.

10.2 එක් අයදුම්කරුවෙකු විසින් එක් අයදුම්පත්‍රයක් පමණක් ඉදිරිපත් කළ යුතුය. එම අයදුම්පත හැර වෙනත් අයදුම්පත් ඉදිරිපත් කර ඇත්නම් සියලු ම අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

10.3. බුද්ධ ධර්මය, හින්දු ධර්මය, ඉස්ලාම් ධර්මය, කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය, ශාරීරික අධ්‍යාපනය, බටහිර සංගීතය යන පාඨමාලා සඳහා අයදුම් කරන අයදුම්කරුවන් පමණක් තම අයදුම්පත සමඟ එහි සහතික කළ ඡායා පිටපත් දෙකක් (02) පමණක් එක ම කවරයක බහා ඉදිරිපත් කළ යුතු ය.

10.4 අයදුම්පත්‍රය පහත දැක්වෙන උපදෙස් හා ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කළ යුතු ය.

10.5 අයදුම්පත්‍ර **2017.11.24** වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ **ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන), ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

**අයදුම්පත්‍රය බහා එවන කවරයේ ආදර්ශය පහත දැක්වේ :**

| | |
|---|---|
| 2017 ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත්වීම සඳහා අයදුම් පත්‍රය,<br>පළමු මනාපය ලෙස දක්වා ඇති පාඨමාලා අංකය ..................... මාධ්‍යය........................... | |
| | ප්‍රධාන කොමසාරිස් (ගුරු අධ්‍යාපන),<br>ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ශාඛාව,<br>අධ්‍යාපන අමාත්‍යාංශය,<br>ඉසුරුපාය,<br>බත්තරමුල්ල. |

(ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවට හෝ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට අයදුම්පත්‍ර එවීමෙන් වැළකිය යුතු යුතු බව අවධාරණය කෙරේ.)

10.6 <u>සෑම අයදුම්කරුවකු ම සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි ඡායා පිටපතක් අනිවාර්යයෙන් ම තමා ළඟ තබා ගත යුතු වේ.</u> ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට බඳවා ගැනීමේ සම්මුඛ පරීක්ෂණයේ දී ඡායා පිටපත ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වන අතර බඳවා ගැනීම සම්බන්ධයෙන් විමසීමක් හෝ අභියාචනයක් ඉදිරිපත් කරන සෑම අවස්ථාවකදී ම **ලියාපදිංචි තැපැල් කුවිතාන්සිය සහ ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක්** ඉදිරිපත් කළ යුතු ය.

10.7 **විභාග අංකය, වර්ෂය, පාඨමාලා අංකය, පාඨමාලාවේ නම නිවැරදිව ඇතුළත් නොකරන ලද මෙන් ම අසම්පූර්ණ හා අවිධිමත් අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

10.8 යම් පාඨමාලාවකට *ගැසට්* නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් නොමැතිව අයදුම් කිරීමෙන් පසු, ඉන් අයදුම්කරුට සිදු වන අපහසුතාවයන් පිළිබඳව අධ්‍යාපන අමාත්‍යාංශය විසින් කිසිදු වගකීමක් දරනු නො ලැබේ.

10.9 අයදුම්පත්‍ර ලැබුණු බව/ප්‍රතික්ෂේප කළ බව දන්වා එවනු නො ලැබේ. එමෙන් ම අයදුම්කරු විසින් අයදුම්පතක් ඉදිරිපත් කළ පමණින් හෝ සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවූ පමණින් අයදුම්කරු විද්‍යාපීඨ සඳහා ඇතුළත්වීමට සුදුසුකම් නො ලබයි. තව ද ඒ ඒ දිස්ත්‍රික්කයේ ඇති පුරප්පාඩු සහ අවශ්‍යතාවය මත පමණක් බඳවා ගැනීම සිදු කෙරේ. මේ සම්බන්ධයෙන් අවසාන තීරණය අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලය/අධ්‍යාපන ලේකම් සතු වේ.

10.10 විශේෂයෙන් සඳහන් කළ අවස්ථාවල දී හැර අයදුම්පත්‍රයට වෙනත් කිසිදු ලියවිල්ලක් අමුණා නො එවිය යුතු ය.

10.11 අයදුම්කරු විසින් ඉදිරිපත් කරනු ලබන සහතික කූට හෝ වංචනික හෝ සහතිකයක් බවට පසුව හෙළි වුවහොත් අයදුම්කරු පාඨමාලාවෙන්/සේවයෙන් පහ කරනු ලබන අතර, රාජ්‍ය සේවයේ කිසිම පත්වීමක් සඳහා නුසුදුස්සෙකු වනු ඇත.

11.0 *ගැසට්* නිවේදනයේ ඉහත සඳහන් තොරතුරු මත මතු වන ගැටලු හෝ විශේෂ අවස්ථා පිළිබඳව අධ්‍යාපන විද්‍යායතන මණ්ඩලයේ/අධ්‍යාපන ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

12.0 මෙම *ගැසට්* නිවේදනයෙහි සිංහල හා දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වේ.

සුනිල් හෙට්ටිආරච්චි,
ලේකම්,
අධ්‍යාපන අමාත්‍යාංශය.

2017 ඔක්තෝබර් මස 17 වැනි දින

අධ්‍යාපන අමාත්‍යාංශය,

ඉසුරුපාය,

බත්තරමුල්ල.

7.0. 2017 වර්ෂය සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට දිස්ත්‍රික්ක පදනම මත බඳවා ගන්නා අයදුම්කරුවන් සංඛ්‍යාව

**7.0.1.** සිංහල මාධ්‍යය

| පළාත | දිස්ත්‍රික්ක අංකය | පාඨමාලාව / දිස්ත්‍රික්කය | ප්‍රාථමික අධ්‍යාපන | විද්‍යාව | ගණිතය | සාමාජීය විද්‍යාව | බුද්ධ ධර්මය | කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය | පළමුබස (සිංහල) | චිත්‍ර | නැටුම් (පෙරදිග) | සංගීතය (පෙරදිග) | නාට්‍ය හා රංග කලාව | ශාරීරික අධ්‍යාපනය | ගෘහ ආර්ථික විද්‍යාව | කෘෂි හා ආහාර තාක්ෂණය | තාක්ෂණ අධ්‍යාපනය ශිල්ප කලා | නිර්මාණකරණය හා තාක්ෂණවේදය: නිර්මාණකරණය හා ඉදිකිරීම් | නිර්මාණකරණය හා තාක්ෂණවේදය: නිර්මාණකරණය හා යාන්ත්‍රික | නිර්මාණකරණය හා තාක්ෂණවේදය: නිර්මාණකරණය හා විදුලිය හා ඉලෙක්ට්‍රොනික | දෙවන බස (සිංහල) | විශේෂ අධ්‍යාපන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බස්නාහිර | 1 | කොළඹ | 73 | 7 | 5 | 2 | 6 | 3 | 6 | 2 | 3 | 2 | 3 | 12 | 3 | 2 | 1 | 1 | 1 | 1 | 8 | 4 |
| | 2 | ගම්පහ | 63 | 6 | 7 | 2 | 9 | 3 | 7 | 2 | 3 | 6 | 5 | 12 | 3 | 4 | 1 | 1 | 1 | 1 | 15 | 6 |
| | 3 | කළුතර | 35 | 5 | 2 | 2 | 5 | 2 | 4 | 3 | 2 | 2 | 2 | 9 | 5 | 3 | 0 | 1 | 1 | 1 | 6 | 4 |
| මධ්‍යම | 4 | මහනුවර | 35 | 7 | 6 | 2 | 7 | 2 | 7 | 4 | 3 | 3 | 2 | 10 | 3 | 7 | 1 | 0 | 1 | 1 | 8 | 3 |
| | 5 | මාතලේ | 20 | 4 | 2 | 1 | 5 | 1 | 3 | 3 | 1 | 1 | 2 | 6 | 2 | 3 | 1 | 1 | 0 | 1 | 6 | 3 |
| | 6 | නුවරඑළිය | 77 | 1 | 3 | 1 | 1 | 1 | 2 | 1 | 1 | 1 | 1 | 6 | 1 | 1 | 0 | 1 | 1 | 0 | 5 | 2 |
| දකුණ | 7 | ගාල්ල | 54 | 8 | 7 | 2 | 6 | 2 | 5 | 3 | 4 | 2 | 2 | 9 | 4 | 4 | 1 | 1 | 1 | 1 | 9 | 3 |
| | 8 | හම්බන්තොට | 63 | 9 | 9 | 1 | 4 | 1 | 4 | 4 | 2 | 2 | 1 | 10 | 4 | 4 | 1 | 1 | 1 | 1 | 9 | 3 |
| | 9 | මාතර | 42 | 6 | 8 | 1 | 4 | 1 | 4 | 3 | 4 | 2 | 3 | 8 | 3 | 8 | 0 | 0 | 0 | 0 | 4 | 3 |
| උතුර | 10 | යාපනය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | 11 | කිලිනොච්චිය | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 | 0 |
| | 12 | මන්නාරම | 11 | 0 | 0 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 1 |
| | 13 | මුලතිව් | 18 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 3 | 1 |
| | 14 | වව්නියාව | 19 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 2 | 1 |
| නැගෙනහිර | 15 | අම්පාර | 45 | 1 | 3 | 1 | 4 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 4 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 6 | 1 |
| | 16 | මඩකලපුව | 23 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 2 | 0 |
| | 17 | ත්‍රිකුණාමලය | 43 | 1 | 3 | 1 | 2 | 1 | 1 | 0 | 2 | 1 | 0 | 5 | 2 | 1 | 0 | 0 | 0 | 0 | 5 | 1 |
| වයඹ | 18 | කුරුණෑගල | 72 | 12 | 5 | 2 | 9 | 2 | 9 | 5 | 3 | 2 | 3 | 12 | 6 | 8 | 1 | 1 | 1 | 1 | 10 | 6 |
| | 19 | පුත්තලම | 65 | 10 | 5 | 2 | 4 | 4 | 4 | 2 | 4 | 1 | 2 | 9 | 4 | 3 | 1 | 1 | 1 | 1 | 10 | 3 |
| උතුරු මැද | 20 | අනුරාධපුරය | 122 | 11 | 10 | 1 | 6 | 2 | 6 | 3 | 2 | 2 | 2 | 10 | 3 | 3 | 1 | 1 | 1 | 1 | 8 | 5 |
| | 21 | පොළොන්නරුව | 38 | 6 | 5 | 1 | 5 | 1 | 3 | 2 | 3 | 1 | 2 | 8 | 2 | 2 | 1 | 1 | 1 | 1 | 3 | 2 |
| ඌව | 22 | බදුල්ල | 46 | 19 | 6 | 1 | 9 | 1 | 5 | 2 | 1 | 2 | 2 | 7 | 3 | 3 | 1 | 1 | 1 | 1 | 6 | 3 |
| | 23 | මොනරාගල | 47 | 10 | 6 | 1 | 4 | 1 | 4 | 2 | 1 | 2 | 1 | 7 | 2 | 2 | 1 | 1 | 1 | 1 | 9 | 3 |
| සබරගමුව | 24 | කෑගල්ල | 56 | 5 | 6 | 1 | 7 | 2 | 4 | 3 | 2 | 2 | 1 | 9 | 3 | 4 | 1 | 1 | 1 | 1 | 8 | 3 |
| | 25 | රත්නපුර | 58 | 20 | 20 | 2 | 10 | 1 | 7 | 5 | 1 | 2 | 3 | 13 | 3 | 4 | 1 | 1 | 1 | 1 | 6 | 4 |
| | | **මුළු එකතුව** | **1125** | **150** | **120** | **30** | **110** | **35** | **90** | **50** | **45** | **40** | **40** | **170** | **60** | **70** | **15** | **15** | **15** | **15** | **150** | **65** |

7.0. 2017 වර්ෂය සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට දිස්ත්‍රික්ක පදනම මත බඳවා ගන්නා අයදුම්කරුවන් සංඛ්‍යාව

7.0.2 දෙමළ මාධ්‍යය

| පළාත | දිස්ත්‍රික්ක අංකය | දිස්ත්‍රික්කය / පාඨමාලාව | ප්‍රාථමික අධ්‍යාපන | විද්‍යාව | ගණිතය | සාමාජීය විද්‍යාව | හින්දු ධර්මය | කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය | ඉස්ලාම් ධර්මය | පළමුබස (දෙමළ) | චිත්‍ර | සංගීතය (කර්ණාටක) | නැටුම් (භරත) | නාට්‍ය හා රංග කලාව | ශාරීරික අධ්‍යාපනය | ගෘහ ආර්ථික විද්‍යාව | කෘෂි හා ආහාර තාක්ෂණය | තාක්ෂණ අධ්‍යාපනය ශිල්ප කලා | නිර්මාණකරණය හා තාක්ෂණවේදය: නිර්මාණකරණය හා ඉදිකිරීම | නිර්මාණකරණය හා තාක්ෂණවේදය: නිර්මාණකරණය හා යාන්ත්‍රික | නිර්මාණකරණය හා තාක්ෂණවේදය: නිර්මාණකරණය හා විදුලිය හා ඉලෙක්ට්‍රොනික | දෙවන බස (දෙමළ) | විශේෂ අධ්‍යාපන |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| බස්නාහිර | 1 | කොළඹ | 6 | 5 | 4 | 0 | 1 | 1 | 1 | 2 | 1 | 0 | 1 | 1 | 3 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 3 | 1 |
| | 2 | ගම්පහ | 6 | 4 | 4 | 0 | 0 | 0 | 1 | 2 | 1 | 0 | 0 | 0 | 4 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 1 |
| | 3 | කළුතර | 12 | 8 | 4 | 1 | 0 | 1 | 1 | 5 | 1 | 1 | 0 | 0 | 2 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 4 | 1 |
| මධ්‍යම | 4 | මහනුවර | 18 | 8 | 8 | 0 | 1 | 1 | 2 | 6 | 1 | 1 | 1 | 1 | 2 | 2 | 1 | 0 | 0 | 0 | 0 | 5 | 1 |
| | 5 | මාතලේ | 14 | 6 | 6 | 1 | 1 | 1 | 1 | 4 | 1 | 1 | 0 | 1 | 2 | 2 | 0 | 0 | 1 | 1 | 1 | 4 | 1 |
| | 6 | නුවරඑළිය | 6 | 7 | 4 | 1 | 1 | 1 | 1 | 2 | 0 | 0 | 0 | 0 | 1 | 2 | 1 | 0 | 1 | 1 | 1 | 4 | 1 |
| දකුණ | 7 | ගාල්ල | 4 | 2 | 1 | 0 | 1 | 0 | 1 | 2 | 0 | 0 | 0 | 0 | 2 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 7 | 1 |
| | 8 | හම්බන්තොට | 1 | 1 | 1 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 2 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 8 | 1 |
| | 9 | මාතර | 9 | 2 | 1 | 0 | 0 | 1 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 2 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 4 | 1 |
| උතුර | 10 | යාපනය | 24 | 14 | 8 | 3 | 5 | 4 | 1 | 8 | 3 | 2 | 2 | 2 | 6 | 8 | 5 | 2 | 1 | 1 | 1 | 3 | 2 |
| | 11 | කිලිනොච්චිය | 8 | 9 | 4 | 2 | 2 | 2 | 1 | 5 | 1 | 1 | 1 | 1 | 5 | 4 | 3 | 1 | 1 | 1 | 1 | 3 | 2 |
| | 12 | මන්නාරම | 13 | 8 | 4 | 1 | 1 | 3 | 2 | 3 | 1 | 1 | 1 | 1 | 4 | 4 | 2 | 1 | 1 | 1 | 1 | 2 | 1 |
| | 13 | මුලතිව් | 10 | 9 | 4 | 2 | 1 | 2 | 1 | 3 | 1 | 1 | 1 | 1 | 4 | 3 | 1 | 1 | 1 | 1 | 1 | 3 | 1 |
| | 14 | වව්නියාව | 4 | 9 | 5 | 1 | 2 | 1 | 1 | 4 | 1 | 1 | 1 | 1 | 4 | 2 | 2 | 1 | 1 | 1 | 1 | 3 | 1 |
| නැගෙනහිර | 15 | අම්පාර | 15 | 8 | 7 | 1 | 1 | 2 | 2 | 5 | 2 | 1 | 1 | 1 | 4 | 3 | 2 | 1 | 1 | 1 | 1 | 4 | 1 |
| | 16 | මඩකලපුව | 21 | 9 | 7 | 1 | 2 | 1 | 1 | 5 | 3 | 1 | 1 | 1 | 4 | 3 | 2 | 1 | 1 | 1 | 1 | 3 | 2 |
| | 17 | ත්‍රිකුණාමලය | 25 | 9 | 6 | 1 | 2 | 2 | 2 | 5 | 2 | 1 | 1 | 1 | 5 | 3 | 2 | 1 | 1 | 1 | 1 | 3 | 2 |
| වයඹ | 18 | කුරුණෑගල | 27 | 15 | 8 | 1 | 1 | 1 | 2 | 2 | 1 | 0 | 0 | 0 | 3 | 1 | 1 | 1 | 1 | 0 | 1 | 6 | 1 |
| | 19 | පුත්තලම | 9 | 8 | 2 | 1 | 1 | 2 | 2 | 3 | 2 | 0 | 0 | 0 | 2 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 6 | 1 |
| උතුරු මැද | 20 | අනුරාධපුරය | 6 | 1 | 1 | 0 | 0 | 1 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 2 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 2 | 1 |
| | 21 | පොළොන්නරුව | 3 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 0 | 0 | 0 | 0 | 1 | 1 | 0 | 0 | 0 | 0 | 0 | 1 | 1 |
| ඌව | 22 | බදුල්ල | 12 | 2 | 2 | 1 | 2 | 1 | 1 | 5 | 2 | 1 | 1 | 1 | 4 | 1 | 1 | 1 | 0 | 1 | 0 | 2 | 1 |
| | 23 | මොනරාගල | 6 | 4 | 1 | 0 | 1 | 0 | 1 | 4 | 1 | 1 | 1 | 0 | 3 | 1 | 0 | 1 | 1 | 0 | 1 | 2 | 1 |
| සබරගමුව | 24 | කෑගල්ල | 18 | 10 | 8 | 1 | 2 | 1 | 2 | 5 | 2 | 1 | 1 | 1 | 4 | 1 | 2 | 1 | 1 | 1 | 1 | 3 | 1 |
| | 25 | රත්නපුර | 8 | 2 | 9 | 1 | 2 | 1 | 1 | 6 | 2 | 0 | 1 | 1 | 5 | 1 | 2 | 1 | 1 | 1 | 1 | 3 | 2 |
| **මුළු එකතුව** | | | **285** | **161** | **110** | **20** | **30** | **30** | **30** | **90** | **30** | **15** | **15** | **15** | **80** | **50** | **30** | **15** | **15** | **15** | **15** | **90** | **30** |

7.0. 2017 වර්ෂය සඳහා ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට දිස්ත්‍රික්ක පදනම මත බඳවා ගන්නා අයදුම්කරුවන් සංඛ්‍යාව

**7.0.3. ඉංග්‍රීසි මාධ්‍යය**

| පළාත | දිස්ත්‍රික්ක අංකය | පාඨමාලාව / දිස්ත්‍රික්කය | ඉංග්‍රීසි | තොරතුරු සන්නිවේදන තාක්ෂණය | විද්‍යාව | ගණිතය | බටහිර සංගීතය |
|---|---|---|---|---|---|---|---|
| බස්නාහිර | 1 | කොළඹ | 22 | 16 | 5 | 5 | 1 |
| | 2 | ගම්පහ | 26 | 11 | 3 | 5 | 1 |
| | 3 | කළුතර | 26 | 11 | 3 | 3 | 0 |
| මධ්‍යම | 4 | මහනුවර | 19 | 9 | 4 | 5 | 1 |
| | 5 | මාතලේ | 12 | 8 | 3 | 3 | 1 |
| | 6 | නුවරඑළිය | 35 | 5 | 3 | 2 | 0 |
| දකුණ | 7 | ගාල්ල | 26 | 9 | 3 | 5 | 1 |
| | 8 | හම්බන්තොට | 36 | 8 | 3 | 3 | 0 |
| | 9 | මාතර | 19 | 11 | 5 | 5 | 1 |
| උතුර | 10 | යාපනය | 26 | 11 | 5 | 4 | 1 |
| | 11 | කිලිනොච්චිය | 14 | 9 | 2 | 2 | 0 |
| | 12 | මන්නාරම | 13 | 8 | 1 | 2 | 0 |
| | 13 | මුලතිව් | 12 | 6 | 2 | 2 | 0 |
| | 14 | වව්නියාව | 11 | 7 | 2 | 2 | 0 |
| නැගෙනහිර | 15 | අම්පාර | 17 | 8 | 2 | 2 | 0 |
| | 16 | මඩකලපුව | 16 | 6 | 2 | 2 | 0 |
| | 17 | ත්‍රිකුණාමලය | 15 | 6 | 3 | 3 | 1 |
| වයඹ | 18 | කුරුණෑගල | 23 | 16 | 6 | 4 | 1 |
| | 19 | පුත්තලම | 23 | 12 | 3 | 3 | 0 |
| උතුරු මැද | 20 | අනුරාධපුරය | 15 | 11 | 4 | 3 | 1 |
| | 21 | පොළොන්නරුව | 14 | 8 | 3 | 2 | 1 |
| ඌව | 22 | බදුල්ල | 18 | 8 | 3 | 2 | 1 |
| | 23 | මොනරාගල | 16 | 8 | 3 | 2 | 1 |
| සබරගමුව | 24 | කෑගල්ල | 27 | 10 | 3 | 4 | 1 |
| | 25 | රත්නපුරය | 19 | 8 | 4 | 5 | 1 |
| මුළු එකතුව | | | **500** | **230** | **80** | **80** | **15** |

**7.1.** 2017 වර්ෂය සඳහා ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට දිස්ත්‍රික්ක පදනම මත බඳවා ගන්නා අයදුම්කරුවන් සංඛ්‍යාව

| පළාත | දිස්ත්‍රික්ක අංකය | පාඨමාලාව / දිස්ත්‍රික්කය | 7.1.1. සිංහල මාධ්‍යය | | | | 7.1.2. දෙමළ මාධ්‍යය | | | | | | | | 7.1.3. ඉංග්‍රීසි මාධ්‍යය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | ප්‍රාථමික අධ්‍යාපන | විද්‍යාව | ගණිතය | සාමාජීය විද්‍යාව | ප්‍රාථමික අධ්‍යාපන | විද්‍යාව | ගණිතය | සමාජීය විද්‍යාව | පළමුබස (දෙමළ) | චිත්‍ර | සංගීතය (කර්නාටක) | නැටුම් (භරත) | තොරතුරු සන්නිවේදන තාක්ෂණය |
| බස්නාහිර | 1 | කොළඹ | 1 | 0 | 0 | 1 | 1 | 0 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 |
| | 3 | කළුතර | 1 | 1 | 1 | 1 | 3 | 1 | 1 | 1 | 2 | 2 | 1 | 1 | 2 |
| මධ්‍යම | 4 | මහනුවර | 1 | 2 | 1 | 1 | 3 | 1 | 1 | 1 | 3 | 2 | 1 | 1 | 2 |
| | 5 | මාතලේ | 1 | 1 | 1 | 1 | 3 | 2 | 2 | 1 | 2 | 1 | 1 | 1 | - |
| | 6 | නුවරඑළිය | 2 | 2 | 2 | 1 | 5 | 2 | 2 | 2 | 5 | 3 | 2 | 2 | 2 |
| දකුණ | 7 | ගාල්ල | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 2 | 1 | 1 | 1 | 2 |
| | 9 | මාතර | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 1 | 2 | 1 | 1 | 1 | 1 |
| වයඹ | 18 | කුරුණෑගල | 1 | 1 | 1 | 1 | 3 | 2 | 1 | 1 | 3 | 1 | 1 | 1 | 3 |
| ඌව | 22 | බදුල්ල | 2 | 1 | 2 | 2 | 5 | 3 | 3 | 2 | 4 | 3 | 2 | 2 | 3 |
| | 23 | මොණරාගල | 1 | 2 | 2 | 2 | 6 | 2 | 2 | 1 | 4 | 2 | 2 | 1 | 1 |
| සබරගමුව | 24 | කෑගල්ල | 1 | 1 | 1 | 1 | 4 | 3 | 2 | 1 | 3 | 1 | 1 | 1 | 2 |
| | 25 | රත්නපුරය | 2 | 2 | 2 | 2 | 5 | 2 | 3 | 2 | 4 | 2 | 1 | 2 | 1 |
| මුළු එකතුව | | | **15** | **15** | **15** | **15** | **40** | **20** | **20** | **15** | **35** | **20** | **15** | **15** | **20** |

**අයදුම්පත පිළියෙල කිරීම සඳහා උපදෙස්**

1.0 *ගැසට්* නිවේදනය හොඳින් කියවා තේරුම් ගන්න. ඔබට සුදුසුකම් ඇති පාඨමාලා තුනකට එක් අයදුම්පත්‍රයක පමණක් අයදුම් කරන්න.

බුද්ධ ධර්මය, හින්දු ධර්මය, ඉස්ලාම් ධර්මය, කතෝලික ධර්මය/ ක්‍රිස්තියානි ධර්මය, ශාරීරික අධ්‍යාපනය, බටහිර සංගීතය යන පාඨමාලා අයදුම් කරන අයදුම්කරුවන් පමණක් තම අයදුම්පත සමග එහි සහතික කළ ඡායා පිටපත් දෙකක් (02) **පමණක්** එක ම කවරයක බහා ඉදිරිපත් කළ යුතු ය. (පාසල් අයදුම්කරුවන් විදුහල්පති මගින් ද පෞද්ගලික අයදුම්කරුවන් සාමදාන විනිශ්චයකරුවකු මගින් ද ඡායා පිටපත් දෙක සහතික කරවා ගත යුතු ය.)

2.0 පහත දැක්වෙන ආදර්ශය අනුව (**Legal**) **F5 ප්‍රමාණයේ (සෙන්ටි මීටර් 21.8 X සෙන්ටි මීටර් 34) සුදු කඩදාසියක අයදුම්පත පිළියෙල කරන්න.** කොටුවක් තුළ තොරතුරු දැක්විය යුතු අවස්ථාවල දී අදාළ කොටුව තුළ "X" ලකුණ යොදන්න.

3.0 අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවීම සඳහා එක් එක් පාඨමාලා වෙනුවෙන් අධ්‍යාපන අමාත්‍යාංශය පිළියෙල කරන පරිගණක නාමාවලි සකස් කරන්නේ 1.0- 11.0 දක්වා තොරතුරු පදනම් කරගෙන බව කරුණාවෙන් සලකන්න. විශේෂයෙන්ම පාඨමාලාවේ අංකය, පාඨමාලාවේ නම, 6.2.1 ඡේදය අනුව දිස්ත්‍රික්කය, අ. පො. ස. (උ. පෙළ) විභාග අංකය, Z අගය නිවැරදි බවට තහවුරු කරගන්න. අංක එක උඩ එක ලිවීමෙන් හෝ නොපැහැදිලිව ලිවීමෙන්, වැරදි ලෙස ලිවීමෙන් ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කිරීමට සිදු වන බව කරුණාවෙන් සලකන්න.

4.0 ශාරීරික අධ්‍යාපනය පාඨමාලාව සඳහා ඉල්ලුම්පත්‍රයේ 13.0 ඡේදය ද, බුද්ධ ධර්මය පාඨමාලාව සඳහා ඉල්ලුම්පත්‍රයේ 14.0 ඡේදය ද, කතෝලික/ ක්‍රිස්තියානි ධර්මය පාඨමාලාව සඳහා ඉල්ලුම්පත්‍රයේ 15.0 ඡේදය ද, හින්දු ධර්මය/ ඉස්ලාම් ධර්මය පාඨමාලාව සඳහා ඉල්ලුම්පත්‍රයේ 16.0 ඡේදය ද, බටහිර සංගීතය සඳහා ඉල්ලුම්පත්‍රයේ 17.0 ඡේදය ද තුළ දක්වා ඇති තොරතුරු සැලකිල්ලට ගැනේ. ඒ නිසා ඒවා නිවැරදිව පිරවිය යුතු යි. ඒවා පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නො ලැබේ.

5.0 6.2.1 ඡේදයට අදාළ වන දිස්ත්‍රික්කවලට නියමිත අංක මෙසේ ය.

| දිස්ත්‍රික්කය | අදාළ අංකය |
|---|---|
| කොළඹ | 01 |
| ගම්පහ | 02 |
| කළුතර | 03 |
| මහනුවර | 04 |
| මාතලේ | 05 |
| නුවරඑළිය | 06 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| හම්බන්තොට | 09 |
| යාපනය | 10 |
| කිලිනොච්චිය | 11 |
| මන්නාරම | 12 |
| වව්නියාව | 13 |
| මුලතිව් | 14 |
| මඩකලපුව | 15 |
| අම්පාර | 16 |
| ත්‍රිකුණාමලය | 17 |
| කුරුණෑගල | 18 |
| පුත්තලම | 19 |
| අනුරාධපුර | 20 |
| පොළොන්නරුව | 21 |
| බදුල්ල | 22 |
| මොනරාගල | 23 |
| රත්නපුර | 24 |
| කෑගල්ල | 25 |

6.0 මාධ්‍යය සඳහා අදාළ සංකේත මෙසේය.
සිංහල - S දෙමළ - T ඉංග්‍රීසි - E

**ආදර්ශ අයදුම්පත්‍රය**

ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවලට ඇතුළත් කර ගැනීම - 2017

**(*ගැසට් නිවේදනයේ* 10.0 ඡේදයෙහි සඳහන් පරිදි අයදුම්කරුවන් විසින් තම අයදුම්පත ඉදිරිපත් කළ යුතු ය. ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන ලෙස සකස් කළ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තෝරා ගැනීමේ සම්මුඛ පරීක්ෂණ සඳහා පරිගණක නාමාවලිය සකස් කරන්නේ 1.0-11.0 දක්වා තොරතුරු ඇසුරෙනි.)**

1.0

| මනාපය | පාඨමාලා අංකය | පාඨමාලාවේ නම | පාඨමාලාවේ මාධ්‍යය (S/T/E) |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |

**1.0 වගුවේ ඔබ විසින් සපයා ඇති තොරතුරු කිසිවිටකත් නැවත සංශෝධනය කරනු නොලැබේ.**

2.0 2.1 මුලකුරු සමග නම ඉංග්‍රීසියෙන් (In Block Letters) : නිදසුන : Mr. PERERA R. C.
Rev./Mr./Miss : - ..............................................................................................................................

2.2 සම්පූර්ණ නම ඉංග්‍රීසියෙන් : (In Block Letters) :- ..............................................................................................

3.0 ස්ථිර පදිංචි ලිපිනය : ඉංග්‍රීසියෙන් (In Block Letters) : - ..............................................................................

දුරකථන අංකය : - ..............................................................................................................................

4.0 *ගැසට්* නිවේදනයේ 6.2.1 ඡේදය අනුව ස්ථිර පදිංචිය සහිත දිස්ත්‍රික්කය : ..................................................................

දිස්ත්‍රික්කයේ අංකය : [ ][ ]

5.0 5.1 උපන් දිනය : වර්ෂය : [ ][ ][ ][ ] මාසය : [ ][ ] දිනය : [ ][ ]

5.2 ජාතික හැඳුනුම්පත් අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ][ ]

6.0 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ [1] ස්ත්‍රී [2]

7.0 ජන වර්ගය :

| සිංහල | ශ්‍රී ලංකා ද්‍රවිඩ | ඉන්දියානු සම්භවයක් සහිත ද්‍රවිඩ | මුස්ලිම් | වෙනත් |
|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 |

8.0 2015 වර්ෂයේ අ.පො.ස (උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල :

8.1 විභාගයට පෙනී සිටි විෂය ධාරාව : භෞතික විද්‍යා/ජීව විද්‍යා/වාණිජ/කලා/තාක්ෂණ/වෙනත්

8.2 විභාගයට පෙනී සිටි මාධ්‍යය :————.

8.3 විභාග අංකය : [ ][ ][ ][ ][ ][ ][ ][ ] විභාගයට පෙනී සිටි වාරය :————.

8.4 Z අගය : [+] [−] [ ] . [ | | | ]

(අදාළ නොවන සංකේතය කපා හරින්න.)

8.5 ප්‍රතිඵල විස්තරය විෂයය අනුව :

| විෂයය | විෂයය අංකය | ලැබූ ශ්‍රේණිය |
|---|---|---|
| 1. .............................. | ..................... | ..................... |
| 2. .............................. | ..................... | ..................... |
| 3. .............................. | ..................... | ..................... |

9. සමත් වූ අ. පො. ස. (සා. පෙළ) පිළිබඳ විස්තර :

| 9.1 | විභාගයට පෙනී සිටි වාරය | 1 වාරය | 2 වාරය | 3 වාරය |
|---|---|---|---|---|
| 9.2 | වර්ෂය | | | |
| 9.3 | විභාග අංකය | | | |
| 9.4 | විභාග මධ්‍යස්ථානයේ අංකය | | | |
| 9.5 | සමත් වූ විෂයයන් හා ශ්‍රේණි | | | |
| | බුද්ධ ධර්මය/හින්දු ධර්මය/ ඉස්ලාම් ධර්මය/කතෝලික ධර්මය/ක්‍රිස්තියානි ධර්මය | | | |
| | මාධ්‍ය භාෂාව (සිංහල / දෙමළ) | | | |
| | ඉංග්‍රීසි භාෂාව | | | |
| | ගණිතය | | | |
| | ඉතිහාසය | | | |
| | විද්‍යාව | | | |
| | I, II, III වන විෂය කාණ්ඩයේ විෂයයන් | | | |
| | I. | | | |
| | II. | | | |
| | III. | | | |
| | | | | |
| | | | | |

10.0 10.1 ඔබ ශ්‍රී පාද ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයට අයදුම්කරන්නේ ද ? ඔව් [1] නැත [2]

10.2 එසේනම් වතු සේවක දරුවෙක් ද නැද්ද යන වග : (අදාළ කොටුවේ X ලකුණෙන් දක්විය යුතුය.)

ඔව් [1] නැත [2]

11.0 ශාරීරික අධ්‍යාපනය සිංහල/ දෙමළ මාධ්‍ය අයදුම්කරුවන් තම අයදුම්පතෙහි 13.0 වගන්තිය සඳහා ඇතුළත් කරනු ලබන ලකුණුවල එකතුව : [ ]

12.0 2015 වර්ෂයට පෙර ඔබ අ. පො. ස. (උ. පෙළ) විභාගයට පෙනී සිට ඇත්නම් ඔබ පෙනී සිටියේ එක් විෂයකට පමණක් වුව ද එක් එක් වාරයේ සම්පූර්ණ විස්තර සඳහන් කරන්න.

| | | 1 | 2 |
|---|---|---|---|
| 12.1 | විභාගයට පෙනී සිටි වාරය : | 1 | 2 |
| 12.2 | වර්ෂය : | .............................. | ..................... |
| 12.3 | විභාග අංකය : | .............................. | ..................... |
| 12.4 | Z අගය : | .............................. | ..................... |

12.5 සමත් වූ විෂයයන් හා ශ්‍රේණි :

| (1 වාරය) | | (2 වාරය) | |
|---|---|---|---|
| විෂයය | ශ්‍රේණිය | විෂයය | ශ්‍රේණිය |
| .............................. | ............... | .............................. | ..................... |
| .............................. | ............... | .............................. | ..................... |
| .............................. | ............... | .............................. | ..................... |

13.0 *ගැසට්* නිවේදනයේ 4.20 ඡේදයේ 4.20.3 හා 4.20.4 වගන්තියට අනුව ක්‍රීඩා ප්‍රවීණතාව පිළිබඳ විස්තර (ශාරීරික අධ්‍යාපනය පාඨමාලාවට අයදුම් කරන අය පමණක් පිරවිය යුතුය.)

මෙම කොටස සම්පූර්ණ කිරීමේ දී 4.20.3 හි සියලු වගන්ති කෙරෙහි ඔබගේ අවධානය යොමු කළ යුතු ය. ඔබ ලබා ඇති ඉහළම ක්‍රීඩා සහතික/ නිපුණතා තුනක තොරතුරු පමණක් ඉදිරිපත් කිරීම ප්‍රමාණවත් වේ. ඔබ අ. පො. ස. (සා. පෙළ) විභාගයේ සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන විෂයයට පෙනී සිට සාමර්ථ්‍යයක් ලබා ඇත්නම් 4.20.4 ට අනුව අදාළ ශ්‍රේණියට හිමි ලකුණ ද පහත කොටසෙහි සඳහන් කළ යුතු ය. මුළු ලකුණුවල එකතුව මුල් පිටුවේ 11.0 හි ද ඇතුළත් කළ යුතු ය.

| අනු. අංකය | වර්ෂය | නිකුත් කළ අමාත්‍යාංශය/ ආයතනය/ සංගමය | තරග නියෝජනය කළ මට්ටම (අන්තර් ජාතික/ ජාතික/ පළාත්/ දිස්ත්‍රික්ක/ කලාප) | ඉසව්ව/ ක්‍රීඩාව | ලැබූ ස්ථානය | 4.20.3 ට අදාළව ලකුණු |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |
| අ. පො. ස. (සා. පෙළ) සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපන විෂයයට ලද ශ්‍රේණිය : | | | 4.20.4 ට අනුව නියමිත ලකුණු සංඛ්‍යාව | | | |
| මුළු ලකුණු එකතුව (11.0 හි සඳහන් කරන්න) | | | | | | |

14.0 *ගැසට්* නිවේදනයේ 4.5 වගන්තියේ (අ) අනුව ප්‍රාචීන ප්‍රාරම්භ, බෞද්ධ ධර්මාචාර්ය, පිරිවෙන් අවසාන හා දහම් පාසල් අවසාන විභාග ප්‍රතිඵල පිළිබඳ විස්තර ඇත්නම් ඇතුළත් කරන්න.

| විභාගය | ප්‍රාචීන ප්‍රාරම්භ | බෞද්ධ ධර්මාචාර්ය | පිරිවෙන් අවසාන | දහම් පාසල් අවසාන |
|---|---|---|---|---|
| 14.1 වර්ෂය | | | | |
| 14.2 විභාග අංකය | | | | |
| 14.3 මධ්‍යස්ථාන අංකය | | | | |
| 14.4 විෂය හා ශ්‍රේණි | 1.<br>2.<br>3.<br>4. | 1.<br>2.<br>3.<br>4.<br>5.<br>6. | 1.<br>2.<br>3.<br>4.<br>5.<br>6.<br>7.<br>8.<br>9.<br>10.<br>11. | 1.<br>2.<br>3.<br>4. |

15.0 *ගැසට්* නිවේදනයේ 4.8 ඡේදය අනුව කතෝලික/ ක්‍රිස්තියානි ධර්මය අයදුම්කරුවන් විසින් අදාළ කොටස සම්පූර්ණ කළ යුතු යි.

| පාඨමාලාවේ නම/සහතිකය | හදාරන ලද කාලය | | |
|---|---|---|---|
| | සිට | දක්වා | ලබා ඇති සාමර්ථ්‍යය |
| 15.1 දේව ධර්මය පිළිබඳ පාඨමාලාව (BTH) | | | |
| 15.2 ජාතික දෙව්සත්හලේ දර්ශනවාදය පිළිබඳ පාඨමාලා සහතිකය. | | | |
| 15.3 ජාතික ධර්මෝපදේශ මධ්‍යස්ථානය මගින් පවත්වනු ලබන කතෝලික දහම් ගුරු සහතිකය. | | | |
| 15.4 දේව ධර්ම නිකේතනය මගින් පවත්වනු ලබන කතෝලික ධර්මය පිළිබඳ ඩිප්ලෝමා සහතිකය. | | | |
| 15.5 පැවිදිවරයෙකු/පැවිදිවරියක වීම සඳහා ආගමික අධ්‍යාපනය සහ පුහුණු පාඨමාලාව (නොවිෂියේට් පාඨමාලාව) සාර්ථකව හදාරා අවසන් කළ බවට පැවිදි නිකේතනයේ ශ්‍රේෂ්ඨාධිපති/ ශ්‍රේෂ්ඨාධිපතිනිය හෝ අදාළ රදගුරුතුමා විසින් නිකුත් කරන ලද සහතිකය. | | | |
| 15.6 ජාතික ක්‍රිස්තියානි මණ්ඩලය මගින් පවත්වනු ලබන ආගමික දැනුම පිළිබඳ ජාතික සහතිකය (ධර්මාචාර්ය) ලබා තිබීම. | | | |
| 15.7 පිළිමතලාව ලංකා දේවධර්ම ශාස්ත්‍රාලය මගින් පවත්වනු ලබන ධර්මවේදී ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම. | | | |
| 15.8 කතෝලික/ ක්‍රිස්තියානි ගුරුවරයෙකු වීමට සුදුසු බවට කතෝලිකයින් සඳහා කතෝලික රදගුරු පදවි සහතිකය/ ක්‍රිස්තියානිකයින් සඳහා ජාතික ක්‍රිස්තියානි මණ්ඩලයේ සහතිකය. | | | |
| 15.9 අ. පො. ස. (උ. පෙළ) ක්‍රිස්තියානි ධර්මය/ක්‍රිස්තියානි ශිෂ්ටාචාරය විෂය සමත්වීම. | | | |

16.0 *ගැසට්* නිවේදනයේ 4.6/4.7 ඡේදය අනුව හින්දු ධර්මය/ ඉස්ලාම් ධර්මය, අයදුම්කරුවන් විසින් පහත කොටස සම්පූර්ණ කළ යුතු යි.

| පාඨමාලාවේ නම | කාලසීමාව | සහතිකය වලංගු දිනය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |

17.0 *ගැසට්* නිවේදනයේ 4.18.1 හා 4.18.2 ඡේද අනුව බටහිර සංගීතය පාඨමාලාව ඉල්ලුම්කරුවන් බටහිර සංගීතය පිළිබඳ නිපුණතාවයට අදාළ තොරතුරු ඇතුළත් කළ යුතු යි.

| වර්ෂය | සහතිකය නිකුත් කළ ආයතනය | ප්‍රවීණතාව/ සමත් පන්තිය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

18.0 අයදුම්කරුගේ ප්‍රකාශය ඃ

(i) මා විසින් *ගැසට් නිවේදනයේ* 10.0 ඡේදයෙහි සඳහන් පරිදි අයදුම්පත ඉදිරිපත් කර ඇති බව මම දනිමි.

(ii) මා විසින් අයදුම් කර ඇති පාඨමාලා සඳහා *ගැසට් නිවේදනයේ* සඳහන් කර ඇති සුදුසුකම් සපුරා ඇති බව සහතික කරමි.

(iii) මා විසින් අයදුම්පතේ සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මවිසින් සපයා ඇති තොරතුරු අසත්‍ය හෝ වැරදි බව හෝ *ගැසට් නිවේදනයට* පටහැනි බව හෙළි වුවහොත් මා තෝරා ගැනීමට නුසුදුස්සකු වන බවත්, තෝරා ගැනීමෙන් පසුව සපයා ඇති තොරතුරු අසත්‍ය හෝ වැරදි බව හෝ *ගැසට් නිවේදනයට* පටහැනි බව හෝ හෙළි වුවහොත් මාගේ තෝරා ගැනීම අවලංගු වන බවත් මම දනිමි.

(iv) මා විශ්වවිද්‍යාල ප්‍රවේශයට අයදුම් කර නොමැති බවත්, විශ්වවිද්‍යාලයක/ විශ්වවිද්‍යාල විද්‍යායතනයක/ වෙනත් උසස් අධ්‍යාපන ආයතනයක ලියාපදිංචි වී නොමැති බවත්/ ඉහත කී ආයතනයක මේ වන විට අදාළ පාඨමාලාවක් හදාරමින් නොසිටින බවත් *ගැසට් නිවේදනයේ* 8.4 ඡේදය උල්ලංඝනය වන පරිදි කටයුතු කර ඇති බව හෝ කරනු ලබන බව සනාථ වුවහොත් පාඨමාලාවෙන් මා ඉවත් කරනු ලැබීමට එකඟ වන බවත් සහතික කරමි.

(v) මා විසින් විද්‍යාපීඨ විනය නීති රීති මාලාවට පටහැනි යම් ක්‍රියාවක නිරත වී ඒ බව සනාථ වුවහොත් ඒ සම්බන්ධව විද්‍යාපීඨ විනය මණ්ඩලය හා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ගනු ලබන ඕනෑ ම දඬුවමකට මා යටත් වන බව ද සහතික කර ප්‍රකාශ කරමි.

__________,

අයදුම්කරුගේ අත්සන.

දිනය :__________.

19.0. *ගැසට් නිවේදනයේ* 6.2.1 ඡේදය අනුව අපේක්ෂකයාගේ පදිංචිය සනාථ කිරීම :

මෙම අයදුම්කරු පළමුවරට අ. පො. ස. (උ. පෙළ) විභාගයට පෙනී සිටි වර්ෂය සහ ඊට පූර්වාසන්න වර්ෂ දෙක අනිවාර්යයෙන් ඇතුළත්ව අවම වශයෙන් වසර තුනක (03) ස්ථිර පදිංචිව සිටි දිස්ත්‍රික්කය .................................... බවත් සහතික කරමි.

__________,

ග්‍රාම නිලධාරීගේ අත්සන

හා නිල මුද්‍රාව.

ග්‍රාම නිලධාරීගේ නම :__________.
ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ නම හා ලිපිනය :__________.
දිනය :__________.

ග්‍රාම නිලධාරී විසින් සහතික කර ඇති තොරතුරු සත්‍ය බව සහතික කරමි.

__________,

ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන හා නිල මුද්‍රාව.

ප්‍රාදේශීය ලේකම්ගේ නම :__________.
ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ නම හා ලිපිනය :__________.

දිනය :__________.

11-170

## රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

## සංවර්ධන නිලධාරි සේවයේ I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2015(I)2017

1.0 2012.09.07 දිනැති හා අංක 1774/31 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නිවේදනය මගින් සංශෝධිත, 2012.02.14 දිනැති හා අංක 1745/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10 ඡේදයේ විධිවිධානයන්ට අනුකූලව සංවර්ධන නිලධාරි සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරින් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගයක්, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2018 පෙබරවාරි මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 සංවර්ධන නිලධාරි සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා මෙම විභාගය කොළඹ, මහනුවර, ගාල්ල, මාතර, යාපනය, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුර, බදුල්ල, රත්නපුර හා කිලිනොච්චිය යන නගරවලදී පැවැත්වේ. අදාළ නගර හා නගර අංක පහතින් දැක්වේ. ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවීම හෝ වෙනත් හේතුන් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයක් අවලංගු කර අයදුම්කරුවන්ගේ දෙවන මනාපය දක්වන ලද නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටුවන ලද විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. තව ද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම් කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත. ඉල්ලුම්පත්‍රයේ අදාළ ශීර්ෂය මෙම නගර හා නගර අංක සඳහන් වගුවට අනුව සම්පූර්ණ කළ යුතු වේ. ඉල්ලුම් කළ නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| නගරය | නගර අංකය |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 05 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| මුලතිව් | 12 |
| ත්‍රිකුණාමලය | 14 |
| මඩකලපුව | 15 |
| කුරුණෑගල | 18 |
| අනුරාධපුරය | 19 |
| බදුල්ල | 21 |
| රත්නපුර | 24 |
| කිලිනොච්චිය | 25 |

3.0 (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීති වලට විභාග අයදුම්කරුවන් යටත් වේ.

(ii) විභාග අයදුම්කරුවන් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

4.0 සුදුසුකම් .- සංවර්ධන නිලධාරි සේවයේ III වන ශ්‍රේණියේ පත්වීමක් ලබා ඇති නිලධරයන් සහ සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය වී නොමැති, එහෙත් අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කර ඇති නිලධරයන් මෙම විභාගය සඳහා ඉදිරිපත් වීමට සුදුසුකම් ලබයි.

***සටහන.-*** මෙම *ගැසට්* නිවේදනයට සමගාමීව පළාත් සංවර්ධන නිලධාරි සේවයේ අයදුම්කරුවන් වෙනුවෙන් වන විධිවිධාන අදළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් නිකුත් කරනු ඇත. ඒ ඒ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සහ මෙම විභාගයට අයදුම් කරන අනෙකුත් ආයතනවල නිලධාරීන්ගේ අයදුම්පත්‍ර වෙන් කර ගැනීමේ පහසුව සඳහා අයදුම්පත්‍රයේ ශීර්ෂයේ අදළ සේවාව හෝ ආයතනය දැක්වීමේ දී සංකේත අංකයක් ඇතුළත් කළ යුතුවේ. ඒ අනුව ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ගේ සංකේත අංකය 10 වේ. එම අංකය අයදුම්පතේ දකුණු පස ඉහළ ඔබ අයත් සේවය යන ස්ථානයේ සටහන් කළ යුතු ය.

4.1 උපලේඛන අංක 01 - පළාත් කේත අංක ලේඛනය පහත පරිදි වේ.

| පළාත | කේත අංකය |
|---|---|
| බස්නාහිර පළාත | 01 |
| මධ්‍යම පළාත | 02 |
| දකුණු පළාත | 03 |
| උතුරු පළාත | 04 |
| නැගෙනහිර පළාත | 05 |
| වයඹ පළාත | 06 |
| උතුරු මැද පළාත | 07 |
| ඌව පළාත | 08 |
| සබරගමුව පළාත | 09 |

5.0 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රයට අනුව අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර, ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර අයදුම්කරුවන් විසින් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2017 දෙසැම්බර් මස 04 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ **විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. අයදුම්පත්, විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතු ය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන

දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදාළ තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

6.0 අයදුම්කරුවන්ගේ අනන්‍යතාව.- අයදුම්කරුවන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් අනන්‍යතාපත්‍ර වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;

ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

ඉහත සඳහන් අනන්‍යතා පත්‍රයක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවෙකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට අයදුම්කරුන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවන ඇත.

7.0 I අයදුම්පත්‍ර.- ආදර්ශ අයදුම්පත්‍රයේ අංක 1.0 සිට 5.0 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද, ඉතිරිය අනෙක් පිටු වලට ද ඇතුළත් වන පරිදි "ඒ4" ප්‍රමාණයේ කඩදාසිවල අයදුම්පත් පිළියෙල කළ යුතුය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කරගත හැකි වුව ද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය. අයදුම්පත මේ සමග ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු අතර, එක් අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණක් වන අතර අයදුම්පතේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්න. තව ද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල ද යන්න හා සියලු තොරතුරු ඇතුළත්කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් නියමිත විභාග ගාස්තුව ගෙවා එහි විස්තර අයදුම්පත්‍රයට ඇතුළත් කොට ලදුපත අලවා ඇත් ද යන්න පිළිබඳවත් අයදුම්කරු විසින් නැවත විමසා බැලිය යුතු අතර, එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

II *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්* .- ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

III පළමුවන වරට මෙම විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ. එතකුදු වුවත් ඉන්පසු වාරවලදී නිලධාරීන් විසින් එක්වර සම්පූර්ණ විභාගයට පෙනී සිටින්නේ නම් හෝ එක් විෂයයකට වඩා පෙනී සිටින්නේ නම් රු. 500/- ක් ද එක් විෂයයක් සඳහා පෙනී සිටින්නේ නම් රු. 250/- ක් ද විභාග ගාස්තු වශයෙන් විභාග කොසමසාරිස් ජනරාල්ගේ ආදයම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල්/උපතැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලදුපත අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය. ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාග ගාස්තුවලට අමතරව කිසිදු අයකිරීමක් සිදුනොකරන බව ද කාරුණිකව දන්වමි. කවර කරුණක් යටතේ වුව ද මෙම ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ. මෙම විභාගය සඳහා ගෙවනු ලබන ගාස්තුව වෙනත් කිසිදු විභාගයකට මාරු කිරීමට ඉඩ දෙනු නොලැබේ. තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාර ගනු නොලැබේ.

8.0 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තු ගෙවා ඊට අදාළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමග විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගතවූ පසුවත් ප්‍රවේශපත්‍ර නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ පිටපත ද විභාග ගාස්තු ගෙවන ලද්දේ නම් ඊට අදාළ ලදුපතෙහි පිටපත ද ඇතැතිව, ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තුමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම් ඔබගේ ඉහත විස්තර සහ විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කරමින්ම විමසා සිටීම ද වඩාත් ඵලදායී වනු ඇත. විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

*සටහන* : අයදුම්කරුවකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

9.0 අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු ය.

10.0 විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන් සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

11.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ලැබූ, පළමු වතාවට විභාගයට පෙනී සිටින නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබා දිය යුතු ය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

12.0 මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම පැවැත්වේ. අදාළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරීන්ට පුළුවන. තරග විභාගයක් නොමැතිව සේවයට බැඳුන නිලධාරීන්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

13.0 තමන් කැමති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවලදී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිය. එතෙකුදු වුවත් සාමාර්ථය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතලිහක් (40%) බැගින් ලබා ගත යුතුවේ. (වැඩි විස්තර සඳහා සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාවේ 10 ඡේදය බලන්න.)

14.0 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා සියලුම නිලධාරීන් විසින් තමන්ගේ අයදුම්පත් රාජ්‍ය භාෂාවෙන් පිළියෙල කළ යුතු අතර ඒවා එම භාෂාවෙන්ම පිරවිය යුතුය.

15.0 විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාගය සමත් වූ අයදුම්කරුවන්ගේ නම් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පළ කිරීමට කටයුතු කරනු ඇත.

16.0 *විභාග පටිපාටිය* : අයදුම්කරුවන් පහත දැක්වෙන විෂයයන් ඇතුළත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.

| | *විෂයය* | *ලකුණු* | *කාලය* | *විෂයය අංකය* |
|---|---|---|---|---|
| 1. | කාර්යාල ක්‍රම | 100 යි | පැය 01 යි | 01 |
| 2. | ගිණුම් ක්‍රම | 100 යි | පැය 01 යි | 02 |
| 3. | පරිගණක පරීක්ෂණය | 100 යි | පැය 02 යි | 03 |

16.1 කාර්යාල ක්‍රම :

රජයේ කාර්යාලවල භාවිත වන කාර්යාල ක්‍රම පිළිබඳව මූලික දැනුම හා එම දැනුම ප්‍රායෝගිකව භාවිත කිරීමේ හැකියාව ද, රාජකාරි ලිපි ලේඛන මැනැවින් අවබෝධ කොට ගෙන පැහැදිලි හා සංක්ෂිප්ත සටහන් මගින් තම අදහස්/නිරීක්ෂණ නිශ්චිත අන්දමින් ඉදිරිපත් කිරීමේ හැකියාව සහ නියෝග අනුව ලිපියක් කෙටුම්පත් කිරීමේ හැකියාව ද පරීක්ෂා කෙරේ.

16.2 ගිණුම් ක්‍රම :

රජයේ කාර්යාලවල භාවිතාවන මූලික ගිණුම් හා මුදල් පාලන පොත්වල කාර්යය පිළිබඳ අවබෝධය හා දැනුම මැනීම අපේක්ෂා කෙරේ.

16.3 පරිගණක පරීක්ෂණය :

(i) තොරතුරු තාක්ෂණය පිළිබඳ මූලික සංකල්ප
(ii) වින්ඩෝස් මෙහෙයුම් පද්ධතිය
(iii) ගොනු කළමනාකරණය
(iv) වදන් සැකසුම

මූලික කුසලතා, තිරයට හුරුවීම, පාඨ සංරක්ෂණය, පාඨ එකේලි කිරීම, අකුරු වර්ග හා උපලක්ෂණ, අනුච්ඡේද, ඡේද, පේළි අතර පරතරය වෙනස් කිරීම, පිම් අනුයෝගය (Tab Setting) පාඨයක් සෙවීම හා ප්‍රතිෂ්ඨාපනය, අක්ෂර හා ව්‍යාකරණ දෝෂ, සමානාර්ථ පද තීරු යෙදීම, පිටුව සැකසීම, ලේඛන මුද්‍රණය, වගු නිර්මාණය, අනුපිළිවෙලට සැකසීම, ගොනු කළමනාකරණය, ලේඛනයක් ලිපින කිහිපයකට යැවීමට සැකසීම, මැක්‍රෝ භාවිතය.

(v) පැතුරුම්පත් :

මූලික කුසලතා, අකෘතිකරණය (Formatting) සංස්කරණය, තීරු හා පරාස, නව ඇතුළත් කිරීම් හා ඉවත් කිරීම්, දත්ත අනුපිළිවෙලට සැකසීම, ප්‍රස්තාර සැකසීම, මුද්‍රණය, @ ශ්‍රිතය (@ Function), මැක්‍රෝ භාවිතය, ගොනු කළමනාකරණය

(vi) දත්ත සමුදාය :

හැඳින්වීමේ මූලික කුසලතා
දත්ත සමුදය නිර්මාණය හා භාවිතය
ආකෘති
සන්ධානගත ආකෘති, උත්පතන ආකෘති (popup forms)
සංවාද හා පණිවුඩ කොටු
විමසුම්
අනුපිළිවෙළට සැකසීම
වාර්තා ලබා ගැනීම
මැක්‍රෝ භාවිතය

(vii) ඉදිරිපත් කිරීම/චිත්‍ර සටහන් :

මූලික කුසලතා, සංස්කරණය, ආකෘතිකරණය
සැලසුම් යෙදීම
අනුරූප, පසුරු සිත්තම් හා ලුස්තාර නිවේශනය
කඳ මාරුව හා සජීවකරණය, ඉදිරිපත් කිරීමේ මෙවලම් භාවිතය,

මාස්ටර් (Master) කදව සැකසීම
කදු මුද්‍රණය හා සටහන්

(viii) අන්තර්ජාලය :

අන්තර්ජාලය හැඳින්වීම, විශ්ව විසිරි ජාලය,
මං සොයන ආකාරය, ව්‍යවහාරික අන්තර්ජාලය

(ix) විද්‍යුත් තැපෑල : (E-Mail)
හැඳින්වීම, මූලික කුසලතා, විද්‍යුත් තැපෑල ලබා ගැනීම, විද්‍යුත් තැපෑල යැවීම,
ඊට ප්‍රතිචාර දැක්වීම, ඇමුණුම් භාවිතය, ලිපිනය හඳුනා ගැනීමට කෙටි නාම භාවිතය,
පණිවුඩ සම්පාදනය

17.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වන බව සැලකිය යුතුය. තව ද, මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2017 ඔක්තෝබර් මස 20 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

ආදර්ශ අයදුම්පත්‍රය

**සංවර්ධන නිලධාරි සේවයේ I වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2015(I)2017**
First Efficiency Bar Examination of Development Officers' Service - 2015(I)2017

(මෙම විභාග නිවේදනය අනුව අයදුම්පත් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබනුයේ ඒකාබද්ධ සේවයට අයත් සංවර්ධන නිලධාරි සේවයේ III වන ශ්‍රේණියේ නිලධාරීන් සහ සංවර්ධන නිලධාරි සේවයට අන්තර්ග්‍රහණය වීම සඳහා මනාපය ප්‍රකාශ කරන ලද නිලධාරීන් පමණි.)

ඔබ අයත්වන සේවය (මෙය සම්පූර්ණ කිරීමට පෙර *ගැසට්* නිවේදනයේ 4.0 ජේදයේ සටහන බලන්න)

(*ගැසට්* නිවේදනයේ 2.0 ඡේදයට අනුව ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය)
(මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

| නගරය | නගර අංකය |
|---|---|
| 1. | |
| 2. | |

ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා : GUNAWARDHANA, H. M. S. K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.0 සේවා ස්ථානය හා ලිපිනය :

2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.3 විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

3.0 ස්ත්‍රී/පුරුෂ භාවය ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.0 ජාතික හැඳුනුම්පත් අංකය :

5.0 ඔබ ඉදිරිපත් වන විෂයය/විෂයයන් :-

| විෂය | විෂයය අංකය |
|---|---|
| | |
| | |
| | |

6.0 දැනට දරන තනතුර :
6.1 තනතුර :————.
6.2 පත්වීම් ලිපියේ අංකය : CS/DOS/ ————.
6.3 සංවර්ධන නිලධාරී සේවයේ III වන ශ්‍රේණියට පත් වූ දිනය/සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කළ දිනය :————.

7.0 7.1 ඔබ විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවටද? :————.
7.2 විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට නොවේ නම් ගෙවන ලද විභාග ගාස්තුව :————.
7.3 තැපැල්/උපතැපැල් කාර්යාලය : :————.
7.4 ලදුපත් අංකය :————.
7.5 දිනය :————.

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.
(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

8.0 අයදුම්කරුගේ සහතිකය :

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත්, මා විභාගයට පෙනී සිටින්නේ .............................................. වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත්/රුපියල් .............................................................. ක විභාග ගාස්තුව ...................... තැපැල් කාර්යාලයට ..........................දින ගෙවා ලබාගත් ලදුපත ඉහත අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන තීරණවලට හා විභාග පනතේ සියලු විධිවිධානයන්ට මම යටත් වන බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

දිනය :————. .................................................................,
අයදුම්කරුගේ අත්සන.

**සටහන :** තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු හෝ ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

*අත්සන සහතික කිරීම*

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ............................................................ මහතා/ මහත්මිය/මෙනෙවිය .......................................................... වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බවත්, ඔහු/ ඇය විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තුවෙන් නිදහස් කිරීමට සුදුසු බවත්/ නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත් සහතික කරමි.

.................................................................,
සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

I ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
II මෙම නිලධාරියා/ නිලධාරිනිය* ඒකාබද්ධ සේවයට අයත් බවත්/ සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කර ඇති බවත්,
III නිලධාරියා/ නිලධාරිනිය* මෙම විභාගයට මීට පෙර පෙනී සිටි/ නොසිටි* බවත්,
IV නිලධාරියා/නිලධාරිනිය* මෙයට පෙර විභාගයට පෙනී සිට ඇති නිසා නියමිත විභාග ගාස්තු ගෙවූ ලදුපත මෙම ඉල්ලුම්පත්‍රයට අලවා ඇති බවත්,
V නිලධාරියා/ නිලධාරිනිය* මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්,

මම සහතික කරමි.

* අනවශ්‍ය වචන කපා හරින්න.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

11-351

---

## රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය

### සංවර්ධන නිලධාරී සේවයේ II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017

1.0 2012.09.07 දිනැති හා අංක 1774/31 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද නිවේදනය මගින් සංශෝධිත, 2012.02.14 දිනැති හා අංක 1745/11 දරන ශ්‍රී ලංකා *ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද සංවර්ධන නිලධාරී සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 10 ඡේදයේ විධිවිධානයන්ට අනුකූලව සංවර්ධන නිලධාරී සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාගයක්, විභාග කොමසාරිස් ජනරාල් විසින් 2018 පෙබරවාරි මාසයේ දී පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

2.0 සංවර්ධන නිලධාරී සේවයේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා මෙම විභාගය කොළඹ, මහනුවර, ගාල්ල, මාතර, යාපනය, මන්නාරම, මුලතිව්, ත්‍රිකුණාමලය, මඩකලපුව, කුරුණෑගල, අනුරාධපුර, බදුල්ල, රත්නපුර හා කිලිනොච්චිය යන නගරවලදී පැවැත්වේ. අදළ නගර හා නගර අංක පහතින් දැක්වේ. ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවීම හෝ වෙනත් හේතූන් මත හෝ කිසියම් විභාග මධ්‍යස්ථානයක් අවලංගු කර අයදුම්කරුවන්ගේ දෙවන මනාපය දක්වන ලද නගරයේ හෝ ආසන්න වෙනත් නගරයක හෝ පිහිටුවන ලද විභාග මධ්‍යස්ථානයක් වෙත යොමු කරනු ලැබේ. තවද යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත. ඉල්ලුම්පත්‍රයේ අදළ ශීර්ෂය මෙම නගර හා නගර අංක සඳහන් වගුවට අනුව සම්පූර්ණ කළ යුතු වේ. ඉල්ලුම් කළ නගරය/නගර පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| නගරය | නගර අංකය |
|---|---|
| කොළඹ | 01 |
| මහනුවර | 05 |
| ගාල්ල | 07 |
| මාතර | 08 |
| යාපනය | 10 |
| මන්නාරම | 11 |
| මුලතිව් | 12 |
| ත්‍රිකුණාමලය | 14 |
| මඩකලපුව | 15 |
| කුරුණෑගල | 18 |
| අනුරාධපුරය | 19 |
| බදුල්ල | 21 |
| රත්නපුර | 24 |
| කිලිනොච්චිය | 25 |

3.0 (i) මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන අතර, විභාගය පැවැත්වීම

සම්බන්ධයෙන් ඔහු විසින් නියම කරන ලද නීතිරීති වලට විභාග අපේක්ෂකයින් යටත් වේ.

(ii) විභාග අයදුම්කරුවන් සඳහා පනවා ඇති නීති *ගැසට්* නිවේදනයේ වෙනම මුද්‍රණය කර ඇත. මෙම නීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔවුනට සිදුවනවා ඇත.

4.0 *සුදුසුකම්* - පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සම්පූර්ණ කර සේවයේ ස්ථිර කරන ලද වසර 10 ක සක්‍රිය හා සතුටුදයක සේවා කාලයක් සපුරා ඇති පහත සඳහන් නිලධාරීන් මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබයි.

i. සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වී ඇති නිලධාරීන්
ii. සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වී නොමැති එහෙත් අන්තර්ග්‍රහණය සඳහා මනාපය පළ කරන ලද නිලධාරීන්

*සටහන* - මෙම *ගැසට්* නිවේදනයට සමගාමීව පළාත් සංවර්ධන නිලධාරී සේවයේ අයදුම්කරුවන් වෙනුවෙන් වන විධිවිධාන අදාළ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව මගින් නිකුත්කරනු ඇත. ඒ ඒ පළාත් රාජ්‍ය සේවයේ නිලධාරීන් සහ මෙම විභාගයට අයදුම්කරන අනෙකුත් ආයතනවල නිලධාරීන්ගේ අයදුම්පත්‍ර වෙන් කර ගැනීමේ පහසුව සඳහා අයදුම්පත්‍රයේ ශීර්ෂයේ අදාළ සේවාව හෝ ආයතනය දැක්වීමේදී සංකේත අංකයක් ඇතුළත් කළ යුතුවේ. ඒ අනුව ඒකාබද්ධ සේවයට අයත් නිලධාරීන්ගේ සංකේත අංකය 10 වේ. එම අංකය අයදුම්පතේ දකුණුපස ඉහළ ඔබ අයත් සේවය යන ස්ථානයේ සටහන් කළ යුතුය.

4.1 උපලේඛන අංක 01 - පළාත් කේත අංක ලේඛනය පහත පරිදි වේ. :-

| *පළාත* | *කේත අංකය* |
|---|---|
| බස්නාහිර පළාත | 01 |
| මධ්‍යම පළාත | 02 |
| දකුණු පළාත | 03 |
| උතුරු පළාත | 04 |
| නැගෙනහිර පළාත | 05 |
| වයඹ පළාත | 06 |
| උතුරු මැද පළාත | 07 |
| ඌව පළාත | 08 |
| සබරගමුව පළාත | 09 |

5.0 අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු අතර, ඒ අනුව පිළියෙල කරන ලද අයදුම්පත්‍ර අපේක්ෂකයින් විසින් සිය දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් 2017 දෙසැම්බර් මස 04 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ **විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ.පෙ. 1503, කොළඹ** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්, විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් කරන ලියුම් කවරයේ වමත් පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් කළ යුතුය. අයදුම්පත් භාර ගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත් හා අදළ තොරතුරු සම්පූර්ණ කර නැති අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

6.0 **අයදුම්කරුවන්ගේ අනන්‍යතාව** - අයදුම්කරුවන් විභාග ශාලාව තුළදී පෙනී සිටින සෑම විෂයයක් පාසාම විභාග ශාලාධිපති සෑහීමකට පත් වන පරිදි ස්වකීය අනන්‍යතාව ඔප්පු කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය

ඉහත සඳහන් අනන්‍යතා පත්‍රයක් ඉදිරිපත් කළ නොහැකි අයදුම්කරුවෙකුගේ අපේක්ෂකත්වය විභාග කොමසාරිස් ජනරාල්ගේ අභිමතය පරිදි අවලංගු කළ හැකිය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

7.0 I අයදුම්පත්‍ර - ආදර්ශ අයදුම්පත්‍රයේ අංක 1.0 සිට 5.0 තෙක් ඡේදයන් පළමුවන පිටුවට ද ඉතිරිය අනෙක් පිටුවලටද ඇතුළත් වන පරිදි "ඒ4" ප්‍රමාණයේ කඩදාසිවල අයදුම්පත්‍රය පිළියෙල කළ යුතුය. අයදුම්පත්‍රය යතුරුලියනය කර පිළියෙල කරගත හැකි වුව ද එය නිවැරදිව හා පැහැදිලිව අයදුම්කරුගේ අත් අකුරින්ම පිරවිය යුතුය. අයදුම්පත මේ සමග ඇති ආකෘතිය පරිදිම සකස් කර ගත යුතු අතර, එක් අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කළ යුත්තේ එක් අයදුම්පතක් පමණක් වන අතර අයදුම්පතේ ඡායා පිටපත් නොඑවන මෙන් දන්වා සිටිනු ලැබේ. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන සහ අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත්‍ර දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. විභාග අයදුම්පත්‍රයේ ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්න. තවද, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූලද යන්න හා සියලු තොරතුරු ඇතුළත්කොට අයදුම්පත්‍රය නිවැරදිව සම්පූර්ණ කර තිබේද යන්න පිළිබඳවත් අයදුම්කරු විසින් නැවත විමසා බැලිය යුතු අතර, එම අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

II **ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම්** - ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මෙම විභාගයේ නීති රීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතර හෝ විභාගයෙන් පසුව හෝ

ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.

III මෙම විභාගය පැවැත්වෙන්නේ පළමු වරට බැවින් විභාගයට පෙනී සිටින නිලධාරීන් විසින් කිසිදු විභාග ගාස්තුවක් ගෙවිය යුතු නොවේ.

8.0 *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් අයදුම්කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කර ඇති නිලධාරීන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග කාල සටහනේ පිටපතක් සමග විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනවා ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2 ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශපත්‍ර නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ පිටපත ඇතැතිව, ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තුමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර, කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවෙකු නම් ඔබගේ ඉහත විස්තර සහ විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ෆැක්ස් මගින් ඔබ වෙත එවීම සඳහා ඔබගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරන ලද ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කරමින්ම විමසා සිටීම ද වඩාත් ඵලදයී වනු ඇත. විභාග යට පෙනී සිටින නිලධාරීන් විසින් විභාග ශාලාධිපති වෙත ඔවුන්ගේ අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍ර ඉදිරිපත් කළ යුතු ය.

***සටහන*** : අයදුම්කරුවකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතු ය.

9.0 අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කරවා ගත යුතු ය.

10.0 විභාගය සඳහා පෙනී සිටින පළමු දිනයේම විභාග ශාලාධිපති වෙත තම අත්සන් සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

11.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධාරීන්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

12.0 මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම පැවැත්වේ. අදළ සේවයට ඇතුළත් වීම සඳහා වූ විභාගයට පෙනී සිටි භාෂාවෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටීමට නිලධාරීන්ට පුළුවන. තරග විභාගයක් නොමැති සේවයට බැඳුන නිලධාරීන්ට ද තමන් අධ්‍යාපනය ලැබූ භාෂා මාධ්‍යයෙන් හෝ රාජ්‍ය භාෂාවකින් හෝ මෙම විභාගයට පෙනී සිටිය හැකිය. විභාගය සඳහා අයදුම් කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

13.0 තමන් කැමති නම් එක් එක් විෂයය සඳහා වෙන් වෙන් වශයෙන් හා එකිනෙකට වෙනස් වූ වාරවලදී පෙනී සිටීමට නිලධාරීන්ට හැකිය. එතෙකුදු වුවත් සාමාර්ථ්‍යය සඳහා එක් එක් විෂයයට නියමිත මුළු ලකුණුවලින් අවම වශයෙන් සියයට හතලිහක් (40%) බැගින් ලබා ගත යුතුවේ. (වැඩි විස්තර සඳහා සංවර්ධන නිලධාරි සේවා ව්‍යවස්ථාවේ 10 ඡේදය බලන්න.)

14.0 රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියේ පරමාර්ථයන් සඳහා සියලුම නිලධාරීන් විසින් තමන්ගේ අයදුම්පත් රාජ්‍ය භාෂාවෙන් පිළියෙල කළ යුතු අතර ඒවා එම භාෂාවෙන්ම පිරවිය යුතු ය.

15.0 විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය වෙත ලබා දෙනු ඇත. විභාගය සමත් වූ අයදුම්කරුවන්ගේ නම් රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ වෙබ් අඩවියෙහි පළ කිරීමට කටයුතු කරනු ඇත.

16.0 *විභාග පරිපාටිය* : අයදුම්කරුවන් පහත දැක්වෙන විෂයයන් ඇතුළත් ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය.

| විෂයය | ලකුණු | කාලය | විෂයය අංකය |
|---|---|---|---|
| 1. ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති | 100 යි | පැය 02 යි | 01 |
| 2. මුදල් රෙගුලාසි හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය | 100 යි | පැය 02 යි | 02 |

16.1 ආයතන සංග්‍රහය හා කාර්ය පටිපාටික රීති

ආයතන සංග්‍රහයේ පරිච්ඡේද VI, VII, VIII, XII, XIII, XIV, XVII, XXIV, XXV, XXVI, XXVII, XXVIII, XXX, XXXIII, XLVII, XLVIII සහ රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති.

16.2 මුදල් රෙගුලාසි හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය

පරිච්ඡේද I, II, III, IV, V හා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලිය

17.0 සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් හෝ නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනය බලාත්මක වන බව

සැළකිය යුතු ය. තව ද, මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත.

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2017 ඔක්තෝබර් මස 20 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි)

**ආදර්ශ අයදුම්පත්‍රය**

***සංවර්ධන නිලධාරි සේවයේ II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2017***

***Second Efficiency Bar Examination of Development Officers' Service - 2017***

ඔබ අයත්වන සේවය (මෙය සම්පූර්ණ කිරීමට පෙර *ගැසට්* නිවේදනයේ 4.0 ඡේදයේ සටහන බලන්න)

(*ගැසට්* නිවේදනයේ 2.0 ඡේදයට අනුව ඔබ විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන නගරය)
(මෙය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.)

| නගරය | නගර අංකය |
|---|---|
| 1. | |
| 2. | |

ඔබ විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(*උදා* : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුවද යොද නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(*උදා* : GUNAWARDHANA, H. M. S. K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.0 සේවා ස්ථානය හා ලිපිනය :

2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.3 විභාග ප්‍රවේශපත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

3.0 ස්ත්‍රී/පුරුෂ භාවය : ස්ත්‍රී - 1
පුරුෂ - 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

4.0 ජාතික හැඳුනුම්පත් අංකය :

5.0 ඔබ ඉදිරිපත් වන විෂයය/විෂයයන් :-

| විෂයය | විෂය අංකය |
|---|---|
| | |
| | |
| | |

6.0 දැනට දරන තනතුර :
6.1 තනතුර :————.
6.2 පත්වීම් ලිපියේ අංකය (සංවර්ධන නිලධාරී සේවයේ අන්තර්ග්‍රහණය වූ නිලධාරීන් පමණි)
CS/DOS/A/ :————.
6.3 සංවර්ධන නිලධාරී සේවයේ III වන ශ්‍රේණියට අන්තර්ග්‍රහණය වූ දිනය :————.
6.4 සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කළ දිනය :————.

7.0 අයදුම්කරුගේ සහතිකය :

ඉහත සඳහන් විස්තර නිවැරදි බවත්, ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට මට හිමිකම් ඇති බවත් විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් ගනු ලබන තීරණවලට හා විභාග පනතේ සියලු විධිවිධානයන්ට මම යටත් වන බවත් මෙයින් ප්‍රකාශ කර සිටිමි.

දිනය :————.

————,
අයදුම්කරුගේ අත්සන.

*සටහන* : තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියෙකු හෝ ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතු ය.

**අත්සන සහතික කිරීම**

මාගේ කාර්යාලයේ නිලධාරියකු/නිලධාරිනියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ........................................................................ මහතා/ මහත්මිය/මෙනෙවිය ........................................................ වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව සහතික කරමි.

....................................................
සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

I ඉහත සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්,
II මෙම නිලධාරියා/ නිලධාරිනිය* ඒකාබද්ධ සේවයට අයත් බවත්/ සංවර්ධන නිලධාරී සේවයට අන්තර්ග්‍රහණය වීමට මනාපය පළ කර ඇති බවත්/අන්තර්ග්‍රහණය වී ඇති බවත්,
III නිලධාරියා/ නිලධාරිනිය* මෙම විභාගයට පෙනී සිටීමට සුදුසු බවත්,

මම සහතික කරමි.

* අනවශ්‍ය වචන කපා හරින්න.

..................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

11-352

**කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය**

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක තනතුරුවලට හා රසායනාගාර සහකාර තනතුරු සඳහා පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017

Open Competitive Examination for the Recruitment to the Trainee Grade of the Posts of Inspectors of Measurement Services Devices and Lab Assistant of the Sri Lanka Technological Service of Department of Measurement Units Standards and Services -2017

මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III වන පන්තියේ මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක තනතුරුවලට හා රසායනාගාර සහකාර තනතුරු සඳහා බඳවා ගැනීමට ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ දැක්වෙන ආදර්ශ ආකෘති පත්‍රය අනුව සකස් කළ ඉල්ලුම් පත්‍ර 2017.11.29 වන දින හෝ ඊට පෙර "විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, පැලවත්ත, බත්තරමුල්ල"යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහල කෙළවරේ මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක තනතුර/ රසායනාගාර සහකාර තනතුර යන්න සඳහන් කළ යුතුය.

01. සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(ii) පත්වීම අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වේ.

(iii) රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියට අදාළව හා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2007 අනුව රාජ්‍ය භාෂා ප්‍රවීණත්වය නියමිත කාලය තුළදී ලබාගත යුතුය.

02. වැටුප් හා දීමනා :
- පුහුණු කිරීමේ ශ්‍රේණිය
1 වන වසර - රු. 15,924.00 ක මාසික දීමනාවක්
2 වන වසර - රු.16,100.00 ක මාසික දීමනාවක්
- තනතුරට අදාල මාසික වැටුප් පරිමාණය

මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක/ රසායනාගාර සහකාර රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 යටතේ MN 3-2016 රු. 31,040 -10x445 - 11 x 660 - 10 x 730 - 10 x 750 - රු. 57,550 වන අතර එම වැටුප හිමිවන්නේ 2020.01.01 දින සිට වේ. මෙම චක්‍රලේඛයේ උපලේඛන II හි විධිවිධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට වැටුප් ගෙවනු ලැබේ.

තනතුරෙහි III වන පන්තියට බඳවාගෙන වසර 03 ක් ගතවීමට පෙර I වන කාර්යක්ෂමතා කඩඉමද, II වන පන්තියට පත්වී වසර 03 ක් ගතවීමට පෙර II වන කාර්යක්ෂමතා කඩඉමද, I වන පන්තියට පත්වී වසර 05 ක් ගතවීමට පෙර III වන කාර්යක්ෂමතා කඩඉමද සමත් විය යුතුය.

03. අධ්‍යාපනික සුදුසුකම් :

(i) මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක තනතුර :
සංයුක්ත ගණිතය, උසස් ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව සහ කෘෂිකර්මය යන විෂයයන් අතුරින් භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය, හෝ උසස් ගණිතය සහිතව විෂයයන් තුනකින් අ.පො.ස. (උ. පෙළ) එකවර සමත් වීම

*හෝ*

පැරණි විෂය නිර්දේශය අනුව භෞතික විද්‍යාව සහ ව්‍යවහාරික ගණිතය හෝ ශුද්ධ ගණිතය යන විෂයයන් එකක් ඇතුළත්ව විෂයන් තුනකින් එකවර සමත් වීම

*සහ*

භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සහිතව එකවර විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබීම

(ii) රසායනාගාර සහකාර තනතුර :
සංයුක්ත ගණිතය, උසස් ගණිතය, භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, ජීව විද්‍යාව සහ කෘෂිකර්මය යන විෂයයන් අතුරින් භෞතික විද්‍යාව සහිතව විෂයයන් තුනකින් අ.පො.ස. (උ. පෙළ) එකවර සමත් වීම

*හෝ*

පැරණි විෂය නිර්දේශය අනුව භෞතික විද්‍යාව ඇතුළත්ව විෂයන් තුනකින් එකවර සමත් වීම.

*සහ*

භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් 06 කින් අ.පො.ස. (සා.පෙළ) විභාගය සමත් වී තිබීම.

04. වෙනත් සුදුසුකම් :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියකු වීම.

(ii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 - 30 ත් අතර විය යුතුය. (ඒ අනුව 1987.11.29 දින හෝ ඊට පසු හා 1999.11.29 දින හෝ ඊට පෙර උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.(දැනට රාජ්‍ය සේවයේ නියුතු අයට උපරිම වයස් සීමාව අදාළ නැත.)

(iii) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් හෙබි අයෙකු විය යුතුය.

05. බඳවා ගැනීමේ ක්‍රමය :

ඉහත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන විවෘත තරග විභාගයකින් සමත් විය යුතුය.

විභාගයේ සාමාර්ථය ලැබීම සඳහා එක් එක් විෂයට 40% ක් හෝ ඊට ඉහළ ලකුණු ප්‍රතිශතයක් ලබාගත යුතුය. එසේ ලකුණු ලබාගන්නා අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවේ අනුපිළිවෙලට අනුව එක් එක් තනතුරට බඳවා ගන්නා ප්‍රමාණය මෙන් දෙගුණයක අපේක්ෂකයන්ගේ ප්‍රතිඵල ලේඛනයක් සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා අධ්‍යක්ෂ, මිනුම් ඒකක ප්‍රමිත හා සේවා දෙපාර්තමේන්තුව වෙත ලබා දෙනු ඇත. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබාදෙනු නොලැබේ. සුදුසුකම් සම්පූර්ණ කර ඇත්තාවූත්, විෂයයන් දෙකින්ම උපරිම මුළු ලකුණු ලබාගත්තාවූත් අපේක්ෂකයන් පුහුණු කිරීමේ පන්තියට ඇතුළත් කෙරේ. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල දන්වා යැවීම හෝ www.results.exams.gov.lk වෙබ්අඩවියේ පළකිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ලැබේ.

විභාගය පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස්ගේ තීරණය අවසන් තීරණය වනු ඇත.

06. මෙම විභාගය පහත සඳහන් නගරවලදී පවත්වනු ඇත. අයදුම්කරුවන් තමන් පදිංචි ලිපිනයට ආසන්නතම නගර තම විභාග මධ්‍යස්ථානය ලෙස තෝරා ගත යුතුය. විභාගයට පෙනී සිටින නගරය හා නගර අංකය පහත සඳහන් වගුවට අනුව ඉල්ලුම් පත්‍රයේ සඳහන් කළ යුතුය. ඉල්ලුම් කළ නගරය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| නගරය | නගර අංකය | නගරය | නගර අංකය |
|---|---|---|---|
| කොළඹ | 01 | වවුනියාව | 13 |
| ගම්පහ | 02 | ත්‍රිකුණාමලය | 14 |
| කළුතර | 03 | මඩකළපුව | 15 |
| මාතලේ | 04 | අම්පාර | 16 |
| මහනුවර | 05 | පුත්තලම | 17 |
| නුවරඑළිය | 06 | කුරුණෑගල | 18 |
| ගාල්ල | 07 | අනුරාධපුරය | 19 |
| මාතර | 08 | පොළොන්නරුව | 20 |
| හම්බන්තොට | 09 | බදුල්ල | 21 |
| යාපනය | 10 | මොණරාගල | 22 |
| මන්නාරම | 11 | කෑගල්ල | 23 |
| මුලතිව් | 12 | රත්නපුර | 24 |
| | | කිළිනොච්චිය | 25 |

යෝජිත නගර සියල්ලෙහිම හෝ වැඩි ගණනක හෝ විභාග මධ්‍යස්ථාන පිහිටුවීම සඳහා ප්‍රමාණවත් අයදුම්කරුවන් සංඛ්‍යාවක් අයදුම්කොට නොමැති නම් විභාගය කොළඹ දී පමණක් පැවැත්වීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් කටයුතු කරනු ඇත.

07. ලිඛිත විභාගය :
විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. අපේක්ෂකයකු විභාග යේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට ඉල්ලුම් කළ මාධ්‍යයෙන්ම පිළිතුරු සැපයිය යුතු ය.

විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

**01. බුද්ධි පරීක්ෂණය**
කාලය පැය 01 කි. මුළු ලකුණු 100 කි. අපේක්ෂකයාගේ තර්කානුකූලතාව, සිතීමේ හැකියාව, විශ්ලේෂණ හැකියාව, තීරණ ගැනීමේ ශක්තිය විනිශ්චය කිරීම සඳහා වූ බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

**02. තාක්ෂණ ප්‍රශ්න පත්‍රය**
කාලය පැය 2 කි. මුළු ලකුණු 100 කි. භෞතික රාශීන් මැනීම සහ ප්‍රායෝගික භෞතික විද්‍යාව පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන ප්‍රශ්න පත්‍රයකි. අ.පො.ස. (උ. පෙළ) මට්ටමේ දැනුමක් මේ සඳහා සෑහේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

08. අයදුම්පත්‍ර හා අයදුම් කරන ආකාරය ඃ

ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 07 දක්වා පළමුවන පිටුවට ද, 08 සිට 11.2 දක්වා දෙවන පිටුවට ද, 11.3 සිට 17 දක්වා තෙවන පිටුවට ද ඉතිරිය හතරවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු අතර අදාළ තොරතුරු තම අත් අකුරින්ම පැහැදිලිව ඇතුළත් කළ යුතු ය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර හා අසම්පූර්ණ ලෙස තොරතුරු ඇතුළත් කර ඇති ඉල්ලුම්පත්‍ර දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ඉල්ලුම්කරුට ප්‍රයෝජනවත් විය හැක. තව ද ඉල්ලුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රයේ සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අවශ්‍ය වේ.අයදුම්කරුගේ මනාපය මත සුදුසුකම් ඇත්නම් තනතුරු දෙක සඳහාම අයදුම් කළ හැක.තනතුරු දෙක සඳහාම පත්වීම සඳහා සුදුසුකම් ලැබුවහොත් ඔබ පත්වීමට ඇති කැමැත්ත අනුව පළමු කැමැත්ත සඳහා අංක 1 ද, දෙවන කැමැත්ත සඳහා අංක 2 ද, වශයෙන් අයදුම්පතේ සඳහන් කළ යුතු ය.අයදුම්පත්‍ර ලැබුණු බව අපේක්ෂකයන් වෙත දන්වනු නොලැබේ.

09. රාජ්‍යසේවයේ/පළාත් රාජ්‍ය සේවයේ/ රාජ්‍ය සංස්ථාවල සේවයේ නියුතු නිලධාරීන්ගේ ඉල්ලුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

10. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත, නියමිත විභාග ගාස්තු ගෙවා,නියමිත දිනට හෝ එදිනට පෙර ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින දෙකක්

හෝ තුනක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම් පත්‍රයේ පිටපත ද, විභාග ගාස්තු ගෙවීමේ දී ලද කුවිතාන්සියේ පිටපත ද, ඉල්ලුම්පත්‍රය තැපෑලෙන් යොමු කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද අතැතිව විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය සඳහන් කරමින් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙන් විමසන ලෙස දන්වන අතර කොළඹින් බැහැර ප්‍රදේශයක අයදුම්කරුවකු නම්, ෆැක්ස් මගින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් ලබා ගැනීමට ඔබගේ ෆැක්ස් අංකයක්ද සමග ඉහත ඔබගේ විස්තර ඇතුළත් ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කරමින් විමසා සිටීම ද වඩාත් ප්‍රතිඵලදායී වනු ඇත.

10.1 අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය.කිසියම් ආයතනයකින් විභාගයට ඉල්ලුම්කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවාද, එසේ නොවන අයදුම්කරුවෙකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/ විශ්‍රාමික නිලධාරියකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු,සාමදාන විනිශ්චයකාරවරයෙකු,දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියකු, රු. 240,360 ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැළකිය යුතු තත්ත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගතයුතුය.

11. එක් තනතුරක් සඳහා විභාග ගාස්තුව රු. 1,000.00 ක් වන අතර, තනතුරු දෙකම සඳහා අයදුම් කරන අයදුම්කරුවන් සඳහා එය රු. 1,300.00 කි. මෙම මුදල විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 යටතේ රජයේ ආදායමට බැරවන පරිදි දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක්, උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින් ලබාගන්නා ලදුපත,එහි එක් දාරයක් මගින් අයදුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන ලෙස ඇලවිය යුතුය.විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලබන අතර, විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ නොකරන අතර, ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

12. ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන විභාගවල දී අපේක්ෂකයන්ගේ අනන්‍යතාව විභාග ශාලාධිපති වෙත තහවුරු කිරීම සඳහා පිළිගනු ලබන්නේ පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් නිකුත් කළ ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණි. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකේ. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

13. මෙම නිවේදනයෙන් ආවරණය නොවන කිසියම් කරුණක් සම්බන්ධයෙන් තීරණ ගැනීමේ බලය මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ සතුවන අතර සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් වේ නම්, එවැනි විටෙක සිංහල නිවේදනය බලාත්මක වේ.

එස්. එන්. අකුරන්තිලක,
මිනුම් ඒකක ප්‍රමිති හා සේවා අධ්‍යක්ෂ(රා.ඉ.).

2017 ඔක්තෝබර් මස දින,
මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව,
මාහේනවත්ත,
පිටිපන,
හෝමාගම.

*ආදර්ශ ඉල්ලුම් පත්‍ර ආකෘතිය*

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා [ ]

***මිනුම් ඒකක ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක තනතුරුවලට හා රසායනාගාර සහකාර තනතුරු සඳහා පුහුණු ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය- 2017***

Open Competitive Examination for the Recruitment to theTrainee Grade of the Posts of Inspectors of Measurement Services Devices and Lab Assistant of the Sri Lanka Technological Service of Department of Measurement Units' Standards and Services -2017

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල -2
දෙමළ -3 [ ] අදාළ අංකය කොටුව තුළ ලියන්න.
ඉංග්‍රීසි- 4

ඉල්ලුම් කරනු ලබන තනතුර :

මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක තනතුර සඳහා අංක 01 ද, රසායනාගාර සහකාර තනතුර සඳහා අංක 02 ද, තනතුරු දෙකම සඳහා අංක 03 ද යොදන්න. (විභාග නිවේදනයේ 8 වන ඡේදය අනුව)

තනතුරු දෙකම සඳහාම අයදුම් කරන්නේනම් තනතුරට පත්වීමට ඇති කැමැත්තේ අනුපිළිවෙල අනුව අදාළ තනතුර ඉදිරියෙන් අංක 1 හෝ 2 සඳහන් කරන්න.

මිනුම් සේවා හා උපක්‍රම පරීක්ෂක තනතුර    රසායනාගාර සහකාර තනතුර

විභාගයට පෙනී සිටීමට අපේක්ෂිත නගරය හා නගර අංකය

නගරය    නගර අංකය

(විභාග නිවේදනයේ 06 වන ඡේදයට අනුව)

---

1. මුලකුරු අගට යොදා මුලකුරු සමග නම ඉංග්‍රීසි කැපිටල් අකුරින්
   උදාහරණ - NIMAL A.B. :————.

2. මුලකුරු වලින් හැඳින්වෙන නම් ඉංග්‍රීසි කැපිටල් අකුරින් :————.

3. සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :————.

4. ස්ථිර ලිපිනය ඉංග්‍රීසි කැපිටල් අකුරින් (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.) :————.

5. ස්ත්‍රී /පුරුෂ භාවය (පුරුෂ - 0,ස්ත්‍රී - 1) :
   අදාළ අංකය කොටුව තුළ ලියන්න.

6. ජාතික හැඳුනුම්පත් අංකය :

7. විවාහක/අවිවාහක බව (විවාහක -1,අවිවාහක -2)
   අදාළ අංකය කොටුව තුළ ලියන්න.

8. ජන වර්ගය (සිංහල-1,දෙමළ-2,ඉන්දියානු දෙමළ-3,මුස්ලිම්-4,වෙනත්-5)

   අදාළ අංකය කොටුව තුළ ලියන්න.

9. (අ) උපන් දිනය :

   වර්ෂය    මාසය    දිනය

   (ආ) ඉල්ලුම්පත් කැඳවීමේ අවසාන දිනට වයස :

   අවුරුදු    මාස    දින

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියකු වන්නේ පෙළපතින් ද? ලියාපදිංචි කිරීමෙන් ද? යන්න සඳහන් කරන්න.(ලියාපදිංචි කිරීමෙන් නම් විස්තර සපයන්න) :————.

11. අධ්‍යාපනික/වෘත්තීය සුදුසුකම්

11.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය ඃ

විභාගය සමත් වූ වර්ෂය :————.

විභාග අංකය :————.

| | *විෂයය* | *ලැබූ සාමාර්ථය* |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |
| 5 | | |
| 6 | | |
| 7 | | |
| 8 | | |
| 9 | | |
| 10 | | |
| 11 | | |
| 12 | | |

11.2 අ.පො.ස (උ.පෙළ) විභාගය ඃ

විභාගය සමත් වූ වර්ෂය :————.

විභාග අංකය :————.

| | *විෂයය* | *ලැබූ සාමාර්ථය* |
|---|---|---|
| 1 | | |
| 2 | | |
| 3 | | |
| 4 | | |

11.3

| | |
|---|---|
| ඔබ සමත් වී ඇති ඉහළම විභාගය | |
| සිංහල | |
| දෙමළ | |
| ඉංග්‍රීසි | |

11.4 වෙනත් අධ්‍යාපනික /වෘත්තීය සුදුසුකම්

| විභාගය | ආයතනය | දිනය |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

12. වර්තමාන රැකියාව සහ ඉහතදී යම් පත්වීමක් දැරුවේ නම්. -

| තනතුර | සිට | දක්වා | වාර්ෂික වැටුප |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |

13. ඔබ රජයේ තනතුරක් දරමින් සිට එයින් පහ කර තිබේද? (එසේනම් විස්තර සපයන්න.) :————.

14. ඔබට විරුද්ධව (දැනටමත් රජයේ සේවයේ නියුක්ත නම්)දෙපාර්තමේන්තු විනයානුකූල පරීක්ෂණ කර තිබේද? :————.

15. ඔබ යම් චෝදනාවක් සම්බන්ධයෙන් උසාවියකින් වරදකරු වී තිබේද ? :————.

16. ඔබ ගැන තොරතුරු විමසා දැන ගත හැකි ඥාතීන් නොවන පුද්ගලයින් දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක

1. ..............................................................
..............................................................
..............................................................

2. ..............................................................
..............................................................
..............................................................

17. අදාළ වෙනත් තොරතුරු :————.

18. විභාග ගාස්තුව ගෙවූ තැපැල් කාර්යාලය :————.
කුවිතාන්සියේ අංකයඃ :————.
දිනය :————.

| විභාග ගාස්තුව ගෙවන ලද කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න |
|---|

19. අයදුම්කරුගේ සහතිකය ඃ

මෙහි සඳහන් කර ඇති තොරතුරු මගේ දැනීමේ හා විශ්වාසය පරිදි, සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ....................... හා ............................... වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාග නීතිරීතිවලටඅනුව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව හෝ මගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන යම් තීරණයකට මම එකඟ වෙමි. තවද මා මෙම තනතුරට පත්කර ගැනීමෙන් පසුව වුවද මෙහි ඇතුළත් යම්කිසි විස්තරයක් වැරදි බව හෝ අසත්‍ය බව දැනගැනීමට ලැබුණහොත්, කිසිම වන්දි මුදලක් නොගෙවා මා සේවයෙන් පහකරනු ලැබීමටද යටත් වන බවත් එසේම විභාග පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

20. ඉල්ලුම්කරු රජයේ සේවයේ නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ වාර්තාව :-

ඉහත දී ඇති විස්තර නිවැරදි බවත් /පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතු බවත්, නියමිත විභාග ගාස්තුව ගෙවා, එම ලදුපත අලවා ඇති බවත්,ඔහුගේ/ඇය ගේ වැඩ සහ හැසිරීම............................. බවත් මම සහතික කරමි. දැනට දරන තනතුරෙන් ඔහු/ඇය මුදා හැරිය හැකිය/නොහැකිය.

(අදාළ නොවන වචන කපා හරින්න)

________________.
දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

තනතුර :————.
( නිල මුද්‍රාව මගින් සනාථ කළ යුතුය)
දිනය :————.

11-419

---

## සංශෝධනයයි

### ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත/විවෘත තරග විභාගය - 2017

2017.09.29 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද උක්ත සීමිත/විවෘත තරග විභාග නිවේදනයේ දෙමළ භාෂාවෙන් පළවූ නිවේදනයේ 5.1.(අ) (i) ඡේදය පහත පරිදි සංශෝධනය කෙරේ.

(i) දෙමළ භාෂාවෙන් පළවූ නිවේදනයේ 5.1.(අ) (i) ඡේදය පහත පරිදි සංශෝධනය විය යුතු ය.
5.1(*அ*)

(i) *பல்கலைக்கழக மானியங்கள் ஆணைக்குழுவினால் அங்கீகரிக்கப்பட்ட பல்கலைக்கழகம் ஒன்றிலிருந்து வழங்கப்பட்ட முதலாம் அல்லது இரண்டாம் வகுப்புடனான பட்டமொன்றைப் பெற்றிருத்தல்.*

*සටහන :*
(i) මෙම සංශෝධනය හේතුවෙන් ශ්‍රී ලංකා ක්‍රමසම්පාදන සේවයේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත/විවෘත තරග විභාගය - 2017 සඳහා අයදුම්පත් යොමු කළ හැකි අවසාන දිනය 2017 නොවැම්බර් 30 දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

(ii) ඉහත සංශෝධනය හේතුවෙන් විභාගය 2018 පෙබරවාරි මස කොළඹ දී හා යාපනයේ දී පවත්වනු ලැබේ.

ජේ. ජේ. රත්නසිරි,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

2017 ඔක්තෝබර් මස 19 වැනි දින.

11-283

---

## සංශෝධනයයි

### ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

### ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැළසුම් ශිල්පී (පුහුණු කිරීමේ ශ්‍රේණිය)

මෙම දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ සැළසුම් ශිල්පී (පුහුණු කිරීමේ ශ්‍රේණිය) සඳහා බඳවා ගැනීමට 2017.02.09 දින පල කරන ලද අංක 2006 දරන *ගැසට් පත්‍රයේ* 02-377 නිවේදනයේ, 7.1 ඡේදය පහත පරිදි නිවැරදි විය යුතු ය.

7.1 *ලිඛිත තරග විභාගයේ කොන්දේසි :*

මේ සඳහා වන ලිඛිත තරග විභාගය ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙනුවෙන් නිවාස සැළසුම් හා ගොඩනැගිලි මධ්‍යස්ථානයේ අධ්‍යක්ෂ මඟින් පවත්වනු ලබන අතර, ඔහු විසින් දැනුම් දෙනු ලබන දිනක දී විභාගය පැවැත්වෙනු ඇත. ඔහු විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් විය යුතුවේ.

එම්. ආර්. ජෙයචන්ද්‍රන්,
ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්.

2017 ඔක්තෝබර් මස 24 වැනි දින.

11-454

---

**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**

ISO 9001-2008 තත්ත්ව සහතිකයෙන් පිදුම්ලත් ආයතනයකි
නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය

**ග්‍රැෆික්ස්, මල්ටිමීඩියා සහ මුද්‍රණ පාඨමාලා**

*ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා හදාරා මුද්‍රණ, ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා ක්ෂේත්‍රයේ නිපුනයෙකු වන්න.*

***පාසැල් හැරගිය සිසුන් සඳහා ඕෆ්සෙට් ලිතෝ මුද්‍රණකරණය පිළිබඳ පූර්ණ කාලීන NVQ පාඨමාලාව***
***NVQ Training Programme in Offset Lithopress Operation for School Leavers (Full time)***

අද දිවයිනේ ඉහළ රැකියා ඉල්ලුමක්ව පවතින ඕෆ්සෙට් මුද්‍රණ යන්ත්‍ර ක්‍රියාකරුවන් පුහුණු කිරීමේ පූර්ණ කාලීන පාඨමාලාවක් වන මෙම පුහුණු වැඩසටහන තුළින් ඕෆ්සෙට් ලිතෝකරණය (Offset Lithography) Sheet Fed සහ Stream Feeder ලිතෝ මුද්‍රණ යන්ත්‍ර ක්‍රියා කරවීම ඇතුලු ඕෆ්සෙට් මුද්‍රණකරණයට අදළ ප්‍රායෝගික හා න්‍යායාත්මක දැනුම හා පුහුණුව ලබාදේ. පුහුණුව අවසාන කිරීමෙන් පසු ඔවුන් රැකියා සඳහා අනුයුක්ත කෙරේ.

පාඨමාලා කාලය : මාස 14 යි (පූර්ණ කාලීන) මාධ්‍යය : සිංහල පාඨමාලා ගාස්තුව : රු. 22,000

**අරේඛීය සංස්කරණය - Non Linear Editing**

මෙම පාඨමාලාව තුළින් රූපවාහිනී වැඩසටහන් සංස්කරණය සහ පිටපත් රචනය පිළිබඳ පූර්ණ ප්‍රායෝගික සහ න්‍යායාත්මක අවබෝධය ලබාදේ. පාසැල් හැරගිය සිසුන්ට ද, වීඩියෝ, රූපවාහිනී, චලන රූප කර්මාන්තයේ සහ ඉලෙක්ට්‍රොනික් සන්නිවේදන හා චිත්‍රපට කර්මාන්තයේ නිරතවූවන් හට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනවත් වේ.

කාලය : වසර 1 යි (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු.22,500

**මුද්‍රණය සඳහා ග්‍රැෆික්ස් නිර්මාණ සැකසුම - Deisign for Print**

මුද්‍රණ රටා නිර්මාණකරණයේ දී ප්‍රායෝගිකව මුහුණ දෙන ගැටළු මෙන්ම රටා නිර්මාණකරණය සංකල්ප පිළිබඳව පුළුල් අවබෝධයක් හා දැනුමක් මේ තුළින් ලබාදේ. පරිගණක ග්‍රැෆික්ස් නිර්මාණ ජාත්‍යන්තර මට්ටමට නිර්මාණය කර ඒවා මුද්‍රණයට සුදුසු ලෙස සකසන අයුරු මෙම පාඨමාලාව තුළින් මැනවින් පැහැදිලි කෙරේ.

කාලය : වසර 1 යි (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුවඃ රු.15,000

**පත් ලිතෝකරණය - Sheet Fed Lithography**

මෙම පාඨමාලාව තුළින් අද ප්‍රචලිතව පවතින ඔෆ්සෙට් මුද්‍රණ තාක්ෂණය පිළිබඳ පූර්ණ අවබෝධයක් සහ දැනුමක් ලබාදේ. ඕෆ්සෙට් මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුළ් වීමට අදහස් කරන නවකයින්ට ද මෙම පාඨමාලාව ඉමහත් ප්‍රයෝජනයක් වනු ඇත.

කාලය : වසරයි (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල සහ ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව : රු. 17,500

**මුද්‍රණ ක්ෂේත්‍රයට අදාළ පිරිවැයකරණය සහ ඇස්තමේන්තුකරණය**

**Costing and Estiamating for Printers**

මෙම පාඨමාලාව තුළින් මුද්‍රණ ක්ෂේත්‍රයට අදළ පිරිවැයකරණය හා ඇස්තමේන්තුකරණය (Job Costing and Estimating) පිළිබඳ පුළුල් අවබෝධයක් සහ දැනුමක් ලබාදේ. ග්‍රැෆික්ස් සහ මුද්‍රණ ක්ෂේත්‍රයේ නියැලි පුද්ගලයන්ට මෙන්ම එම ක්ෂේත්‍රයට ඇතුළු වීමට අදහස් කරන නවකයින්ට ද මෙම පාඨමාලාව ඉතා යෝග්‍ය වේ.

පාඨමාලා කාලය : වසර 01 යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල /ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව රු. 17,500

**ආංකික පෙර මුද්‍රණය - Digital Prepress**

මුද්‍රණ, ග්‍රැෆික්ස් ප්‍රචාරණ සහ ප්‍රකාශන ක්ෂේත්‍රයන්හි නියැලි සේවක මහතුන්ට මෙම පාඨමාලාව අතිශයින් වැදගත් වේ. මේ තුළින් නවීන පෙර මුද්‍රණය පිළිබඳ පුළුල් අවබෝධයක් හා දැනුමක් ලබා ගත හැක.

පාඨමාලා කාලය : වසර 01යි (අර්ධ කාලීන) මාධ්‍යය : සිංහල/ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුව රු. 21,500

**පොත් බැඳීම හා නිමාකරණය - Book Binding and Finishing**

මෙම පාඨමාලාවට ඉතා ඉහළ ඉල්ලුමක් ඇත. මේ තුළින් පොත් බැඳීම, නිමාව පිළිබඳ පුළුල් අවබෝධයක් සහ න්‍යායාත්මක පුහුණුවක් ලබාදේ. මෙම පාඨමාලාව පාසල් හැරගිය සිසුන්ට මෙන්ම ක්ෂේත්‍රයේ නියැලී පුද්ගලයන්ට ද මහත් ප්‍රයෝජනයක් වේ.

කාලය : (මාස 07) (අර්ධ කාලීන) මාධ්‍ය : සිංහල පාඨමාලා ගාස්තුවඃ රු. 17,500

***මුද්‍රණ තාක්ෂණය හා කළමණාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව**
***Advanced Diploma in Printing Technology and Management**

කාලය : වසර 02 යි මාධ්‍ය : ඉංග්‍රීසි පාඨමාලා ගාස්තුවඃ රු. 120,000

***දෘෂ්‍ය සන්නිවේදන මාධ්‍ය හා කළමණාකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව**
***Advanced Diploma in Visual Communication and Management**

කාලය : අවුරුදු 2 මාධ්‍යය : ඉංග්‍රීසි පාඨමාලා ගාස්තු රු. 120,000

ඉහත උසස් ඩිප්ලෝමාවන් දෙක කොළඹ විශ්වවිද්‍යාලය හා එක්ව ආරම්භ කරන අතර එය කොළඹ විශ්වවිද්‍යාලයේ MBA උපාධියට ඇතුළත්වීමට අවශ්‍ය මූලික සුදුසුකම් සපුරාලයි.

නොමිලේ සහභාගි විය හැකි සම්මන්ත්‍රණ මාලාවක්

ග්‍රැෆික්ස් සහ මල්ටිමීඩියා තාක්ෂණය සහ ඊට අදළ මෘදුකාංග (Software) භාවිතය පිළිබඳ නොමිලේ සහභාගි විය හැකි සම්මන්ත්‍රණයක් නොවැම්බර් මස 09 වන බ්‍රහස්පතින්ද උදේ 9.00 සිට සවස 1.30 දක්වා පැවැත්වෙන අතර පොත් බැඳීම් සහ නිමාව පිළිබඳ නොමිලේ සම්මන්ත්‍රණයක් නොවැම්බර් මස 10 වන සිකුරාද උදේ 9.00 සිට සවස 1.30 දක්වා ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ශ්‍රවණාගාරයේ දී පැවැත්වේ. ඉඩකඩ සීමිත නිසා 011-2686162 හෝ 011-2679791 දුරකථන අංක අමතා ආසනයක් හැකි ඉක්මනින් වෙන්කරවා ගන්න.

| | |
|---|---|
| ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ පාඨමාලා සියල්ල උසස් ප්‍රමිතියට අනුව ක්ෂේත්‍රයේ රැකියාවලට ගැලපෙන අයුරින් සකස් කොට ඇති අතර පාඨමාලා සාර්ථකව නිමකරණ සිසුන් හට රජය හා ජාත්‍යන්තරව පිළිගත් වටිනා සහතික පත්‍රයක් ප්‍රදනය කෙරේ. | |
| පාඨමාලා අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,<br>රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,<br>අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08.<br>දුරකථන : 011-2686162, 011-2679791<br>ෆැක්ස් : 011-2686162<br>ඊමේල් : sliopdir@sltnet.lk වෙබ් අඩවිය : www.sliop.edu.lk | ශාඛා :<br>ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය,<br>දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,<br>මාතලේ.<br>දුරකථන : 066 - 2222172, 071 - 0554298 |

11-113

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

*සියළුම ගැසට් පත්‍ර නියමිත දිනට www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | වාර්ෂික දායක මුදල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| | රු. ශ. | රු. ශ. |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 00 | 9,340 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 00 | 950 00 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය) ... ... | 405 00 | 750 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 00 | 2,500 00 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 00 | 450 00 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 00 | 275 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 00 | 4,360 00 |
| V වැනි කොටස (මගීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 00 | 3,640 00 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 00 | 1,250 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිල | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | රු. ශ. | රු. ශ. |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2017** | | | |
| **නොවැම්බර්** | 2017.11.02 | බ්‍රහස්පතින්දා | 2017.10.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.11.10 | සිකුරාදා | 2017.10.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.11.17 | සිකුරාදා | 2017.11.02 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2017.11.24 | සිකුරාදා | 2017.11.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.11.30 | බ්‍රහස්පතින්දා | 2017.11.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **දෙසැම්බර්** | 2017.12.08 | සිකුරාදා | 2017.11.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.12.15 | සිකුරාදා | 2017.11.30 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2017.12.22 | සිකුරාදා | 2017.12.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2017.12.29 | සිකුරාදා | 2017.12.15 | සිකුරාදා | දහවල් | 12.00 |
| | | | **2018** | | | |
| **ජනවාරි** | 2018.01.05 | සිකුරාදා | 2017.12.22 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.01.12 | සිකුරාදා | 2017.12.29 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.01.19 | සිකුරාදා | 2018.01.05 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2018.01.26 | සිකුරාදා | 2018.01.12 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති. (*වැ. බ.*).

2017 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.